**බුරුම සංගායනාවෙන් ශුද්ධියට**
**පත් කළ**

සිංහල අනුවාද සහිත

# උභය ප්‍රාතිමෝක්ෂය

(පස්වන මුද්‍රණය)

**ප්‍රස්තාවනාව:**

මහාචාර්ය

**රේරුකානේ චන්දවිමල**

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,
අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)
මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසිනි

**සම්පාදකවරු:**

ගොඩිගමුවේ සෝරත ස්ථවිර
පණ්ඩිත කනදුල්ලේ රතනරංසි ස්ථවිර

*Non-commercial distribution*

# ලේකම්ගේ සටහන්...

ත්‍රිපිටකයට අයත් ධර්ම-විනය හා භික්ෂු පරපුර බුද්ධ ශාසනය යි. චිරාත් කාලයක් මේවා පැවැත්වීමේදී බිහිවූ සංස්කෘතිය ද ශාසනය මැ යි.

විනය ශාසනයේ ආයුෂයි. සංස්ථාවක් වශයෙන් සඟ පරපුර එක්කර ඇත්තේ විනය ශික්ෂාපද තුළිනි. කවර ජාතික භික්ෂූන් වහන්සේ නමකගේ වුවද සාම්‍යක් අප දකින්නේ මේ හැදියාව නිසා ය.

සංඝ සමාජයේ වටිනාකම ද මේ ඒකසන වීමයි. බුදුන් පිදීමටත් වඩා සාංඝික පූජාවක් උසස් යයි වදාරා ඇත්තේ ද සමාජයක් වැළඳගන්නා සේවයක් මගින් සත්පුරුෂ සමාජයක් ඇති කිරීමට සංඝ සමාජය ඉවහල් වන නිසා ය.

භික්ෂු සමාජයේ මේ එකමුතුව බිඳී යන්නේ නම් ඉන් මිථ්‍යාදෘෂ්ටිය සමාජගත වීමද වැළැක්විය නොහැකිය. සද්ධර්ම ප්‍රතිරූපකයන් නිසාත්, තෙරුවන, ශික්ෂාපද හා බණ -භාවනා ගැන ගරුසරු නැති සංඝයා වහන්සේ නිසාත්, දේශපාලනය, ජ්‍යෝතිෂය හෝ වෙනත් ගුප්ත විද්‍යාදිය ඇසුරු කරන භික්ෂූන් වහන්සේ නිසාත් ශාසන අන්තර්ධානය වන ආකාර බුදුන් වහන්සේ දේශනා කළ තැන් රාශියක් “සඟි බණ - සමන්නේසනා” මගින් පූජ්‍යපාද යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමියෝ පෙන්වා දෙති.

පූජ්‍යපාද රේරුකානේ චන්දවිමල නාහිමියෝ ද කාමච්ඡන්ද නීවරණය ගැන පැහැදිලි කිරීමේදී භික්ෂූන් වහන්සේ තමන් නොදැනම විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ සසුනට කරන හානිය දක්වා සිටිති.

ගමින් ගම සේවය කළ භික්ෂූන් වහන්සේගේ සේවය මුළුගැන්වී මාධ්‍ය ඔස්සේ ධර්ම දේශකයන් කීපදෙනකු ඉස්මතු වීමත්, ඒ අතර සමහරුන් බණ වැනි බණ කියන්නන් වීමත්, දුර්වල මානසික හේතු නිසා ධර්මය අවලංගු කරමින් භික්ෂු වංශයේ පූර්වාචාරීන් විවේචනය

Non-commercial distribution

කිරීමත්, ශ්‍රද්ධාවත් ගිහි සමාජය එකතු කළ 'පිරිත් හුය' එක් එක් භික්ෂුවකගේ අනන්‍යතාව බවට පත් කිරීමත් වැනි කරුණු ගැන කල්පනා කරන විට සසුන පිරිහෙන්නේ බාහිර කරුණුවලට වඩා අභ්‍යන්තර ක්‍රියාකාරකම් නිසා බව පැහැදිලි වෙයි.

ඇසුරු කරන භික්ෂූන් වහන්සේගේ හැදියාව මත ගිහියන් ශ්‍රද්ධාවත් වන අයුරු බුදුන් වහන්සේ නිතර පෙන්වා ඇති නිසා තම වගකීම අවබෝධ කරගත් භික්ෂු පරපුරක් ඇති වන්නේ නම් අප සමාජය සකස් කරගැනීම තවමත් ප්‍රමාද නැත. මූලිකව කළ යුතු වැඩ කොටස අතපසු කර ගැටළුවලට පිළිතුරු සෙවීම පහසු නැත.

ප්‍රාතිමෝක්ෂය ඉගෙනීමෙන් හා දැරීමෙන් සංසරත්නයෙන් විය යුතු සහ කළ හැකි සේවය අවබෝධ කරගත් භික්ෂූන් වහන්සේ දැකීමට බෞද්ධයෝ වාසනාවත් වෙත්වා.

පෙර පූජ්‍ය කුකුල්පනේ සුදස්සි, මීමන සුසීම හිමිපාණන් වහන්සේලා සැකසූ සෝදුපත් සටහන් මෙවර මුද්‍රණයටත් උපකාරී විය. සංශෝධිත පරිසනක අක්ෂර ගැලපීම හොරණ රූ-මායා ගැෆික්ස්හි සාලිය ජයකොඩි මහතා අතින් ද, මුද්‍රණය සිකුරු ප්‍රකාශක ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ප්‍රමුඛ කාර්‍ය මණ්ඩලයෙන්ද මනා ලෙස ඉටු කිරීම කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. උපකාරීවූ සැමට ශාසනාලයෙන් යුතුව පින් දෙමි

**තිසරණ සරණයි!**

**සී. තනිප්පුලි ආරච්චි**
ගරු ලේකම්
ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2007 මාර්තු මස 15 වන දින,
පොකුණුවිටදී ය.

*Non-commercial distribution*

# හැඳින්වීම

**විනය** "විනයො නාම සාසනස්ස ආයු" විනය නම් ශාසනයාගේ ආයුෂයයි.

මෙයින් භික්ෂූන්ගේ ශික්ෂා ගරුත්වයත්, සම්බුද්ධශාසනයේ ජීවනයත්, පිළිබඳ අවධාරණයෙන් කළ පරිච්ඡේද නියමයක් හෙළි කරයි. සම්බුද්ධ ශාසනය පන්දහසක් අවුරුදු පවත්නා පරිදි දේශනා කොට වදාළ චිරස්ථායි ක්‍රියා මාර්ගය විනය නමින් හැඳින්වූවා මෙන් ම, එය අනුගමනය කිරීම, භික්ෂුවංශයේ දියුණුවට මෙන් ම ශාසනයේ පැවැත්මටත් හේතු වන බව වදාළ අවස්ථා රාශියක් විනය ග්‍රන්ථවලින් සොයා ගත හැකිය. එය කෙතරම් වැදගත් දෙයක් කොට සලකා වදාරණ ලද්දේ දැ'යි කියතොත් පසළොස් දිනකට වරක් ශික්ෂාවන් සිහිපත් කරගත යුතු බවත්, එසේ නො කිරීම ආපත්තියක (වරද)ට හේතුව වන බවත් වදාළහ. තමාට තමා ම වංචා සහගත නො වීමේ පදනම මත ගොඩනගන ලද භික්ෂු ජීවිතය පිළිබඳ මනා පාලනයක් විනය ශික්ෂාවන්ගෙන් සිදුකෙරේ. එහෙයින් වරදත්, ඊට සුදුසු දඬුවමත් නො සඟවා, විනය ශික්ෂාවන් ගුරුතන්හි ලා සලකන භික්ෂූන් නිසා ශාසනය චිරස්ථායි වීම ගැන කවර කථාද?

**උභය ප්‍රාතිමෝක්ෂය** සියලු ම විනය ශික්ෂාවෝ පස්මහ පොතකින් පරිමිතයහ. i. පාරාජික ii. පාචිත්තිය iii. චූලවග්ග iv. මහාවග්ග v. පරිවාර වශයෙනි. එයින් පාරාජික, පාචිත්තිය යන ග්‍රන්ථ ද්වයෙහි වදාළතාක් ආඥා දේශනාවන් ඉතා සංක්ෂිප්ත කොට සකස්කළ ශික්ෂා සංග්‍රහයකි, උභය ප්‍රාතිමෝක්ෂය. භික්ෂූන් හා භික්ෂුණීන් පිළිබඳ ප්‍රාතිමෝක්ෂය හෙයින් මෙනම් විය. සර්වඥ ශාසනයට ඇතුළත් ව, විසිවිය සම්පූර්ණ වීමෙන් අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලය ලැබූ භික්ෂුව විසින් රැක්ක යුතු ප්‍රාතිමෝක්ෂය උද්දේසවාර පරිච්ඡේද පසකින් පරිමිත වූ අතර භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය සතරකින් යුක්තය.

Non-commercial distribution

භික්ෂු භික්ෂුණී ශාසනද්වය ම නිර්මලව පැවති යුගයේ උභය ප්‍රාතිමෝක්ෂය වැනි ශික්ෂා සංග්‍රහයකින් ලද පහසුවත් අවශ්‍යතාව හා ප්‍රයෝජනයත් පිළිබඳ යමක් සිතාගත හැක්කේ අනිත් විනය ග්‍රන්ථ අතර උභය ප්‍රාතිමෝක්ෂයට හිමි වන ස්ථානය ගැන සලකා බැලීමෙනි. යාම්-ඊම්, ඉඳුම්-හිටුම්, කෑම්-බීම් වැනි ඉතා කුඩා කරුණෙහි පටන් භික්ෂුත්වය විනාශ වී යාම දක්වා වූ ලොකු කරුණුත්, මාතෘකා සංග්‍රහයක් වශයෙන් සකස් වූ ප්‍රාතිමෝක්ෂය, විනය සාගරයට බැස ගන්නවුනට විවෘත කළ තොටක් වැනිය.

අද භික්ෂුණී ශාසනයක් නැත. මතු ඇති විය හැකි ද නොවේ. එහෙයින් භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය ද තව ඉදිරියටත් ගෙන යාමෙහි අවශ්‍ය බවක් නො පෙනේ. අද පමණක් නොව අනුරාධපුර රාජධානියෙන් මෙපිට ලක්දිව භික්ෂුණී ශාසනයක් (මෙහෙණි සස්නක්) ගැන තොරතුරු අනාවරණය නොවේ. එහෙත් ඉතා මෑතක් වනතුරු ම ප්‍රාතිමෝක්ෂය පිළිබඳ ටීකා විස්තර කථාදිය සැපයූ ආචාර්යවරු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය අමතක නො කළහ. භික්ෂුවට පමණක් සාධාරණ ශික්ෂාවන් සංග්‍රහ කොට ප්‍රාතිමෝක්ෂය පිළියෙළ කිරීම අදට මෙන් ම එදාට ද ප්‍රමාණ විය. ශික්ෂා ගෞරවය, ධර්ම ගෞරවය හා ග්‍රන්ථ ගෞරවය ගැන සැලකූ ඇදුරෝ පෙර පැවති පරිදි ම තිබෙන්නට හළමුත් වෙනසක් නො කළහ. අපිදු මෙහිදී එය අනුගමනය කෙළෙමු.

**අපේ සංස්කරණය**

"ශ්‍රී ලංකා ශ්වේජින් නිකායික" මහා සංඝ සභාවේ අනුමතිය පරිදි වර්ෂයකට වරක් ප්‍රාතිමෝක්ෂය කටපාඩම් දීමේ සිරිතක් පැවැත්තේය. සෑම වර්ෂයක ම ජනවාරි හෝ පෙබරවාරි මාසයේ නියමිත දිනයක දී එය සිදුවිය. සිරිත් පරිදි අදත් එය සිදුකෙරේ. එහිදී ශ්වේජින් නිකායේ මහානායක මා හිමියන් ඇතුළු මධ්‍යම නවක සෑම භික්ෂුවක් ම ප්‍රාතිමෝක්ෂය කට පාඩම් දිය යුතුය. එසේ ම සාමණේරවරු සතර බණවර පාඩම් දිය යුතුය.

ඉකුත් වර්ෂයෙහි පැවැත් වූ මේ ධර්ම පරීක්ෂණයේදී ඊට සහභාගිවනු කැමති භික්ෂුවරයකුට අප අයත් ප්‍රතිමෝක්ෂය දීමට සිදුවිය. අපට ද පොතක් අවශ්‍ය වූයෙන් අළුත් පොතක් මිලට ගතිමු.

Non-commercial distribution

අනුවාදය සහිත වූ ඒ පිටපත මුද්‍රණයෙන් බිහිව වැඩි කලක් ගත නොවූ බව පෙනින. එහෙත් එය පෙරලා බැලීමේදී අප තුළ ඇති වූ බලවත් සංවේගයේ ප්‍රතිඵලය වශයෙනි, මෙම අනුවාදය සහිත ප්‍රාතිමෝක්ෂය මුද්‍රණය කිරීමට අදහස් කෙළේ. එතරම් ඒ පිටපත වරදින් ගහනව පැවැත්තේය. විනය පරීක්ෂණවලදී නැතිව ම බැරි පොත් පිංචක් වශයෙනුත්, විනය ශික්ෂාවන් පිළිබඳ භික්ෂුවගේ අත්පොත වශයෙනුත්, වැදගත් වූ, ප්‍රාතිමෝක්ෂය සැලකිලිමත්ව මුද්‍රණය කළයුතුව තිබිය දී සෝදුපත් බැලීම ගැන සැලකිල්ලක් නො දක්වා ඇති බව පෙනී ගියේ ය.

වරදවා මුද්‍රණය කරවන ලද, ශික්ෂාවන් පිළිබඳ පාලි පාඨයක් කටපාඩම් කිරීමට සැලැස්වීම විනය අපරාධයකි. විනය අවිනය කිරීමකි. ප්‍රාතිමෝක්ෂය හදාරණ ශිෂ්‍යයා එහි වරද තැන් නිවරද කරගනිමින් ඉගෙණීමට තරම් හැකි වියෙක නො සිටී. මෙවැනි දූෂිතව මුද්‍රණය කළ පෙළ පොත්, විශේෂයෙන් වාචෝද්ගත කළ යුතු පොත්, මුද්‍රණ දෝෂ පවා පහ නො කොට ඔවුන් වෙත තැබීම අශාසනිකය. කරුණු මෙසේ හෙයින් හැකිතාක් දුරට වැරදිවලින් තොරව පාවිච්චියට ද පහසුවන පරිදි මෙවැනි පොතක් සකස් කිරීමේ අදහස පහළ වීමේ හේතුව යට සඳහන් කළ කාරණය බව කියනු කැමැත්තෙමු.

මේ දිනවල බුරුම රට පැවැත්වෙන ඡට්ඨ මහා සංගායනාවෙන් ශුද්ධියට පත්කළ විනය ග්‍රන්ථ මේ කටයුත්තෙහි ලා ගුරුකොට ගතිමු. කාටත් පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි අදහස පමණක් ඇතුළත් වන සේ අනුවාදය ද සකස් කෙළෙමු. මෙහි ලා විස්තර කළ යුතු බොහෝ තැන් ඇතත් දීර්ඝ විස්තර ලියැවුණු පොතපත සුලභව ඇති හෙයින්, විශේෂ තැන් කීපයක් උපුටා උපග්‍රන්ථය වශයෙන් පිළියෙළ කරන ලද්දේ විනය ඉගෙන ගන්නා පැවිදි ශිෂ්‍යයන්ගේ පාවිච්චියට ද ඇති පහසුව සලකා ගෙනය.

කරුණු මෙසේ හෙයින් කුඩා වුවද මේ වටිනා ග්‍රන්ථය අප අදහස් කළ පරිදි පොතක් නැතිකමේ පාඩුව පිරිමසාලීමෙහි මෙන් ම පැවිද්දන්ගේ විනය ඉගෙණීමෙහිත් අල්පමාත්‍ර වූ හෝ ප්‍රයෝජනයක් වන්නේ නම් එය අපගේ උත්සාහයේ වටිනා ප්‍රතිඵලය කොට සලකමු.

Non-commercial distribution

උපකාරා' නුස්මෘති.

මේ කටයුත්තෙහි දී අපට ලැබුණු උපකාර අතර, උගත් ධර්මධරයාණ කෙනකු වශයෙන් හා ධර්මග්‍රන්ථ කර්තෘවරයාණ කෙනකු වශයෙනුත් අද ලෝකයා පිළිගත් අපගේ ගුරුදේව අතිගරු ආචාර්ය්‍ය පේරුකානේ චන්දවිමල මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගෙන් ලැබුණු උපදේශ හා ප්‍රස්තාවනාවක් සපයා දීමෙන් කළ මහඟු උපකාරය ද ගරුකොට සලකන අතර තෙසරණ සරණින් හා සව්මුරු බෙලෙන් නිදුකින් දිනේවා'යි ආශිංසනය කරමු.

මේ බුද්ධ ජයන්ති වර්ෂයේ කුදු මහත් කටයුතු රැසක ව්‍යාවෘතව සිටි හෙයිනුත්, ඒ අතර ගිලනකු වශයෙන් පසුවන්නට සිදුවූ හෙයිනුත්, මේ කටයුත්තට සහයෝගය දෙමින් අප සමග ක්‍රියාකළ දැනට හම්බන්තොට ශ්‍රී ගුණානන්ද පරිවේණාධිපති පණ්ඩිත කනදූල්ලේ රතනරංසි ස්ථවිරයන් වහන්සේ ද මෙහිදී කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

බුදුසසුන බැබලේවා !

මෙයට - ලෝවැඩ කැමති

**ගොඩිගමුවේ සෝරත ස්ථවිර.**

ශ්‍රී ලංකා ශ්වෛජිං නිකායික මහා සංඝ සභාවේ සමලේඛක.

ශ්‍රී බු. ව. 2499 / ක්‍රි. ව. 1956 මාර්තු 01 වන දින

පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේ දීය.

Non-commercial distribution

# ප්‍රස්තාවනා

## ආචාර්‍ය්‍ය රේරුකානේ චන්දවිමල
## මහා ස්ථවිරයන් වහන්සේ විසිනි.

මහා කාරුණික වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් තමන් වහන්සේ ගේ ශ්‍රාවක වූ භික්ෂු භික්ෂුණීන් හට පරූපවාද විරහිත ව, ජනප්‍රසාදය ඇතිව, සුවසේ ජීවත් විය හැකි වනු පිණිස හා අපායදුඃඛයෙන් මිදිය හැකි වනු පිණිස ද, ධ්‍යානාභිඥා මාර්ගඵල සංඛ්‍යාත උත්තරීමනුෂ්‍ය ධර්මයන් ඇති කරගත හැකි වනු සඳහා ද, පරූපවාදාදියට හේතුවන දෙයින් මුදවා භික්ෂු භික්ෂුණීන් ආරක්ෂා කරනු පිණිස පනවා වදාළ බොහෝ නීති ඇත්තේ ය. ඒවාට සසුන සිකපදයයි ද කියනු ලැබේ. බුදුන් වහන්සේ ගේ පිරිනිවීමෙන් පසු චිර කාලයක් සසුන පවතින්නට සැලැස්වීමත් සිකපද පැනවීමේ එක් කරුණෙකි. ඇතැම් බුදුවරයෝ ශ්‍රාවකයනට සිකපද පනවති. ඇතැම් බුදුවරයෝ සිකපද නො පනවති. සිකපද නො පනවන්නා වූ බුදුවරුන් ගේ සසුන් ඒ බුදුවරයන් ගේ හා බුද්ධානුබුධ ශ්‍රාවකයන්ගේ ද පිරිනිවීමෙන් පසු නොබෝ කලකින් අතුරුදහන් වේ.

සිකපද පනවන්නා වූ බුදුවරයන් ගේ සසුන් බොහෝ කල් පවතී. ශ්‍රාවකයනට සික පද නො පැන වූ විපස්සී, සිඛී, වෙස්සභූ යන අතීත බුදුවරයන් වහන්සේලාගේ ශාසනයන් වැඩිකල් නො පැවති බවත්, ශ්‍රාවකයනට සිකපද පැන වූ කකුසඳ, කෝණාගම, කස්සප යන බුදුවරයන් වහන්සේලාගේ සසුන් ඒ නිසා බොහෝ කල් පැවති බවත් අප බුදු රජාණන් වහන්සේ විසින් සැරියුත් මහ තෙරුන් වහන්සේට වදාරන ලද්දේ ය.

පැවිදි කිරීම සහ උපසම්පදා කිරීම සම්බන්ධයෙන් ඇත්තා වූ විනය නීති ටිකම බුදුසසුනට මහත් ආරක්ෂාවෙකි. ඒ ටික නොමැති නම් කැමති කැමති අය සිවුරු හැඳ පොරවා ගෙන භික්ෂූන් සැටියට

Non-commercial distribution

පෙනී සිටිමින් බුදුසසුන විනාශ කරන්නාහු ය. පසුගිය කාලයේ 'තාපස භික්ෂූහුය'යි කියමින් රට පුරා හැසුරුණු පිරිසට බුදුසසුනට ඇතුළු වන්නට ඉඩ නො ලැබුණේ ද ඒ නීති රැස නිසා ම ය. ඔවුනට මේ බුදුසසුනට ඇතුළු වන්නට ලැබුණා නම් මහා ශාසන හානියක් වනු නො අනුමාන ය.

ලෝකයෙහි භික්ෂු පිරිස තරම් නීති ඇති නීති ගරුක තවත් පිරිසක් නැතය යි කිය යුතුය. භික්ෂූන් වහන්සේට විනය නීති නැත්තේ ආශ්වාස ප්‍රශ්වාස දෙක ගැන, ඇසිපිය හෙළීම ගැන පමණය යි කිය යුතුය. හිඳගැනීම නිදා ගැනීම ගමන් කිරීම සිවුරු පිණිස වස්ත්‍ර සැපයීම සිවුරු කැපීම මැසීම පඬු පෙවීම හැඳීම පෙරවීම අතිරේක සිවුරු ලබා ගැනීම දීම ගැනීම පරණ සිවුරු සේදීම පාත්‍රය පිළියෙල කිරීම පාත්‍ර තබා ගැනීම පාත්‍රය පරිභෝග කිරීම පිඬුසිඟා යෑම අහර පිළිගැනීම වැළඳීම අනුන්ට දීම සෙනසුන් පිළියෙල කිරීම සෙනසුන් පරිභෝග කිරීම බෙහෙත් සැපයීම පිළිගැනීම පිළිගත් බෙහෙත් තබා ගැනීම බෙහෙත් වැළඳීම පාවහන් කුඩ භාජනාදි වස්තූන් පරිභෝග කිරීම දත් මැදීම මුවදෙවීම අත්පා සේදීම වතුර නෑම කෙල ගැසීම, මලමුත්‍ර කිරීම හිසකේ කැපීම රැවුල කැපීම කථා කිරීම ස්ත්‍රීන් ඇසුරු කිරීම දහම් දෙසීම ගමෙහි හැසිරීම රජුන් ඇසුරු කිරීම ගුරුන් ඇසුරු කිරීම ගෝලයන් තැනීම ආගන්තුකයන් කෙරෙහි පිළිපැදීම තමන් ආගන්තුකයකු වශයෙන් අන්තැනකට ගිය කල්හි හැසිරීම පැවිදිකිරීම උපසම්පදා කිරීම සඟසතු දේ පරිහරණය කිරීම යනාදි නොයෙක් කරුණු ගැන භික්ෂූන්ට සිකපද ඇත්තේය. භික්ෂු පිරිස සම්පූර්ණයෙන් ම ගිහියන්ගෙන් වෙනස් පිරිසක් වන්නේ ඒ සිකපද සමූහය නිසා ය.

බුදුරජාණන් වහන්සේ විසින් පනවා ඇති බොහෝ සිකපදයන් අතුරෙන් භික්ෂූන් විසින් පොහෝ දිනයන්හි මසකට දෙවරක් සීමාවකට රැස්ව පොහෝ කිරීම් වශයෙන් එක් භික්ෂුවක් විසින් සඟමැද හිඳ උදෙසීමටත් (කීමටත්) අන්‍ය භික්ෂූන් විසින් අසාගෙන සිටීමටත් නියමිත ප්‍රධාන සිකපද සමූහය "භික්ඛු පාතිමොක්ඛ" නම් වේ. භික්ෂුණීන්හට පොහෝ කිරීම් වශයෙන් භාවිතයට නියමිත ප්‍රධාන සිකපද සමූහය 'භික්ඛුණී පාතිමොක්ඛ' නම් වේ.

Non-commercial distribution

එයින් භික්ඛු පාතිමොක්ඛය නිදානුද්දේස, පාරාජිකුද්දේස, සංඝාදිසේසුද්දේස, අනියතුද්දේස, විත්ථාරුද්දේස යන උද්දේස පසකින් හා සික පද (220) දෙසිය විස්සකින් ද යුක්තය. **භික්ඛුණී පාතිමොක්ඛය** අනියතුද්දේසය හැර ඉතිරි උද්දේස සතරින් යුක්තය.

පාතිමොක්ඛ නම් වූ මේ ග්‍රන්ථය සියලු ම භික්ෂූන් විසින් විනිශ්චය සහිතව ඉතා හොඳින් උගත යුත්තකි. භික්ෂූන්ට සැම කල්හි ම පාඩම් තිබිය යුත්තකි. එබැවින් බුරුමයේ බොහෝ සංඝාරාමවල වස්කාලය තුළදී වර්ෂයක් පාසා ම නවක මධ්‍යම ස්ථවිර සකල භික්ෂූන්ගෙන් ම ප්‍රාතිමෝක්ෂය පාඩම් ගනිති. දිනපතා සවස තුනුරුවන් වැඳීමෙන් පසු සැමදෙනා ම එක්ව ප්‍රාතිමෝක්ෂයෙන් යම්කිසි කොටසක් සජ්ඣායනා කිරීම ද එරට බොහෝ පන්සල්වල පවත්වන චාරිත්‍රයෙකි.

විනය පිටකයට අයත් පොත් පස අතුරෙන් පාරාජිකා පාලිය පාචිත්තිය පාලිය යන පොත් දෙකෙහි ඇත්තේ ප්‍රාතිමෝක්ෂයට අයත් සිකපද වල විස්තරයකි. ඒ විස්තරයට මේ සිකපද සමූහය මාතෘකා වන බැවින් ප්‍රාතිමෝක්ෂයට **මාතිකා පාලිය** යයි ද කියනු ලැබේ.

පාතිමොක්ඛ යන වචනය මේ ග්‍රන්ථයට පමණක් නොව ඒ සිකපද රක්නා වූ භික්ෂුවගේ ශීලයට ද නමෙකි. පාතිමොක්ඛ යන වචනයේ තේරුම **"පාතිමොක්ඛන්ති -ප අති මොක්ඛං අතිපමොක්ඛං, අතිසෙට්ඨං, අති උත්තමන්ති අත්ථො"** යි කඞ්ඛාවිතරණී අටුවාවෙහි දැක්වෙන පරිදි ඉතා උතුම් දෙය ය යනුයි. මේ ශීලය බිඳුන හොත් භික්ෂුත්වය ද නැතිවන බැවින් භික්ෂුවගේ ඉතා උතුම් දෙය ප්‍රාතිමෝක්ෂ සංවර ශීල නම් වූ ඒ ශීලයය. ඒ ශීලය ඉතා උතුම් වීමෙන් එයට අයත් සිකපද සමූහය වූ මේ ග්‍රන්ථය ද ඉතා උතුම් වේ. ඉතා උතුම් දෙය වූ මේ ප්‍රාතිමෝක්ෂය පොතක් වශයෙන් මුද්‍රණයට පැමිණවිය යුත්තේ ද ඉතා උතුම් ලෙසට ය.

රන් රිදී පත්වල වුවද ලියා තැබීමට සුදුසු මේ පොත ඇතමුන් විසින් බාල කඩදාසිවල අශෝභන ලෙස මුද්‍රණය කරවීමෙන් ද, හරි-වැරදි බැලීම පවා සැලකිල්ලෙන් නො කොට ඉතා අපිරිසිදු ලෙස

Non-commercial distribution

මුද්‍රණය කරවීමෙන් ද සිදුකර තිබෙන්නේ විනය ශික්ෂාකාමීන්ගේ සිත් කම්පා කරවන අපරාධයෙකි. **ගොඩිගමුවේ සෝරත, පණ්ඩිත කණඳුල්ලේ රතනරංසි** යන ස්ථවිරවරුන් විසින් බුරුම සංගායනාවෙන් ශුද්ධියට පැමිණ වූ පොත් අනුව සංශෝධනය කොට සුගම අනුවාදයකින් ද යුක්ත කොට ශෝභන ලෙස මේ උතුම් පොතට නිසි ගෞරවය දී මුද්‍රණයට පැමිණවීමෙන් කර තිබෙන්නේ බුදුසසනට ඉමහත් සේවයකි. මෙය විනයගරුකයන්ගේ ප්‍රීතියට ද හේතු වනු ඇත.

මීට, ශාසනස්ප්‍රීතිකාමී.

**රේරුකානේ චන්දවිමල ස්ථවිර.**

*Non-commercial distribution*

# පටුන


| | පිට |
|---|---|
| සංඝ උපෝසථය කිරීමේ ක්‍රමය | 15 |
| **භික්ඛු පාතිමොක්ඛ පාළි** | 20 |
| චත්තාරො පාරාජිකා ධම්මා | 21 |
| තෙරස සංඝාදිසෙසා ධම්මා | 22 |
| ද්වෙ අනියතා ධම්මා | 26 |
| තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා | 27 |
| ද්වෙ නවුති පාචිත්තියා ධම්මා | 33 |
| චත්තාරෝ පාටිදෙසනීයා ධම්මා | 44 |
| පඤ්චසත්තති සෙඛියා ධම්මා | 45 |
| සත්ත අධිකරණ සමථා ධම්මා | 51 |
| **භික්ඛුණී පාතිමොක්ඛ පාළි** | 52 |
| අට්ඨ පාරාජිකා ධම්මා | 53 |
| සත්තරස සංඝාදිසෙසා ධම්මා | 55 |
| තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා | 61 |
| ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා | 67 |
| අට්ඨ පාටිදෙසනීයා ධම්මා | 83 |
| පඤ්ච සත්තති සෙඛියා ධම්මා | 84 |
| සත්ත අධිකරණ සමථා ධම්මා | 84 |
| **සිංහල භික්ෂු ප්‍රාතිමෝක්ෂය** | 86 |
| **සිංහල භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය** | 119 |
| **උපග්‍රන්ථය** | 137 |


*Non-commercial distribution*

## දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත
# රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාළීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චෛතසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල තිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සුරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979)

*Non-commercial distribution*

# සංඝ උපෝසථය කිරීමේ ක්‍රමය

## සංඝ උපෝසථය ගැන දතයුතු කරුණු

"න භික්ඛවෙ සංඝමජ්ඣෙ අනජ්ඣිට්ඨෙන පාතිමොක්ඛං උද්දිසිතබ්බං, යො උද්දිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස" යි වදාරා ඇති බැවින් සීමාවට සංඝයා රැස් වූ පසු පාමොක් උදෙසීම සඳහා සම්මුතිය ලත් භික්ෂුවක් විසින් සංඝස්ථවිරයන් වහන්සේට හෝ අන්‍ය විනයධර තෙරනමකට හෝ ආරාධනය කළ යුතු ය. ආරාධනය ලැබූ තෙරුන් වහන්සේ විසින් පාමොක් උදෙසීමට කලින්, ආරාධනය කළ භික්ෂුවගෙන් විනය විචාළ යුතුය. එසේ කළ යුත්තේ ද සම්මුතිය ලබා ගෙන ය. ආරාධනා කළ භික්ෂූන් වහන්සේ විසින් විනය ප්‍රශ්න විසඳිය යුත්තේ ද සම්මුතිය ලබා ගෙන ය. විනය පුච්ඡක සම්මුතිය හා විස්ජ්ජක සම්මුතිය තම තමා විසින් ම ද කර ගත හැකිය. තමන් විසින් ම කර ගැනීම දැනට පවත්නා චාරිත්‍රය ය. ආරාධනාදිය කරන සැටි මතු දක්වනු ලැබේ. එහි දී තිස්ස, දත්ත යන නම් යොදා වාක්‍ය දක්වනු ලැබේ. පෝය කිරීමේ දී ඒ තැන් වලට ඒ ඒ අයගේ නම් යොදා ගත යුතු ය.

### 1. ආරාධනය කිරීමට සම්මුතිය ලබාගැනීම.

**සුණාතු මෙ භන්තෙ! සංඝො, යදි සංඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං (තිස්සං) පාතිමොක්ඛුද්දෙසං අජ්ඣෙසෙය්‍යං.** (මෙසේ සම්මුතිය ලබාගෙන, මතු දැක්වෙන වාක්‍යය තුන් වරක් කියා ආරාධනය කළ යුතු)

### ආරාධනා කිරීම.

- **සංඝො භන්තෙ! ආයස්මන්තං (තිස්සං) පාතිමොක්ඛුද්දෙසං අජ්ඣෙසති, උද්දිසතු භන්තෙ! ආයස්මා (තිස්සො) පාතිමොක්ඛං.** (තුන්වරක්)

Non-commercial distribution

## 2. දේශක භික්ෂුවගේ පිළිවදන් දීම

ආම උද්දිසිස්සාමහං ආවුසො. (මෙසේ කියා ඇරයුම පිළිගෙන මතු එන වාක්‍යය කියා විනය පුච්ඡක සම්මුතිය ලබා ගත යුතුය.)

**විනය පුච්ඡක සම්මුතිය.**

සුණාතු මෙ භන්තෙ! සංඝො යදි සංඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං (දත්තං) විනයං පුච්ඡෙය්‍යං.

ආරාධනය කළ භික්ෂුව මතු එන වාක්‍යය කියා විස්සජ්ජක සම්මුතිය ලබාගත යුතුය.

**විස්සජ්ජක සම්මුතිය.**

සුණාතු මෙ භන්තෙ! සංඝො, යදි සංඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා (තිස්සෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං.

## 3. දේශක භික්ෂුවගේ විනය විචාරීම

"සම්මජ්ජනී පදීපො ච
උදකං ආසනෙන ච
උපොසථස්ස එතානි
පුබ්බකරණන්ති වුච්චති"

යනුවෙන් දැක්වෙන උපෝසථාගාරයට සංඝයා රැස්වීමට කලින් කළයුතු වන උපෝසථාගාරය හැමදීම ය, පහන් දැල්වීම ය, පැන් තැබීම ය, අසුන් පැනවීම ය යන සතර කිස කොට නිමවී ද?

ආරාධනය කළ භික්ෂුවගේ පිළිතුර:- දැනට සූය්‍යාලෝකය ඇති බැවින් පහන් දැල්වීමෙන් ප්‍රයෝජන නැත. සෙසු වත් තුන කොට නිමවී ය.

ප්‍රශ්නය:-

"ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං
භික්ඛුගණනාච ඔවාදො
උපොසථස්ස එතානි
පුබ්බකිච්චන්ති වුච්චති"

Non-commercial distribution

යනුවෙන් දැක්වෙන පූර්වකෘත්‍යයන් සම්පූර්ණ වනු පිණිස ගෙනෙන ලද ඡන්දපාරිශුද්ධීන් සංඝයා හට ආරෝචනය කොට නිමවී ද?

**පිළිතුර** :- ශීමස්ථක සියලු භික්ෂූන් වහන්සේ ම මෙහි රැස්වී ඇති බැවින් ගෙනෙන ලද ඡන්දපාරිශුද්ධියක් නැත්තේය.

**ප්‍රශ්නය** :- ඍතුව වනාහි හේමන්තය, ගිම්හානය, වස්සාන ය යි තුන් වැදෑරුම් වේ. එයින් දැනට පැමිණ ඇති ඍතුව කවරේ ද? (පිළිතුරු දෙනු.)

**ප්‍රශ්නය** :- එක් එක් ඍතුවක පක්ෂ අට බැගින් ඇත්තේ ය. පැමිණ ඇත්තා වූ මේ ඍතුවෙහි ඉක්ම ගිය පක්ෂ කෙතෙක් ද? ඉදිරියට ඇති පක්ෂ කෙතෙක් ද? මේ පැමිණ තිබෙන පක්ෂය කීවෙනි පක්ෂය ද? (පිළිතුරු දෙනු.)

**ප්‍රශ්නය** :- දැනට මේ සීමාවෙහි රැස්ව ඉන්නා භික්ෂූන් වහන්සේලා කොතෙක් වන්නාහු ද? (ගණන කියනු.)

**ප්‍රශ්නය** :- අවවාද ලබා ගැනීම සඳහා භික්ෂුණීන් විසින් කර ඇති ආයාචනය සංඝයා හට සැලකොට නිමවී ද?

**පිළිතුර** :- මෙකල භික්ෂුණීන් නැති බැවින් එ බඳු ආයාචනයක් නැත්තේ ය.

**ප්‍රශ්නය** :- මේ සතර, සංඝයා සීමාවට රැස්වූ පසු පාමොක් උදෙසීමට පළමුවෙන් කළ යුතු බැවින් පූර්ව කෘත්‍යය යි කියනු ලැබේ.

**"උපොසථො යාවතිකා ච භික්ඛූ**
**කම්මප්පත්තා සභාගාපත්තියො ච**
**න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා**
**තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති" යි.**

අර්ථකථාචාර්‍ය්‍යයන් වහන්සේලා විසින් ප්‍රකාශිත පරිදි, උපෝසථකර්මයට සුදුසු කාලය චතුරංගයකින් යුක්ත විය යුතුය. උපෝසථය සාමාන්‍ය ලක්ෂණයෙන් එකක් වුවද චාතුද්දසී-පණ්ණරසී-සාමග්ගීය'යි දින වශයෙන් තුනක් ද, සංඝ-ගණ-

Non-commercial distribution

පුග්ගලය'යි කාරක පුද්ගලයන් ගේ වශයෙන් තුනක් ද, සුත්තුද්දේස - පාරිසුද්ධි - අධිට්ඨානය'යි කර්තව්‍යාකාර වශයෙන් තුනක් ද වේ. එයින් මේ කරනු ලබන උපෝසථය-දින වශයෙන් කිනම් උපෝසථයක් ද? (පිළිතුරු දෙනු.)

**ප්‍රශ්නය** :- කාරක පුද්ගලයන්ගේ වශයෙන් කිනම් උපෝසථයක් ද?

**පිළිතුර** :- කාරක පුද්ගලයන්ගේ වශයෙන් සංඝ උපෝසථය යි.

**ප්‍රශ්නය** :- කර්තව්‍යාකාර වශයෙන් කිනම් උපෝසථයක් ද?

**පිළිතුර** :- කර්තව්‍යාකාර වශයෙන් සුත්තුද්දේස උපෝසථය යි.

සුත්තුද්දේස උපෝසථය යි කීයෙහි. එයට සතර නමකට නො අඩු භික්ෂු පිරිසක් එක් සීමාවෙක්හි අත්පස නො පිරිහෙළා වැඩසිටිය යුතු ය. එපමණ භික්ෂූහු මෙහි වැඩසිටින්නාහු ද?

**පිළිතුර** :- එසේ ය, වැඩ සිටින්නාහුය.

**ප්‍රශ්නය** :- පැමිණ සිටින භික්ෂූහු වස්තුසභාගාපත්ති වලින් මිදුණාහු ද?

**පිළිතුර** :- එසේය, ඇවැත්දෙසීමෙන් පිරිසිදු වූවාහුය.

**ප්‍රශ්නය** :- ගෘහස්ථාදී එක්විසි වර්ජනීය පුද්ගලයන් සංඝයාගේ අත්පසින් බැහැර කොට නිමවී ද?

**පිළිතුර** :- එසේය, නිමවිය.

ඉක්බිති පාමොක් උදෙසන ස්ථවිරයන් විසින් මෙසේ කිය යුතු ය.

මේ චතුරංගයෙන් යුක්ත කර්මයට 'පත්තකල්ලය' යි කියනු ලැබේ. පුබ්බකරණ පුබ්බකිච්චානි **සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛු සංඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොම.**

මෙය කී කල්හි සංඝයා විසින් සාධුකාර දිය යුතු ය. ඉක්බිති "ඤත්තිය" කියා පාමොක් උදෙසිය යුතු ය.

**පාමොක් උදෙසීමේදී සතර පාරාජිකාව පමණක් උදෙසා නිම කරත හොත් "උද්ධිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා**

Non-commercial distribution

චත්තාරො පාරාජිකා ධම්මා, සුතා ඛො පනායස්මන්තෙහි තෙරස සංඝාදිසෙසා ධම්මා" යනාදි පාඨයෙන් අවසන් කර එම පාඨය අවසානයේ දී "**පාරාජිකුද්දෙසො දුතියො**" කියා අවසන් කළ යුතුය

**සංඝාදිසෙසුද්දේසය** දක්වා දෙසූ කල "උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, උද්දිට්ඨා තෙරස සංඝාදිසෙසා ධම්මා, සුතා ඛො පනායස්මන්තෙහි ද්වෙ අනියතාධම්මා" යනාදි පාඨයෙන් අවසන් කර එම පාඨය අවසානයේදී "**සංඝාදිසෙසුද්දෙසො තතියො**" කියා නිම කළ යුතුය.

**අනියතුද්දේසය** දක්වා උදෙසුව හොත් "උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, උද්දිට්ඨා තෙරස සංඝාදිසෙසා ධම්මා, උද්දිට්ඨා ද්වේ අනියතා ධම්මා, සුතා ඛො පනායස්මන්තෙහි තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා" යනාදි පාඨයෙන් අවසන් කර එම පාඨය අවසානයේදී "**අනියතුද්දෙසො චතුත්ථො**" කියා අවසන් කළ යුතුය.

අනියතුද්දේසය ඉක්මවා දේශනා කරතහොත් සම්පූර්ණ ප්‍රාතිමෝක්ෂය ම උදෙසිය යුතුය. එසේ උදෙසූ කල ප්‍රාතිමෝක්ෂ-යෙහි එන පරිදිම අවසාන කොට "**විත්ථාරුද්දෙසො පඤ්චමො**" කියා නිම කළ යුතුය.

*Non-commercial distribution*

# භික්ඛු පාතිමොක්ඛ පාළි

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

සුණාතු මෙ භන්තෙ සංඝො, අජ්ජුපොසථො පණ්ණරසො. යදි සංඝස්ස පත්තකල්ලං, සංඝො උපොසථං කරෙය්‍ය, පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.

කිං සංඝස්ස පුබ්බකිච්චං? පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ. පාතිමොක්ඛං උද්දිසිස්සාමි. තං සබ්බෙව සන්තා සාධුකං සුණොම, ' මනසිකරොම, යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය. අසන්තියා ආපත්තියා තුණ්හී භවිතබ්බං. තුණ්හී භාවෙන බො පනායස්මන්තෙ පරිසුද්ධාති වෙදිස්සාමි.

යථා බො පන පච්චෙකපුට්ඨස්ස වෙය්‍යාකරණං හොති.

එවමෙවං එවරූපාය පරිසාය යාවතතියං අනුසාවිතං හොති. යො පන භික්ඛු යාවතතියං අනුසාවියමානෙ සරමානො සන්තිං ආපත්තිං නාවිකරෙය්‍ය, සම්පජාන මුසාවාදස්ස හොති. සම්පජාන මුසාවාදො බො පනායස්මන්තො අන්තරායිකො ධම්මො වුත්තො භගවතා තස්මා සරමානෙන භික්ඛුනා ආපන්නෙන විසුද්ධාපෙක්ඛෙන සන්ති ආපත්ති ආවිකාතබ්බා, ආවිකතා හිස්ස ඵාසු හොති.

උද්දිට්ඨං බො ආයස්මන්තො නිදානං. තත්ථායස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී එව මෙතං ධාරයාමීති.

**නිදානුද්දෙසො පඨමො**

*Non-commercial distribution*

**තත්‍රිමෙ චත්තාරො පාරාජිකා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. යො පන භික්ඛු භික්ඛූනං සික්ඛා සාජීව සමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවීකත්වා මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය, අන්තමසො තිරච්ඡානගතායපි. පාරාජිකො හොති, අසංවාසො.

2. යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍ය සංඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරොසි බාලොසි මූළ්හොසි ථෙනොසී ති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො, අයම්පි පාරාජිකො හොති, අසංවසො.

3. යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්ස විග්ගහං ජීවිතා වොරොපෙය්‍ය, සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය, "අම්භො පුරිස කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන මතන්තෙ ජීවිතා සෙය්‍යො"ති, ඉති චිත්තමනො චිත්ත සංකප්පො අනෙකපරියායෙන මරණ වණ්ණං වා සංවණ්ණෙය්‍ය මරණාය වා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකො හොති, අසංවාසො.

4. යො පන භික්ඛු අනභිජානං උත්තරි මනුස්ස ධම්මං අත්තූපනායිකං අලමරියඤාණ දස්සනං සමුදාචරෙය්‍ය, ඉති ජානාමි ඉති පස්සාමී'ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය 'අජානමෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමි තුච්ඡං මුසාවිලපි'න්ති, අඤ්ඤත්‍ර අධිමානා, අයම්පි පාරාජිකො හොති, අසංවාසො.

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාරාජිකාධම්මා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා න ලභති භික්ඛූහි සද්ධිං සංවාසං යථාපුරෙ තථාපච්ඡා, පාරාජිකො හොති, අසංවාසො.**

**තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී'ති.**

Non-commercial distribution

(උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං. උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, සුතා ඛො පනායස්මන්තෙහි තෙරස සංඝාදිසේසා ධම්මා, ද්වෙ අනියතා ධම්මා, තිංස නිසග්ගියා පාචිත්තියා ධම්මා, ද්වෙ නවුති පාචිත්තියා ධම්මා, චත්තාරො පාටිදෙසනීයා ධම්මා, පඤ්චසත්තති සෙඛියා ධම්මා, සත්ත අධිකරණ සමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධ මාසං උද්දෙසං ආගච්ඡති. තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.)

## පාරාජිකුද්දෙසො දුතියො

**ඉමෙ ඛො පනායස්මන්තො තෙරස සංඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. සඤ්චෙතනිකා සුක්කවිසට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සංඝාදිසෙසො.[1]

2. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය හත්ථගාහං වා වෙණිගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අංගස්ස පරාමසනං, සංඝාදිසෙසො.

3. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා තං යුවා යුවතිං මෙථුනූපසංහිතාහි, සංඝාදිසෙසො.

4. යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමස්ස සන්තිකෙ අත්තකාම පාරිචරියාය වණ්ණං භාසෙය්‍ය 'එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යා'ති මෙථුනූපසංහිතෙන, සංඝාදිසෙසො.

5. යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා, අන්තමසො තංඛණිකාය පි, සංඝාදිසෙසො.

1. සංඝාදිසේසා (සීහල)

Non-commercial distribution

6. සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අස්සාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං:- දීඝසො ද්වාදස විදත්ථියො සුගත විදත්ථියා, තිරියං සත්තන්තරා. භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය, තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං[1] සපරික්කමනං. සාරම්භෙ[2] චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය, පමාණං වා අතික්කාමෙය්‍ය, සංඝාදිසෙසො.

7. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං, භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය. තෙහි භික්ඛූහි වත්ථු[3] දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමනං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථු දෙසනාය, සංඝාදිසෙසො.

8. යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය 'අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍ය'න්ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙව තං අධිකරණං හොති, භික්ඛු ච දොසං පතිට්ඨාති, සංඝාදිසෙසො.

9. යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මේන අනුද්ධංසෙය්‍ය 'අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍ය'න්ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤ භාගියඤ්චෙව තං අධිකරණං හොති, කොචිදෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛු ච දොසං පතිට්ඨාති, සංඝාදිසෙසො.

1. අනාරබ්භං (සීහල පොත්ථකෙසු)
2. සාරබ්භෙ (සීහල පොත්ථකෙසු)
3. වත්ථුං (සීහල)

Non-commercial distribution

10. යො පන භික්ඛු සමග්ගස්ස සංඝස්ස භෙදාය පරක්කමෙය්‍ය, භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො 'මායස්මා සමග්ගස්ස සංඝස්ස භෙදාය පරක්කමි, භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සංඝෙන, සමග්ගො හි සංඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී'ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සංඝාදිසෙසො.

11. තස්සෙව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා, තෙ එවං වදෙය්‍යුං 'මායස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චෙසො භික්ඛු, විනයවාදී චෙසො භික්ඛු, අම්හාකඤ්චෙසො භික්ඛු ඡන්දඤ්ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති නො භාසති, අම්හාකංපෙතං ඛමතී'ති. තෙ භික්ඛූ භික්ඛූහි එවමස්සු වචනීයා 'මායස්මන්තො එවං අවචුත්ථ, න චෙසො භික්ඛු ධම්මවාදී, න චෙසො භික්ඛු විනයවාදී, මායස්මන්තානං පි සංඝභෙදො රුච්චිත්ථ, සමෙතායස්මන්තානං සංඝෙන, සම්මග්ගො හි සංඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී'ති. එවඤ්ච තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං, තෙ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍යුං, සංඝාදිසෙසො.

12. භික්ඛු පනෙව දුබ්බචජාතිකො හොති උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහ ධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති'මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකං වා, අහංපායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා, විරමථායස්මන්තො මම

Non-commercial distribution

වචනීයා'ති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො 'මායස්මා අත්තානං අවචනීයං අකාසි, වචනීයමෙවායස්මා අත්තානං කරොතු, ආයස්මාපි භික්ඛූ වදෙතු සහධම්මේන, භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන, එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤ වචනෙන අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනෙනා'ති.

එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො, තස්ස පටිනිස්සග්ගාය. යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සංඝාදිසෙසො.

13. භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති කුලදූසකො පාපසමාචාරො. තස්ස ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො 'ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා'ති.

එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය, ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ, තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්තී'ති.

සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො 'මායස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සුය්‍යන්ති ච, පක්කමතායස්මා ඉමම්හා ආවාසා අලං තෙ ඉධ වාසෙනා'ති.

Non-commercial distribution

එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය. යාවතියං චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, සංඝාදිසෙසො.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සංඝාදිසෙසා ධම්මා නව පඨමාපත්තිකා චත්තාරො යාවතතියකා. යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා යාවතීහං ජානං පටිච්ඡාදෙති, තාවතීහං තෙන භික්ඛුනා අකාමා පරිවත්ථබ්බං. පරිවුත්ථ පරිවාසෙන භික්ඛුනා උත්තරිං ඡාරත්තං භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං. චිණ්ණමානත්තො භික්ඛු යත්ථ සියා වීසතිගණො භික්ඛුසංඝො, තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො. එකෙනපි චෙ ඌනො වීසතිගණො භික්ඛු සංඝො තං භික්ඛුං අබ්භෙය්‍ය, සො ච භික්ඛු අනබ්භිතො. තෙ ච භික්ඛු ගාරය්හා. අයං තත්ථ සාමීචි.

තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

**සංඝාදිසෙසුද්දෙසො තතියො**

**ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලං කම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො, පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො. අයං ධම්මො අනියතො.

2. නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලං කම්මනියං අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං,

Non-commercial distribution

යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය. තමෙනං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය, සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො, සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො. අයම්පි ධම්මො අනියතො.

**උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ අනියතා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ, පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.**

**අනියතුද්දෙසො චතුත්ථො**

**ඉමෙ ඛො පනායස්මන්තො තිංස නිසග්ගියා පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. නිට්ඨිතචීවරස්මිං[1] භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහ පරමං අතිරෙක චීවරං ධාරෙතබ්බං, තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං.

2. නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං පාචිත්තියං.

3. නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ භික්ඛුනො පනෙව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය, ආකංඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං. පටිග්ගහෙත්වා ඛිප්පමෙව කාරෙතබ්බං, නො චස්ස පාරිපූරී, මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය, තතො චෙ උත්තරි[2] නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය, නිස්සග්ගියං පාචිත්තියං.

1. නිට්ඨිත චීවරස්මිං පන (සීහල)
2. උත්තරිං (සීහල, ස්‍යාම)

Non-commercial distribution

4. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණ චීවරං ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකොටාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.

5. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා[1], නිස්සග්ගිං පාචිත්තියං.

6. යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, නිස්සග්ගියං පාචිත්තියං. තත්ථායං සමයො; අච්ඡින්න චීවරො වා හොති භික්ඛු නට්ඨ චීවරො වා, අයං තත්ථ සමයො.

7. තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානි වා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය, සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං. තතො චෙ උත්තරිං සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

8. භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචෙතාපන්නං[2] උපක්ඛටං හොති 'ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙස්සාමී'ති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය, 'සාධු වත මං ආයස්මා ඉමිනා චීවරචෙතාපන්නෙන එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහී ති කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තියං.

9. භික්ඛුං පනෙව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙක චීවර චෙතාපන්නානි උපක්ඛටානි හොන්ති, 'ඉමෙහි මයං පච්චෙක චීවරචෙතාපන්නෙහි පච්චෙකචීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙහි අච්ඡාදෙස්සාමා'ති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය, 'සාධු වත මං

1. පාරිවත්තකා (මරම්ම)
2. චීවරචෙතාපනං (ස්‍යාම)

Non-commercial distribution

ආයස්මන්තො ඉමෙහි පච්චෙක චීවරචෙතාපන්නෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ උභොව සන්තා එකෙනා'ති කල්‍යාණකම්‍යතං උපාදාය, නිස්සග්ගියං පාචිත්තියං.

10. භික්ඛුං පනෙව උද්දිස්ස රාජා වා රාජභොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතෙන චීවරචෙතාපන්නං පහිණෙය්‍ය, 'ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථං නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙහී'ති.

සො චෙ දූතො තං භික්ඛුං උපසංකමිත්වා එවං වදෙය්‍ය 'ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං, පතිගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්න'න්ති.

තෙන භික්ඛුනා සො දූතො එවමස්ස වචනීයො 'න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පතිගණ්හාම,[1] චීවරඤ්ච ඛො මයං පතිගණ්හාම කාලෙන කප්පියං'ති. සො චෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය, 'අත්ථි පනායස්මතො කොචි වෙය්‍යාවච්චකරො'ති. චීවරත්ථිකෙන භික්ඛවේ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො ආරාමිකො වා උපාසකො වා 'එසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරො'ති.

සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසංකමිත්වා එවං වදෙය්‍ය. "යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා. උපසංකමතු ආයස්මා කාලෙන චීවරෙන තං අච්ඡාදෙස්සතී'ති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසංකමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො 'අත්ථො මෙ ආවුසො චීවරෙනා'ති. ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරයමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ අභිනිප්පාදෙය්‍ය චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං. චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතො උද්දිස්ස තිට්ඨමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චෙතං කුසලං. තතො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

1. පටිග්ගණ්හාම (මරම්ම)

Non-commercial distribution

නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, යතස්ස චීවරචෙතාපන්නං ආභතං තත්ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො'යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්ථ, න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති. යුඤ්ජන්තායස්මන්තො සකං, මා වො සකං විනස්සා'ති. අයං තත්ථ සාමීචි.

## චීවරවග්ගො පඨමො

1. යො පන භික්ඛු කොසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

2. යො පන භික්ඛු සුද්ධකාලකානං එළකලොමානං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

3. නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානෙන ද්වෙ භාගා සුද්ධකාලකානං එළකලොමානං ආදාතබ්බා තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං. අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාලකානං එළකලොමානං තතියං ඔදාතානං චතුත්ථං ගොචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

4. නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං. ඔරෙන චෙ[1] ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ් -ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං.

5. නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණසන්ථතස්ස සාමන්තා සුගත විදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය. අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගත විදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

6. භික්ඛුනො පනෙව අද්ධානමග්ගපටිපන්නස්ස එළකලොමානි උප්පජ්ජෙය්‍යුං, ආකංඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බානි. පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්තා හරිතබ්බානි[1] අසන්තෙ

1. ඔරෙන චෙ භික්ඛු (සීහල)

Non-commercial distribution

හාරකෙ. තතො චෙ උත්තරිං[2] හරෙය්‍ය අසන්තෙපි හාරකෙ, නිස්සග්ගියං පාචිත්තියං.

7. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුණියා එළකලොමානි ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.

8. යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

9. යො පන භික්ඛු නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

10. යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

### කොසියවග්ගො දුතියො[3]

1. දසාහපරමං අතිරෙකපත්තො ධාරෙතබ්බො. තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං.

2. යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

තෙන භික්ඛුනා සො පත්තො භික්ඛු පරිසාය නිස්සජ්ජිතබ්බො.[4] යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො, සො තස්ස භික්ඛුනො පදාතබ්බො 'අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො'ති. අයං තත්ථ සාමීචි.

3. යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි, සෙය්‍යථීදං; සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි. තං අතික්කාමයතො, නිස්සග්ගියං පාචිත්තියං.

---

1. හාරෙතබ්බානි (ඉතිපි පාඨො)
2. උත්තරිං (සීහල)
3. එළකලොම වග්ගො (සීහල)
4. නිස්සජිතබ්බො (සීහල)

Non-commercial distribution

4. මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං. අද්ධමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බං. ඔරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය, ඔරෙනද්ධ මාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය, නිසග්ගියං පාචිත්තියං.

5. යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො[1] අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා, නිස්සග්ගියං පාචිත්තියං.

6. යො පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

7. භික්ඛුං පනෙව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානි වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසංකමිත්වා චීවරෙ විකප්පං ආපජ්-ජෙය්‍ය 'ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීය්‍යති.[2] ආයතඤ්ච කරොථ විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ. අප්පෙවනාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමා'ති. එවඤ්ච සො භික්ඛු වත්වා කිංචිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාත මත්තම්පි, නිස්සග්ගියං පාචිත්තියං.

8. දසාහානාගතං කත්තිකතෙමාසික පුණ්ණමං[3] භික්ඛුනො පනෙව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං. පටිග්ගහෙත්වා යාව චීවරකාලසමයං නික්ඛිපිතබ්බං. තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං

9. උපවස්සං ඛො පන කත්තිකපුණ්ණමං යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසංකසම්මතානි සප්පටිභයානි, තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො ආකංඛමානො

1 පච්ඡා කුපිතො (සීහල)

2. වියති (සීහල)

3. කත්තික තෙමාසි පුණ්ණමං (සීහල)

Non-commercial distribution

තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය, සියා ච තස්ස භික්ඛුනො කොචිදේව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය. ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං. තතො චෙ උත්තරි විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා, නිස්සග්ගියං පාචිත්තියං.

10. යො පන භික්ඛු ජානං සංඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය, නිස්සග්ගියං පාචිත්තියං.

**පත්තවග්ගො තතියො.**

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

**නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා**

ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. සම්පජාන මුසාවාදෙ පාචිත්තියං.

2. ඔමසවාදෙ පාචිත්තියං.

3. භික්ඛුපෙසුඤ්ඤෙ පාචිත්තියං.

4. යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය, පාචිත්තියං.

5. යො පන භික්ඛු අනුපසම්පන්නේන උත්තරී[1] දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.

6. යො පන භික්ඛු මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.

1. උත්තරිං (සීහල)

Non-commercial distribution

7. යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරි ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය, අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන, පාචිත්තියං.

8. යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්ස ධම්මං ආරොචෙය්‍ය, භූතස්මිං පාචිත්තියං.

9. යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා,[1] පාචිත්තියං.

10. යො පන භික්ඛු පඨවිං[2] ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා, පාචිත්තියං.

## මුසාවාද වග්ගො පඨමො

1. භූතගාම පාතබ්‍යතාය[3] පාචිත්තියං.

2. අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං.

3. උජ්ඣාපනකෙ ඛිය්‍යනකෙ පාචිත්තියං

4. යො පන භික්ඛු සංඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.

5. යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.

6. යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ ජානං පුබ්බූපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය 'යස්ස සම්බාධො භවිස්සති, සො පක්කමිස්සතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.

7. යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සංඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා, පාචිත්තියං.

1. භික්ඛුසම්මතියා (ස්‍යාම)
2. පඨවිං (මරම්ම)
3. පාතව්‍යතාය (සීහල)

Non-commercial distribution

8. යො පන භික්ඛු සංඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදෙය්‍ය වා[1] අභිනිපජ්ජෙය්‍ය වා, පාචිත්තියං.

9. මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන යාව ද්වාරකොසා අග්ගලට්ඨපනාය ආලොක සන්ධිපරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං. තතො චෙ උත්තරි අප්පහරිතෙපි ඨිතො අධිට්ඨහෙය්‍ය, පාචිත්තියං.

10. යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා, පාචිත්තියං.

**භූතගාම වග්ගො දුතියො**

1. යො පන භික්ඛු අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය, පාචිත්තියං.

2. සම්මතොපි චෙ භික්ඛු අත්ථංගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදෙය්‍ය, පාචිත්තියං.

3. යො පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසංකමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො, ගිලානා හොති භික්ඛුනී අයං තත්ථ සමයො.

4. යො පන භික්ඛු එවං වදෙය්‍ය 'ආමිස හෙතු ථෙරා භික්ඛු[2] භික්ඛුනියො ඔවදන්තී'ති, පාචිත්තියං.

5. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා, පාචිත්තියං.

6. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා, පාචිත්තියං.

7. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයො, සත්ථගමනීයො හොති මග්ගො සාසංක සම්මතො සප්පටිභයො, අයං තත්ථ සමයො.

1. සහසා අභිනිසීදෙය්‍ය වා (සීහල)
2. ආමිසහෙතු භික්ඛු (සීහල)

Non-commercial distribution

8. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධං ගාමිනිං වා අධො ගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය, පාචිත්තියං.

9. යො පන භික්ඛු ජානං භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය, අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා, පාචිත්තියං.

10. යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

**ඔවාදවග්ගො තතියො.**

1. අගිලානෙන භික්ඛුනා එකො ආවසථ පිණ්ඩො භුඤ්ජිතබ්බො, තතො චෙ උත්තරී භුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

2. ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො; ගිලාන සමයො චීවරදාන සමයො චීවරකාර සමයො අද්ධානගමන සමයො නාවාභිරූහන සමයො මහාසමයො සමණභත්ත සමයො, අයං තත්ථ සමයො.

3. පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො, ගිලානසමයො චීවරදාන සමයො චීවරකාරසමයො, අයං තත්ථ සමයො.

4. භික්ඛුං පනෙව කුලං උපගතං පූවෙහි වා මන්ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය, ආකංඛමානෙන භික්ඛුනා ද්වත්ති පත්තපූරා පටිග්ගහෙතබ්බා. තතො චෙ උත්තරි පටිග්ගණ්හෙය්‍ය, පාචිත්තියං. ද්වත්ති පත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං, අයං තත්ථ සාමීචි.

5. යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.

6. යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙය්‍ය 'හන්ද භික්ඛු ඛාදවා භුඤ්ජවා'ති ජානං ආසාදනාපෙක්ඛො, භුත්තස්මිං පාචිත්තියං.

Non-commercial distribution

7. යො පන භික්ඛු විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.

8. යො පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.

9. යානි ඛො පන තානි පණීතභොජනානි, සෙය්‍යථීදං, සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි, යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

10. යො පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා පාචිත්තියං.

**භොජනවග්ගො චතුත්ථො**

1. යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය, පාචිත්තියං.

2. යො පන භික්ඛු භික්ඛුං[1] 'එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා'ති තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය 'ගච්ඡාවුසො, න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති, එකකස්ස මේ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.

3. යො පන භික්ඛු සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

4. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

5. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

6. යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු

1. භික්ඛුං එවං වදෙය්‍ය (සීහල)

Non-commercial distribution

චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්‍ථායං සමයො, චීවරදානසමයො චීවරකාරසමයො, අයං තත්‍ථ සමයො.

7. අගිලානෙන භික්ඛුනා චතුමාසප්පච්චය පවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය, තතො චෙ උත්තරි සාදියෙය්‍ය, පාචිත්තියං.

8. යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.

9. සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො සෙනං ගමනාය, දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං. තතො චෙ උත්තරිං වසෙය්‍ය. පාචිත්තියං.

10. දිරත්තතිරත්තං චෙ භික්ඛු සෙනාය වසමානො උය්‍යොධිකං වා බලග්ගං වා සේනාබ්‍යූහං වා අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.

### අචෙලකවග්ගො පඤ්චමො

1. සුරාමේරයපානෙ පාචිත්තියං.

2. අංගුලිපතොදකෙ පාචිත්තියං.

3. උදකෙ හස්සධම්මෙ පාචිත්තියං.

4. අනාදරියෙ පාචිත්තියං.

5. යො පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය, පාචිත්තියං.

6. යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙක්ඛො[1] ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.

7. යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්‍ථායං සමයො, දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය

1. විසීවනාපෙකො (සීහල)

Non-commercial distribution

මාසා, උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධානගමන සමයො වාතවුට්ඨිසමයො, අයං තත්ථ සමයො.

8. නවං පන භික්ඛුනා චීවරලාභෙන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා, අනාදා චෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

9. යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අප්පච්චුද්ධාරණං[1] පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

10. යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හසාපෙක්ඛො පි, පාචිත්තියං.

## සුරාපානවග්ගො ඡට්ඨො

1. යො පන භික්ඛු සංචිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය, පාචිත්තියං.

2. යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

3. යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙය්‍ය, පාචිත්තියං.

4. යො පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය, පාචිත්තියං.

5. යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය, සො ච පුග්ගලො අනුපසම්පන්නො, තෙ ච භික්ඛූ ගාරය්හා, ඉදං තස්මිං පාචිත්තියං.

1. අපච්චුද්ධාරකං (සීහල, සය්‍යාම)

Non-commercial distribution

6. යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි, පාචිත්තියං.

7. යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි, පාචිත්තියං.

4. යා පන භික්ඛුනී විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.

5. යා පන භික්ඛුනී සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පාචිත්තියං.

6. යා පන භික්ඛුනී අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා, පාචිත්තියං.

Non-commercial distribution

7. යා පන භික්ඛුනී භික්ඛුනිං[1] 'එහායෙය්‍ය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා'ති, තස්සා දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය 'ගච්ඡෙය්‍ය, න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති, එකකාය මෙ කථා වා නිසජ්ජා වා ඵාසුහොතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.

8. යා පන භික්ඛුනී සභොජනෙකුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

9. යා පන භික්ඛුනී පුරිසෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

10. යා පන භික්ඛුනී පුරිසෙන සද්ධිං එකෙනෙකා රහො නිසජ්ජං කප්පෙය්‍ය, පාචිත්තියං.

**භොජනවග්ගො ද්වාදසමො.**

1. යා පන භික්ඛුනිං නිමන්තිතා සභත්තා සමානා සන්තිං භික්ඛුනිං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො; චීවරදානසමයො චීවරකාරසමයො. අයං තත්ථ සමයො.

2. අගිලානාය භික්ඛුනියා චතුමාසප්පච්චය පවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුනපවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය. තතො චෙ උත්තරි සාදියෙය්‍ය, පාචිත්තියං.

3. යා පන භික්ඛුනී උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.

4. සියා ච තස්සා භික්ඛුනියා කොචිදෙව පච්චයො සෙනං ගමනාය, දිරත්ත තිරත්තං තාය භික්ඛුනියා සෙනාය වසිතබ්බං. තතො චෙ උත්තරි වසෙය්‍ය, පාචිත්තියං.

1. භික්ඛුනිං එවං වදෙය්‍ය (සීහල)

Non-commercial distribution

5. දිරත්ත තිරත්තං චෙ භික්ඛුනී සෙනාය වසමානා උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යුහං වා අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය, පාචිත්තියං.

6. සුරාමෙරය පානෙ පාචිත්තියං.

7. අංගුලිපතොදකෙ පාචිත්තියං.

8. උදකෙ හස්සධම්මෙ පාචිත්තියං.

9. අනාදරියෙ පාචිත්තියං.

10. යා පන භික්ඛුනී භික්ඛුනිං භිංසාපෙය්‍ය, පාචිත්තියං.

**චාරිත්තවග්ගො තෙරසමො.**

1. යා පන භික්ඛුනී අගිලානා විසිබ්බනාපෙක්ඛා ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, පාචිත්තියං.

2. යා පන 'භික්ඛුනී ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, පාචිත්තියං. තත්ථායං සමයො, දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍යමාසා, උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධාන ගමනසමයො වාතවුට්ඨිසමයො. අයං තත්ථ සමයො.

3. නවං පන භික්ඛුනියා චීවරලාභාය තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා. අනාදා චෙ භික්ඛුනී තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

4. යා පන භික්ඛුනී භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අප්පච්චුද්ධාරණං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

5. යා පන භික්ඛුනී භික්ඛුනියා පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කාය බන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හසාපෙක්ඛොපි, පාචිත්තියං.

Non-commercial distribution

6. යා පන භික්ඛුනී සංචිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය, පාචිත්තියං.

7. යා පන භික්ඛුනී ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය, පාචිත්තියං.

8. යා පන භික්ඛුනී ජානං යථා ධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙය්‍ය, පාචිත්තියං.

9. යා පන භික්ඛුනී ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි, පාචිත්තියං.

10. යා පන භික්ඛුනී එවං වදෙය්‍ය, 'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා'ති. සා භික්ඛුනී භික්ඛුනීහි එවමස්ස වචනීයා 'මාය්‍යෙ එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, නහි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන අය්‍යෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලංච පන තෙ පටිසෙවතො අන්තරායායා'ති. එවං ච පන සා භික්ඛුනී භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා භික්ඛුනී භික්ඛුනීහි යාව තතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය. යාවතතියං චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං. නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, පාචිත්තියං.

## ජොතිවග්ගො චතුද්දසමො

1. යා පන භික්ඛුනී ජානං තථාවාදිනියා භික්ඛුනියා අකතානුධම්මාය තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨාය සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.

2. සමණුද්දෙසා පි චෙ එවං වදෙය්‍ය, 'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා'ති. සා සමණුද්දෙසා භික්ඛුනීහි එවමස්ස වචනීයා,

Non-commercial distribution

'මායෙය්‍ය සමණුද්දෙසෙ එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, නහි භගවා එවං වදෙය්‍ය, අනෙක පරියායෙන අයෙය්‍ය සමණුද්දෙසෙ අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලං ච පන තෙ පටිසෙවතො අන්තරායායා'ති. එවං ච සා සමණුද්දෙසා භික්ඛුනීහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍ය, සා සමණුද්දෙසා භික්ඛුනීහි එවමස්ස වචනීයා 'අජ්ජතග්ගෙ තෙ අයෙය්‍ය සමණුද්දෙසෙ නචෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො, යං පි චඤ්ඤා සමණුද්දෙසා ලභන්ති භික්ඛුනීහි සද්ධිං දිරත්ත තිරත්තං සහසෙය්‍යා, සා පි තෙ නත්ථි, චර පිරෙ විනස්සා'ති. යා පන භික්ඛුනී ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය, පාචිත්තියං.

3. යා පන භික්ඛුනී භික්ඛුනීහි සහධම්මිකං වුච්චමානා එවං වදෙය්‍ය 'න තාවාහං අයෙය්‍ය එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි, යාව න අඤ්ඤං භික්ඛුනිං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී'ති, පාචිත්තියං. සික්ඛමානාය භික්ඛවෙ භික්ඛුනියා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං. අයං තත්ථ සාමීචි.

4. යා පන භික්ඛුනී පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය 'කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි, යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තී' ති සික්ඛාපද විවණ්ණකෙ, පාචිත්තියං.

5. යා පන භික්ඛුනී අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය 'ඉදානෙව ඛො අහං ජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී'ති. තඤ්චෙ භික්ඛුනිං අඤ්ඤා භික්ඛුනියො ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමාය භික්ඛුනියා ද්වත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ, කො පන වාදො භීයො, න ච තස්සා භික්ඛුනියා අඤ්ඤාණකෙන මුත්ති අත්ථි. යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නා, තඤ්ච යථාධම්මො කාරෙතබ්බො. උත්තරි චස්සා මොහො ආරොපෙතබ්බො. 'තස්සා තෙ අයෙය්‍ය අලාභා තස්සා තෙ දුල්ලද්ධං, යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිං කත්වා මනසිකරොසී'ති. ඉදං තස්මිං මොහනකෙ, පාචිත්තියං.

Non-commercial distribution

6. යා පන භික්ඛුනී භික්ඛුනියා කුපිතා අනත්තමනා පහාරං දදෙය්‍ය, පාචිත්තියං.

7. යා පන භික්ඛුනී භික්ඛුනියා කුපිතා අනත්තමනා තලසත්තිකං උග්ගිරෙය්‍ය, පාචිත්තියං.

8. යා පන භික්ඛුනී භික්ඛුනිං අමූලකෙන සංඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය, පාචිත්තියං.

9. යා පන භික්ඛුනී භික්ඛුනියා සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය 'ඉතිස්සාමුහුත්තම්පි අඵාසු භවිස්සතී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.

10. යා පන භික්ඛුනී භික්ඛුනීනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය 'යං ඉමා භණිස්සන්ති තං සොස්සාමී'ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, පාචිත්තියං.

## දිට්ඨිවග්ගො පණ්ණරසමො

1 යා පන භික්ඛුනී ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, පාචිත්තියං.

2. යා පන භික්ඛුනී සංඝෙ විනිච්ඡය කථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය, පාචිත්තියං.

3. යා පන භික්ඛුනී සමග්ගෙන සංඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, යථාසන්ථුතං භික්ඛුනියො සංඝිකං ලාභං පරිණාමෙන්තී ති, පාචිත්තියං.

4. යා පන භික්ඛුනී ජානං සංඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය, පාචිත්තියං.

5. යා පන භික්ඛුනී රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා, පාචිත්තියං. රතනං වා පන භික්ඛුනියා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතබ්බං, 'යස්ස භවිස්සති සො හරිස්සතී'ති. අයං තත්ථ සාමීචි.

Non-commercial distribution

6. යා පන භික්ඛුනී අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය, ඡේදනකං පාචිත්තියං.

7. යා පන භික්ඛුනියා මඤ්චං වා පීඨං වා කාරයමානාය අට්ඨංගුල පාදකං කාරෙතබ්බං සුගතංගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා. තං අතික්කාමෙන්තියා, ඡේදනකං පාචිත්තියං.

8. යා පන භික්ඛුනී මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය, උද්දාලනකං පාචිත්තියං.

9. කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං: දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ද්වෙ විදත්ථියො, තං අතික්කාමෙන්තියා ඡේදනකං පාචිත්තියං.

10. යා පන භික්ඛුනී සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා ඡේදනකං පාචිත්තියං. තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං: දීඝසො නව විදත්ථියො සුගත විදත්ථියා, තිරියං ඡ විදත්ථියො. ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං.

**ධම්මිකවග්ගො සොළසමො.**

**උද්දිට්ඨා ඛො අය්‍යායො ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා, තත්ථායය්‍යායො පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායය්‍යායො, තස්මා තුණ්හී, එවමෙතං ධාරායාමීති.**

**ඡසට්ඨිසතා පාචිත්තියා නිට්ඨිතා.**

**ඉමෙ ඛො පනායය්‍යායො අට්ඨ පාටිදෙසනීයා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. යා පන භික්ඛුනී අගිලානා සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය, පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී ති.

Non-commercial distribution

2. යා පන භික්ඛුනී අගිලානා තෙලං-පෙ-මධුං- පෙ- ඵාණිතං - පෙ - මච්ඡං-පෙ-මංසං-පෙ-ඛීරං-පෙ- දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය, පටිදෙසෙතබ්බං තාය භික්ඛුනියා ගාරය්හං අය්‍යෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමීති.

උද්දිට්ඨා ඛො අය්‍යායො අට්ඨ පාටිදෙසනීයා ධම්මා, තත්ථාය්‍යායො පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථාය්‍යායො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

## අට්ඨ පාටිදෙසනීයා නිට්ඨිතා.

ඉමෙ ඛො පනාය්‍යායො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛාකරණීයා -පෙ-

75. න උදකෙ අගිලානා උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

## පාදුකවග්ගො සත්තමො.

උද්දිට්ඨා ඛො අය්‍යායො සෙඛියා ධම්මා, තත්ථාය්‍යායො පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථාය්‍යායො, තස්මා තුණ්හී, එවමෙතං ධාරායාමීති.

## පඤ්චසත්තති සෙඛියා නිට්ඨිතා.

ඉමෙ ඛො පනාය්‍යායො සත්ත අධිකරණ සමථා ධම්මා උද්දේසං ආගච්ඡන්ති.

උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛා විනයො දාතබ්බො, සති විනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො පටිඤ්ඤාය කාරෙතබ්බං, යෙභුය්‍යසිකා, තස්ස පාපිය්‍යසිකා තිණවත්ථාරකො ති.

උද්දිට්ඨා ඛො අය්‍යායො සත්ත අධිකරණ සමථා ධම්මා, තත්ථාය්‍යායො පුච්ඡාමි. කච්චිත්ථ පරිසුද්ධා? දුතියම්පි පුච්ඡාමි

Non-commercial distribution

කච්චිත්ථ පරිසුද්ධා? තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා? පරිසුද්ධෙත්ථායයායො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

**අධිකරණ සමථා නිට්ඨිතා.**

උද්දිට්ඨං ඛො අයයායො නිදානං, උද්දිට්ඨා අට්ඨ පාරාජිකා ධම්මා, උද්දිට්ඨා සත්තරස සංඝාදිසේසා ධම්මා, උද්දිට්ඨා තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා ඡසට්ඨිසතා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා අට්ඨ පාටිදෙසනීයා ධම්මා, උද්දිට්ඨා පඤ්ච සත්තති සෙඛියා ධම්මා, උද්දිට්ඨා සත්ත අධිකරණ සමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දේසං ආගච්ඡති, තත්ථ සබ්බාහෙව සමග්ගාහි සම්මොදමානාහි අවිවදමානාහි සික්ඛිතබ්බන්ති.

**විත්ථාරුද්දේසො**

**භික්ඛුනී පාතිමොක්ඛං නිට්ඨිතං.**

Non-commercial distribution

### සිංහල

# භික්ෂු ප්‍රාතිමෝක්ෂය

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ස්වාමීනි, සංඝතෙමේ මා කියන්නක් අසාවා, අද පුණුරුසි පොහෝ දවසය.[1] ඉදින් සංඝයාගේ පොහොය කිරීමට සුදුසු කාලය පැමිණියේ නම්[2] සංඝතෙමේ පොහොය කරන්නේය.[3] පාමොක්[4] උදෙසන්නේය.

සංඝයා විසින් කළ යුතු වූ පූර්වකෘත්‍යය[5] කොට නිමවන ලදද? (එසේනම්) ඇවැත්නි පිරිසිදුබව[6] පළ කරවු. පාමොක් උදෙසන්නෙමි. අප සියල්ලෝ ම එක්වන්ව සාවධානව එය අසමු. මෙනෙහි කරමු. යමෙකුට පැමිණි ආපත්තියක් ඇත්නම් එය ප්‍රකාශ කළ යුත්තේ ය. ආපත්තියක් නැති කල්හි නිශ්ශබ්ද විය යුතුය. නිශ්ශබ්ද වීමෙන් ආයුෂ්මත්හු පිරිසුදුහයි දැනගනිමි. යම් සේ ඔබ වෙන් වෙන් ව විචාළා වූ (මට) එය විසඳීමක් වන්නේ ද, එහෙයිනි.

එසේ ම මෙබඳු පිරිසක තුන් යලක් නැවත නැවත ඇසීමක් වේ. යම් භික්ෂුවක් තුන් යලක් නැවත නැවත අසනු ලබද්දීත් (තමා කෙරෙහි) ඇති ආපත්තිය සිහි කරමින් එය ප්‍රකාශ නොකරයි ද ඕහට සම්පජාන මුසාවාදය වේ. ඇවැත්නි, දැන දැන බොරුකීම වූ කලී අන්තරාය කර දෙයකැ'යි භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද්දේ ය. එහෙයින් පිරිසුදු බව බලාපොරොත්තු වන්නා වූ ද ආපත්ති සිහි කරන්නා වූ ද භික්ෂුව විසින් ඇති ආපත්ති ප්‍රකාශ කළයුතු වෙයි. එසේ ප්‍රකාශ කිරීම භික්ෂූන්ගේ ධ්‍යානාධිගමය සඳහා පහසුවන්නේ ද එහෙයිනි.

---

* සිංහල කොටසේ සංඛ්‍යා සටහන් උප ග්‍රන්ථයෙන් බලන්න.

Non-commercial distribution

ඇවැත්නි, නිදානය දක්වන ලදී. එහි ලා ඔබ අතින් විචාරමි. කෙසේ ද? පිරිසුදු ද? දෙවැනිවර ද විචාරමි. කෙසේ ද? පිරිසුදු ද? තෙවැනි වරද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ නිදානයෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම් ද, එහෙයිනි.

**පළමුවැනි නිදානෝද්දේසයයි.**

**මේ ප්‍රාතිමෝක්ෂයෙහි සිව්පරිජි[7] ඇවැත් උදෙසනු ලැබේ.**

1. යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳ අධිශීල ශික්ෂාවන්ට[8] පැමිණියේ, උපසම්පදාව ප්‍රතික්ෂේප නොකොට[9] දුර්වල බව ද නොකියා, යටත් පිරිසෙයින් තිරිසන්ගත මාගමක් සමග ද මෙවුන්දම් සෙවී නම් පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සහවාසයට නුසුදුස්සෙක් ද වේ.

2. යම්කිසි භික්ෂුවක් ගමින් හෝ අරණ්‍යයෙන් හෝ සොරකමට අයත් වූ නුදුන් වස්තුවක් පැහැරගනී නම්, එබඳු අන්සතු වස්තුවක් ගැනීමේදී රජවරු සොරුන් අල්වා මරත්ද, සිරකරත්ද, රටින් හෝ නෙරපා හරිත්ද, තෝ සොරෙක, බාලයෙක, මෝඩයෙක, සැඟවී සිටිය යුත්තකැ'යි නින්දා පරිභව කරත් ද, එබඳු දඬුවමකට තරම් වටිනාකම් ඇති අන් සතු දෙයක් පැහැරගන්නා වූ මහණතෙමේ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සහවාසයට නුසුදුස්සෙක් ද වේ.

3. යම්කිසි භික්ෂුවක් මනුෂ්‍ය ශරීරය ජීවිතේන්ද්‍රියයෙන් තොර කරයි නම්, මරණය සඳහා ආයුධ හෝ පිළියෙළ කොට තබයි නම්, මරණයෙහි අනුසස් හෝ ප්‍රකාශකරයි නම් 'ඔබට මේ පවිටු වූ දුක්ඛර ජීවිතයෙන් කවර වැඩක් ද? ජීවත්වීමට වඩා ඔබේ මරණය උතුම් ය'යි මරණයෙහි ලා උත්සාහගන්වයි නම්, ඒ මරණු කැමති සිත් ඇතිව, කල්පනා ඇතිව, නොයෙක් අයුරෙන් මරණයෙහි ගුණවණන්නා වූ ද මරණය පිණිස උත්සාහ ගන්වන්නා වූ ද මහණ තෙමේ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සහවාසයට නුසුදුස්සෙක් ද වේ.

Non-commercial distribution

4. යම්කිසි භික්ෂුවක් සිය සතන්හි නූපන්නා වූ ආර්‍ය්‍ය මාර්ගඥාන දර්ශනය ඇති කරන සුළු උත්තරී මනුෂ්‍යධර්මය[10] තමා කෙරෙහි ඇතැ'යි ද එය මේ කාරණයෙන් දනිමි. මේ කාරණයෙන් දකිමි'යි ද ප්‍රකාශ කරයි. එපමණකින් ආපත්තියට පැමිණියා වූ ඒ භික්ෂුව නැවත පිරිසුදුබව කැමැතිව පසු කලෙක (අනිකකු විසින්) විචාරණ ලැබුව ද නොලැබුව ද, මම උතුරු මිනිස්දම් නොදැනම දනිමි'යි කීම් නම්, නොදැකම දකිමි'යි කීම් නම් එය නිස්සාරය, බොරු යයි කියා ද, අධිමානයෙන්[11] තොරව කියන්නා වූ ඒ මහණ පරිජිවූයේ වෙයි. (පියවි මහණුන් සමග) සහවාසයට නුසුදුස්සෙක් ද වේ.

ඇවැත්නි සතරපාරාජිකා'පත්තීහු උදෙසන ලද්දාහු වෙති. යම් භික්ෂුවක් මේ පරිජි ඇවැත් අතර යම් යම් පරිජියකට පැමිණියේ ද ගිහිකල්හි මෙන් පරිජියට පැමිණීමෙන් පසුව ද පියවි භික්ෂූන් සමග සහවාසයක් නොලබයි. පරිජි වූයේ වෙයි. පැවිද්දට නුසුදුස්සෙක් ද වේ.

මේ සිව්පරිජියෙහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසුදුද? දෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදුද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදුද? මේ සිව්පරිජියෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය, නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම් ද, එහෙයිනි.

(ඇවැත්නි, නිදානය උදෙසන ලදී. සිව්පරිජි ද උදෙසන ලද්දේය. ඔබ විසින් තෙළෙස් සඟවෙසෙස් අසන ලද්දේය. එසේ ම අනියත දෙකය, තිස් නිසඟිපචිතිය, දෙයානූවක් පචිතිය, පාටිදේසනීය සතරය, පන්සැත්තෑවක් සේඛියා ධර්මය, හා සප්ත අධිකරණ සමථ ධර්මයෝ ද අසන ලද්දාහුය. මෙතෙක් ප්‍රාතිමෝක්ෂයෙහි ආවා වූ, එහි ඇතුළත් වූ, භාග්‍යවතුන් වහන්සේ ගේ ශික්ෂාපද අඩමසක් පාසා උදෙසිය යුතු බවට පැමිණේ. සමගි වූ ද, සතුටු වූ ද, විවාද නො කරන්නා වූ ද සියල්ලන් විසින් ම ඒ ඒ ශික්ෂාපදයෙහි ලා හික්මිය යුතුයි.)

**දෙවැනි පාරාජිකා උද්දේසයයි.**

Non-commercial distribution

ඇවැත්නි, අනතුරුව මේ තෙළෙස් සඟවෙසෙස්[12] උදෙසනු ලැබේ.

1. සිහිනයකදී විනා දැන දැන ශුක්‍ර මෝචනයක් වේ ද (ඕහට) සඟවෙසෙස් නම් ඇවැත වේ.

2. යම් භික්ෂුවක් රාගී අදහස් ඇතිව පෙරලී ගිය සිතින් අතින'ත ගැනීම, කෙහෙ අල්ලා ගැනීම, හා අනිත් අතින් අවයවයන් පරාමර්ශනය කිරීම වශයෙන් ස්ත්‍රියක හා කයින් කය ස්පර්ශ කෙරේ ද, (ඕහට) සඟවෙසෙස් ඇවැත් වේ.

3. යම් භික්ෂුවක් රාගී අදහස් ඇතිව පෙරලී ගිය සිතින් තරුණයකු තරුණියකට මෛථුන සන්නිශ්‍රිතව කරන කථාවක් මෙන් යම් ස්ත්‍රියකට ඇගේ වසමග පසමග පිළිබඳව අසභ්‍යව්‍යවහාරයෙන් කථා කරයි නම් (ඕහට) සඟවෙසෙස් ඇවැත් වේ.

4. යම් භික්ෂුවක් රාගී අදහස් ඇතිව පෙරලී ගිය සිතින් 'නැගණියනි, සිල්වත්වූ යහපත් ගතිගුණ හා බඹසර ඇත්තා වූ මා වැන්නකුට මෛථුන සේවනයෙන් උවටැන් කෙරේ නම් එය උපස්ථානයන් අතර ශ්‍රේෂ්ඨ ය'යි ස්ත්‍රියක් හමුවෙහි තමා හා මෙවුන්දම් සෙවීමේ අනුසස් ප්‍රකාශ කරන්නේද, (ඕහට) සඟවෙසෙස් නම් ඇවැත් වේ.

5. යම් භික්ෂුවක් ස්ථිර අඹුසැමි බවකින් හෝ සොර අඹුසැමි බවකින් ස්ත්‍රියකගේ කැමැත්ත පුරුෂයාට ද පුරුෂයාගේ කැමැත්ත ස්ත්‍රියවෙත ද ගෙනයයිද, යටත් පිරිසෙයින් එකෙණෙහි රමණය කරනු කැමති ස්ත්‍රී පුරුෂයන්ගේ හෝ අදහස් ඔවුනොවුන් අතර ගෙනයන්නේ නම් (ඕහට) සංඝාදිසේසා'පත්තිය වේ.

6. තමන් සඳහා වූ ද, කරවා දෙන දායකයන් නැත්තා වූ ද, (එහෙයින් ම) ඉල්ලා ගත් වැ, පොරෝ, ආදිය ඇතිව කුටියක් කරවනු කැමති භික්ෂුව විසින් එය ප්‍රමාණවත් ලෙස කරවිය යුත්තේය. මේ එහි ප්‍රමාණයයි. දිගින් යුගත් වියතින්[13] දොළොස් වියතකි. පළලින් (භිත්ති හැර) ඇතුළත සුගත් වියතින් සත් වියතකි. කුටිබිම දෙසීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් ද උපද්‍රව රහිතව උපචාර සහිතව කුටිබිම දෙසිය

Non-commercial distribution

යුත්තේ ය. යම් භික්ෂුවක් උපද්‍රව සහිතව උපචාර රහිතව ඉල්ලා ගත් වැ, පොරෝ, ආදියෙන් කුටියක් කර වන්නේ කුටිබිම දෙසීම පිණිස භික්ෂූහු ද නොකැඳවන ලද්දාහු ද, එසේ ම ප්‍රමාණය ද ඉක්මවා නම් (ඕහට) සඟවෙසෙස් වේ.

7. තමන් සඳහා වූද, කරවාදෙන දායකයන් ඇත්තා වූද ලොකු විහාරයක් කරවනු කැමති භික්ෂුව විසින් විහාරබිම දෙසීම සඳහා භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් ද උපද්‍රව රහිතව උපචාර සහිතව විහාර බිම දෙසිය යුත්තේය. යම් භික්ෂුවක් උපද්‍රව සහිතව උපචාර රහිතව ලොකු විහාරයක් කරවන්නේ නම් විහාරවස්තුව දෙසීම පිණිස භික්ෂූහු ද නොකැඳවන ලද්දාහු නම් (ඕහට) සංඝාදිසේසා 'පත්තිය වේ.

8. යම් භික්ෂුවක් කිපියේ, නොසතුටු වූයේ, අනුන් විනාශ කරන සිත් ඇත්තේ අනිත් මහණකු සස්නෙන් නෙරපා දමන්නෙම් නම් යෙහෙකැයි (සිතා) අමූලිකවූ පරිජි ඇවතකින් චෝදනා කරයි. ඉක්බිති පසුකලෙක කිසිවකු විසින් විනිශ්චය කරනු ලැබුව ද නො ලැබුව ද, ඒ චෝදනාව හේතු රහිත වූවක් වෙයි නම්, චෝදක භික්ෂුව ම දෝෂයෙහි පිහිටා නම් (ඕහට) සඟවෙසෙස් ඇවැත් වේ.

9. යම් භික්ෂුවක් කිපියේ, නො සතුටු වූයේ අනුන් විනාශ කරන සිත් ඇත්තේ, අනිත් මහණකු සස්නෙන් පහකරන්නෙම් නම් යෙහෙකැ'යි (සිතා) තිරිසන් ආදී සතකු පිළිබඳ වූ ආපත්තියට හේතුවන කාරණයක් ආරෝපනය කොට පරිජි ඇවතකින් චෝදනා කරයි. ඉක්බිති පසු කලෙක කිසිවකු විසින් විනිශ්චය කරනු ලැබුව ද නො ලැබුව ද ඒ චෝදනාව තිරිසනුන් පිළිබඳ වූවක් බවත්, ආරෝපිත වූවක් බවත් පැහැදිලි වේ නම් චෝදක භික්ෂුව ම වරදෙහි පිහිටා නම් (ඕහට) සංඝාදිසේසා'පත්තිය වේ.

10. යම් භික්ෂුවක් සමගි සංඝයාගේ භේදය පිණිස උත්සාහ කරයි ද, භේදය පිණිස පවත්නා කාරණයක් හෝ දැඩිව ගෙන සිටියි ද, ඒ භික්ෂුවට සෙසු භික්ෂූන් විසින් මෙසේ මෙසේ කිය යුත්තේ ය. "ඇවැත්නි, සමගි සංඝයාගේ භේදය පිණිස උත්සාහ

Non-commercial distribution

නොකරව. භේදය පිණිස පවත්නා කාරණයක් හෝ දැඩිව ගෙන නොසිටුව, ඇවැත්නි, පියවි සංඝයා සමග එක්වනු මැනව. සමගි සංඝයා ප්‍රීතිමත්‍ය, අවිවාදය, සමාන පාමොක් උදෙසීම් ඇත්තේය, සුවසේ වාසය කරන්නේ ද එහෙයිනි. මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරනු ලබන්නා වූ යථෝක්ත භික්ෂුව පෙර සේ ම දැඩිව සිටී නම් ඒ දෘෂ්ටිය දුරුකරනු සඳහා පියවි භික්ෂූන් විසින් තෙවරක් ම අවවාද දිය යුත්තේ ය. ඉදින් තෙවැනි වරටත් හික්මවනු ලබන ඒ භික්ෂුව සිය අදහස් හළේ නම් මැනවි. නො හළේ නම් (ඕහට) සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

11. සංඝභේදයට උත්සාහ කරන භික්ෂුවට පක්ෂ වූ භේදකරන්නා වූ භික්ෂුවක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ ඇතැ'යි (සිතමු). ඒ භික්ෂූහු ද මෙසේ පවසත්. "ඇවැත්නි යථෝක්ත භික්ෂුවට කිසිවක් නොකියවු. ඔහු විනයවාදිය, ධර්මවාදිය. අපගේ කැමැත්ත ද රුචිය ද ඔහු දනී. (එසේම) කියයි. ඒ අනුවද ක්‍රියාකරයි. අපගේ අදහස ද එය ම ය" කියයි. පියවි භික්ෂූන් විසින් ඒ භික්ෂූන්ට ද මෙසේ කියයුත්තාහු වෙති. "ඇවැත්නි, එසේ නොකියවු. යථෝක්ත මහණ අධර්මවාදිය, අවිනයවාදිය. ඔබ හැමද සංඝභේදය රුචි නොකරනු මැනව. පියවි සංඝයා සමග එක්වනු මැනව. සමගි සංඝතෙමේ ප්‍රීතිමත්‍ය. අවිවාදය. සමාන පාමොක් උදෙසීම් ඇත්තේය. සුවසේ වාසය කරන්නේ ද එහෙයිනි. මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරනු ලබන්නාවූ ඒ භික්ෂූහු පෙර සේ ම දැඩිව සිටිත් නම්, ඒ දෘෂ්ටිය දුරු කරනු සඳහා තෙවරක් ම අවවාද දියයුත්තාහ. ඉදින් තෙවන වරටත් හික්මවනු ලබන්නා වූ ඒ භික්ෂූහු සිය අදහස් හළේ නම් මැනවි. නොහළේ නම් සඞ්ඝාදිසෙස් ඇවැත් වේ.

12. යම්කිසි භික්ෂුවක් අකීකරු වෙයි. සෙසු භික්ෂූන් විසින් ප්‍රාතිමෝක්ෂයෙහි ඇතුළත් ශික්ෂා පදයන්හි පිහිටා අවවාද කරනු ලබන කල්හි ද ඔහු (තමා) අවවාද නොකටයුත්තෙකැ'යි කියයි. "ඇවැත්නි, ඔබවහන්සේ හොඳක් හෝ නරකක් හෝ මට නොකියනු මැනවි. මම ද ඔබවහන්සේට හොඳක් හෝ නරකක් නොකියමි. එහෙයින් මට අනුශාසනා නොකරවු" යයි තමා

Non-commercial distribution

අනුශාසනා නොකටයුත්තකු කොට සලකයි. මෙබඳු භික්ෂුවට සෙසු භික්ෂූන් විසින් මෙසේ කිය යුතුය. "ඇවැත්නි, තමා නො කියයුත්තකු කොට නොසලකනු මැනව. හුදෙක් කිය යුත්තකු කොට ම සලකනු මැනව. ඔබ ද භික්ෂූන්ට විනයානුකූලව කියන්න. සෙසු භික්ෂූහු ද ඔබට විනයානුකූලව කියති. එය එසේම විය යුතුය. මක්නිසාද ඔවුනොවුන්ගේ අනුශාසනාවෙන්, ඔවුනොවුන් ඇවතින් නඟා සිටුවීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිස වැඩෙන්නේ ද, එහෙයිනි. මෙසේ පියවි භික්ෂූන් විසින් අවවාද කරනු ලබන කල්හි ද ඒ භික්ෂුව පෙර සේ ම දැඩිව සිටීනම්, ඒ දෘෂ්ටිය දුරු කරනු සඳහා තෙවරක්ම අවවාද දිය යුත්තේය. ඉදින් තෙවන වරටත් හික්මවනු ලබන්නේ සිය අදහස හළේ නම් මැනවි. නොහළේ නම් (ඕහට) සංඝාදිසේසාපත්තිය වේ.

13. යම් භික්ෂුවක් දායකයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරමින් පහත් පැවතුම් ඇතිව යම් කුලයක් හෝ ගමක් ඇසුරු කොට වාසය කෙරේ. ඔහුගේ ලාමක හැසිරීම් හා එයින් දූෂිත වූ කුල ද දකින්නටත් අසන්නටත් ලැබේ. (එසේ ඇති කල්හි) පියවි භික්ෂූන් විසින් ඒ භික්ෂුවට මෙසේ කිය යුතු වෙයි. "ඔබ වනාහි දායකයන්ගේ ශ්‍රද්ධාව දූෂණය කරන්නෙකි. ලාමක හැසිරීම් ඇත්තෙකි. ඔබගේ ලාමක පැවතුම් හා එයින් දූෂිත වූ කුල ද දකින්නටත් අසන්නටත් ලැබේ. එබැවින් මෙහි සිටීමෙන් වැඩක් නැත. මේ ආරාමයෙන් ඉවත්ව යව'යි කියායි. මෙසේ දන්වනු ලැබූ ඒ භික්ෂුව "මෙබඳුම ආපත්තියක් මුල්කොට සමහර අය (ආරාමයෙන්) බැහැර කරති. සමහර අය බැහැර නො කරති. මේ භික්ෂූහු ඡන්දයෙන් අගතියට ගියහ. ද්වේෂයෙන්, භයෙන් හා මෝහයෙන් අගතියට ගියහ'යි කියා නම්, පියවි භික්ෂූන් විසින් යළිත් ඕහට මෙසේ කියයුතු වෙයි. "මේ භික්ෂූහු ඡන්දයෙන් අගතියට නො ගියහ. ද්වේෂයෙන් භයෙන් හා මෝහයෙන් අගතියට නො ගියහ. ඔබ වනාහි කුලදූෂණය කරන්නෙකි. ලාමක හැසිරීම් ඇත්තෙකි. ඔබගේ ලාමක පැවතුම් හා එයින් දූෂිත කුල ද දකින්නටත් අසන්නටත් ලැබේ. (එබැවින්) මෙහි සිටීමෙන් වැඩක් නැත. මේ ආරාමයෙන් ඉවත්ව යව'යි කියායි. භික්ෂූන් විසින් මෙසේ කියනු ලබද්දීත් පෙර සේ ම සිටී නම් නැවත තෙවරක් දක්වා දැන්විය යුතුයි.

Non-commercial distribution

තුන්වැනි වර භික්මවනු ලබන්නේ සිය ලාමක හැසිරීම් අත්හලේ නම් මැනවි. නොහළේ නම් (ඕහට) සඟවෙසෙස් ඇවැත් වේ.

ඇවැත්නි, තෙළෙස් සඟවෙසෙස් ඇවැත් උදෙසන ලදී. (ඔවුන් අතුරෙන්) ශික්ෂාව ඉක්මවූ කෙණෙහි ම ඇවතට පැමිණෙන සඟවෙසෙස් නවයකි, තෙවැනිවර අවවාදයෙන් පැමිණෙන සඟවෙසෙස් සතරකි. භික්ෂුවක් කිසියම් ඇවැතකට පැමිණ යම් දින ගණනක් සඟවාගෙන සිටී ද, එපමණ දවස් ඒ භික්ෂුව විසින් නොකැමැත්තෙන් වුවද පිරිවෙස්[14] විසිය යුතුය. විසූ පිරිවෙස් ඇති මහණ විසින් රෑ සයක් භික්ෂූන්ට බුහුමන් සඳහා මානත්[15] පිළිපැදිය යුතුය. මානත් පිරීමෙන් අනතුරුව විසිනමකින් සම්පූර්ණ වූ සීමාවෙක්හි (පියවි භික්ෂුවක් වශයෙන්) සංඝයාට ඇතුළත් විය යුතුය. එයින් එකනමකින් හෝ අඩු වූ මහා සංඝතෙමේ එබඳු භික්ෂුවක් සංඝයාට ඇතුළත් කර ගනී නම් ඔහු ඇතුළත් නො වූයේ ම වේ. සීමාවෙහි වූ භික්ෂූහු නින්දා ලැබිය යුත්තාහු වෙති. මේ සඟවෙසෙස් ඇවතින් නැගී සිටීමේ පිළිවෙතයි.

මේ සංඝාදිසේසා'පත්තීන්හි ලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසුදුද? දෙවැනි වරද විචාරමි. කෙසේද? පිරිසුදුද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදුද? මේ තෙළෙස් සඟවෙසෙස්හි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවාහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම්ද, එහෙයිනි.

**තෙවැනි සංඝාදිසේස උද්දේසයයි.**

ඇවැත්නි අනතුරුව ද්විවිධ අනියතා'පත්ති[16] උදෙසනු ලැබේ.

1. යම් භික්ෂුවක් භිත්ති ආදියෙන් මුවහ වූ, මෛථුන සේවනයට සුදුසු වූ, රහසිගත වූ තැනක හුදකලා වූ ස්ත්‍රියක සමග හිඳියි. ඇදහිය යුතු වදන් ඇති උවැසියක්[17] එය දැක පරිජි, සඟ වෙසෙස්, පචිති යන තුන් ආපත්තීන් අතුරෙන් යම්කිසි ඇවතකින් චෝදනා කරයි. භික්ෂුව තමා හුන්බව ප්‍රතිඥාකරන්නේ නම්, යථෝක්ත ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන් උවැසිය චෝදනා කරන්නේ යම් ඇවතකින් ද එයින් ආරෝපනය කටයුත්තේය. මේ ආපත්තිය භික්ෂුවගේ ප්‍රතිඥාවෙන් කළ යුතු බැවින් අනියත නම් වේ.

Non-commercial distribution

2. ආසනය භිත්ති ආදියෙන් මුවහ නො වූවක් වෙයි. මෛථුන සේවනයට ද නුසුදුසුය. එහෙත් ස්ත්‍රියක හා අසභ්‍ය ව්‍යවහාරයෙන් කථා කිරීමට ප්‍රමාණය. යම් භික්ෂුවක් හුදකලා වූ ස්ත්‍රියක සමග එබඳු ආසනයක හිඳියි. ඇදහිය යුතු වචන ඇති උවැසියක් එය දැක සඟ වෙසෙසින් හෝ පචිතියෙන් හෝ චෝදනා කරයි. භික්ෂුව තමා හුන් බව ප්‍රතිඥා කරන්නේ නම්, ඒ ද්විවිධ ආපත්තීන් අතුරෙන් උවැසිය චෝදනා කරන්නේ යම් ආපත්තියකින් නම් එයින් ආරෝපනය කළයුතු වෙයි. මේ ආපත්තිය ද භික්ෂුවගේ ප්‍රතිඥාවෙන් කළයුතු හෙයින් අනියත නම් වේ.

**ඇවැත්නි, අනියත ඇවැත් උදෙසන ලදී. මේ අනියතා'පත්තීන්හි ලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසුදුද? දෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදුද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදුද? මේ ද්විවිධ අනියතා'පත්තියෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම්ද, එහෙයිනි.**

**සිව්වැනි අනියත උද්දේසයයි.**

**ඇවැත්නි, අනතුරුව මේ තිස් නිසඟි පචිති[18] ඇවැත් උදෙසනු ලැබේ.**

1. සිවුරක් කොට නිමි කල්හි ද කඨින සිවුර උද්ධරණය[19] වූ කල්හි ද භික්ෂුව විසින් දසදිනක් තුළ අතිරේක සිවුරක් දැරිය හැකිය. එය ඉක්මවන්නාහට නිසඟි පචිති වේ.

2. සිවුරක් කොට නිමි කල්හි ද කඨින සිවුර උද්ධරණය වූ කල්හි ද සංඝයාගේ නියමයක් නැතිව තුන් සිවුරෙන් වෙන්ව එක රැයකුදු ගතකරන්නේ නම් ඕහට නිසඟි පචිති වේ.

3. සිවුරක් කොට නිමි කල්හි ද කඨින සිවුර උද්ධරණය වූ කල්හි ද භික්ෂුවකට නො කල් චීවරයක්[20] ලැබේ. ඉදින් කැමති නම් භික්ෂුව විසින් පිළිගත හැකිය. පිළිගෙන එයින් වහා සිවුරක් කරවිය යුතුය. සිවුරකට ද නොසෑහේ නම් අඩුව සම්පූර්ණකර ගැනීම සඳහා බලාපොරොත්තු සහිතව (නො ඉටා) මාසයක් තැන්පත් කර ගත හැකිය. බලාපොරොත්තුව ඇතත් මාසයකින් මත්තෙහි තබා ගන්නා හට නිසඟි පචිති වේ.

Non-commercial distribution

4. යම් භික්ෂුවක් නොනෑ වූ භික්ෂුණියක ලවා පරණ සිවුරක් සෝදා නම්, පඬුපොවා නම්, අපුල්ලා නම්, (ඕහට) නිසඟි පචිති වේ.

5. යම් භික්ෂුවක් නොනෑ වූ භික්ෂුණියක අතින් (සුළු දෙයකට) හෝ මාරුකර ගැනීමක් නැතිව සිවුරක් ගනී නම් (ඕහට) නිසඟි පචිති වේ.

6. යම් භික්ෂුවක් නොනෑ වූ ගෘහපතියකු හෝ ගෘහණියක අතින් සොරුන් විසින් පැහැර ගත් කල්හි හෝ දිරාගොස් විනාශ වූ කල්හි හැර නොකල්හි සිවුරක් ඉල්ලාගනී ද ඕහට නිසඟි පචිති වේ.

7. නොනෑ වූ ගෘහපතියෙක් හෝ ගෘහණියක් බොහෝ සිවුරු වලින් භික්ෂුවක් පුදයි. ඒ භික්ෂුව විසින් අඳනය හා පොරෝනය පමණක් ඉවසිය හැකිය. ඉන් වැඩියත් සිවුරු පිළිගනී නම් ඕහට නිසඟි පචිති වේ.

8. නොනෑ වූ ගෘහපතියකු විසින් හෝ ගෘහණියක විසින් මේ මුදලින් සිවුරක් මිලදී ගෙන අසවල් භික්ෂුවට දෙන්නෙමි'යි භික්ෂුවක් උදෙසා සිවුරු මුදලක් එකතු කරන ලද්දේ වෙයි. ඒ භික්ෂුව (දායක දායිකාවන් විසින්) සිවුර පැවරීමටත් පළමුව ඔවුන් කරාගොස් ඒ මුදලින් මෙබඳු සිවුරක් මිලට ගෙන පුදව'යි හොඳ සිවුරක් බලාපොරොත්තුවෙන් එහි ලා විධාන කරයි ද එබඳු විධානයකින් සිවුරක් ලබන භික්ෂුවට නිසඟි පචිති වේ.

9. නොනෑ වූ ගෘහපතියන් දෙදෙනකු හෝ ගෘහණියන් දෙදෙනකු විසින් මේ මුදලින් සිවුරක් මිලට ගෙන අසවල් භික්ෂුවට පුදන්නෙමු'යි යම් භික්ෂුවක උදෙසා වෙන වෙන සිවුරු මුදල් එකතු කරන ලද්දේ වෙයි. ඒ භික්ෂුව ද (දායක දායිකාවන් විසින්) සිවුර පැවරීමටත් පළමුව ඔවුන් කරාගොස් ඒ වෙන වෙන එකතු කළ මුදලින් මෙබඳු සිවුරක් මිලට ගෙන පුදව'යි හොඳ සිවුරක් බලාපොරොත්තුවෙන් එහි ලා විධාන කරයි ද, එබඳු විධානයකින් සිවුරක් ලබන භික්ෂුවට නිසඟි පචිති වේ.

Non-commercial distribution

10. රජ, රජඇමති, බමුණු, ගොවි යනාදි මොවුන්ගෙන් කෙනෙක් මේ මුදලින් සිවුරක් මිල දී ගෙන අසවල් භික්ෂුවට දෙවයි කියා දූතයකු අත සිවුරු මිලක් එවති. දූතයා ද භික්ෂූන් වෙත අවුත්, 'වහන්ස! ඔබ උදෙසා මේ සිවුරු මිලය ගෙනෙන ලදී. මෙය පිළිගනු මැනවැ'යි කියයි.

එවිට ඒ භික්ෂුව විසින් "මිත්‍රය අපි සිවුරු මිල නොපිළිගනිමු. අවශ්‍ය වූ විටෙකදී සිවුරක් පිළිගන්නෙමු'යි කියයුතු වෙයි. ඉදින් ඒ දූතයා ඔබ වහන්සේගේ කිසියම් කැපකරුවකු ඇද්දැයි විචාරණ ලද නම් ආරාමිකයකු හෝ උපාසකයකු මොහු අපගේ කැපකරු යයි දැක්විය යුතුයි.

දූතයා ද ඔහු සිවුරු ගෙනදෙන බවට ගිවිස්වා භික්ෂූන් වෙතද ගොස් 'වහන්ස! ඔබ දැක්වූ කැපකරුවා සිවුරු ගෙනදෙන බවට ගිවිස ගන්නා ලදී. අවශ්‍ය වූ විටෙක එහි යනු මැනව. ඔහු සිවුරු ගෙන දේවි'යි කියයි. සිවුර අවශ්‍ය වූ භික්ෂුව කැපකරු කරා ගොස් (එක්වරකින් නොදේ නම්) දෙතුන් වරක් ඉල්විය යුතුය. එය සිහිකරවිය යුතුය. දෙතුන්වර ඉල්ලද්දීත් සිවුරු සැපයේ නම් මැනවි. නො එසේ නම්, සවෙනි වර දක්වා එහි ගොස් නිශ්ශබ්දව සිටිය යුතුය. මෙසේ සිවුරු උදෙසා සිටින කල්හිත් නො ලැබේ නම්, සත්වැනි වරද වෑයම් කරන්නාට ලැබෙන සිවුර නිසදිය යුත්තේ ය.

(ඉල්වීමෙනුත්, උදෙසා සිටීමෙනුත්), සිවුරු නොලැබූ භික්ෂුව සිවුරු මිල එවූ අයවෙත ගොස් හෝ දූතයකු හෝ යවා, "ඔබ අප උදෙසා එවූ සිවුරු මිලයෙන් වැඩක් නොවීය. එය විනාශ වියනොදී ගෙන්වා ගතයුතු ය"යි දැන්විය යුත්තේ ය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.

**පළමුවන සිවුරු වගයි.**

1. යම් භික්ෂුවක් කෝසෙය්‍ය නූල් මිශ්‍ර කිරීමෙන් එළලොම් ඇතිරියක් කරවන්නේ නම් (ඔහට) නිසඟි පචිති වේ.

2. යම් භික්ෂුවක් හුදු කළු එළලොම් වලින් ඇතිරියක් කරවන්නේ නම් (ඔහට) නිසඟි පචිති වේ.

Non-commercial distribution

3. අළුත් ඇතිරියක් කරවන භික්ෂුව විසින් (ඊට අවශ්‍ය ප්‍රමාණයෙන්) දෙකොටසක් කළු එළු ලොම් ද තුන්වැනි කොටස සුදු එළු ලොම් හා සිව්වැනි කොටස පඬුවන් එළු ලොම් ද ගතයුතුය. මේ නියමය ඉක්මවා අළුත් ඇතිරියක් කරවන්නේ නම් (ඕහට) නිසඟි පචිති වේ.

4. අළුත් ඇතිරියක් කරවූ භික්ෂුව විසින් එය සය අවුරුද්දක් පාවිච්චි කළ යුතුය. ඉදින් ඒ ඇතිරිය කිසිවකුට දී හෝ නොදී හෝ සංඝයා ගේ කැමැත්තක් නැතිව ඉන් මෙපිට නැවත අළුත් ඇතිරියක් කරවන භික්ෂුවට නිසඟි පචිති වේ.

5. හිඳගැනීම සඳහා අළුත් ඇතිරියක් කරවන භික්ෂුව විසින් එය දුර්වර්ණ කිරීම පිණිස පරණ ඇතිරියෙන් සුගත් වියතක් පමණ කොටසක් කපාගත යුතුය. මෙසේ පරණ ඇතිරියෙන් කොටසක් නොයොදා අළුත් ඇතිරියක් කරවන භික්ෂුවට නිසඟි පචිති වේ.

6. මඟට පිළිපන් භික්ෂුවකට එළුලොම් ලැබේ යයි (සිතමු.). කැමති නම් එය පිළිගත හැකිය. ගෙනයාමට කැපකරුවකු ද නැති නම් තුන් යොදුනක් සිය අතින් ම ගෙනගිය හැකිය. කැපකරුවකු නැතිව එය ඉක්මවා සියතින් ම එළුලොම් ගෙනයන භික්ෂුවට නිසඟි පචිති වේ.

7. යම් භික්ෂුවක් නොනෑ වූ භික්ෂුණියක ලවා එළුලොම් සෝදවා නම් සායම් කරවා නම්, හෝ අවුල් හරවා නම් (ඕහට) නිසඟි පචිති වේ.

8. යම් භික්ෂුවක් රන්රිදී ගනී ද, අනිකකු ලවා ගන්වාද, ගෙනැවිත් තබන ලද්දක් හෝ සිතින් ඉවසා ද, (ඕහට) නිසඟි පචිති වේ.

9. යම් භික්ෂුවක් නොයෙක් අයුරෙන් රන් රිදී කහවනු ගනුදෙනු කෙරේ නම් (ඕහට) නිසඟි පචිති වේ.

10. යම් භික්ෂුවක් පා සිවුරු ආදී අනිකුත් දැයින් නොයෙක් ගනුදෙනු කෙරේ නම් (ඕහට) නිසඟි පචිති වේ.

**දෙවැනි එළුලොම් වගයි.**

Non-commercial distribution

1. දසදිනක් තුළ අතිරේක පාත්‍රයක් දැරිය හැකිය. එය ඉක්ම වන්නා වූ භික්ෂුවට නිසඟි පචිති වේ.

2. යම් භික්ෂුවක් පිළියම් පහකින් අඩු පාත්‍රයක් තිබියදී අළුත් පාත්‍රයක් ඉල්වා ගනීනම් ඕහට නිසඟි පචිති වේ. ඒ භික්ෂුව විසින් ඉල්ලාගත් පාත්‍රය භික්ෂූන් හමුවෙහි නිසදිය යුත්තේය. භික්ෂූහු ද තම පිරිසෙහි වූ අන්තිම භික්ෂුවගේ පාත්‍රය දෙමින් 'මෙය බිඳෙන තුරු පාවිච්චි කරනු මැනවැ'යි කිය යුත්තේය. මේ පාත්‍රය නිසදීමේ පිළිවෙතයි.

3. ගිලන් භික්ෂුවක් විසින් අනුභවකටයුතු වූ ගිතෙල්, වෙඬරු, තලතෙල්, මීපැනි, උක්සකුරු යන පස් බෙහෙත් පිළිගෙන සත් දිනක් තුළ සුරක්ෂිතව තබාගෙන අනුභව කළ හැකිය. සත්වැනි දින ඉක්මවන භික්ෂුවට නිසඟි පචිති වේ.

4. ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසය තුළ වැසි සළුව සොයා ගත යුතුය. එම ඍතුවේ ම අන්තිම අඩමස තුළ පටන් එය පාවිච්චි කළ හැකිය. ඉන් මෙපිට වැසිසළුවක් සොයන්නා හට ද පරිභෝග කරන්නා හටද නිසඟි පචිති වේ.

5. යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකට තමා ම සිවුරක් දී පසුව එය නොසතුටු සිත් ඇතිව කුපිතව පැහැරගනී ද අනිකකු ලවා හෝ පැහැරගන්වා ද නිසඟි පචිති වේ.

6. යම් භික්ෂුවක් තමා ම නූල් ඉල්වාගෙන නො නෑ නොපැවරූ, රෙදි වියන්නන් ලවා සිවුරක් වියවාද ඕහට නිසඟිපචිති වේ.

7. නොනෑවූ ගෘහපතියෙක් හෝ ගෘහණියක් යම්කිසි භික්ෂුවක් උදෙසා වියන්නන් ලවා සිවුරක් වියවයි. (දායකයන්) සිවුර පැවරීමටත් පළමුව ඒ භික්ෂුව වියන්නන් කරා ගොස් "මේ සිවුර වියන්නේ මා සඳහාය. එහෙයින් දිගු කරවු, පළල් කරවු, ඝනව නූල් එලා ලවු, නූල් සමසේ එලා ලවු, හොඳින් මැද වියව්, අපි ද තොපට යමක් දෙන්නෙමු'යි එහිලා අධික විධානයට පැමිණියේ යටත්පිරිසෙයින් පිණ්ඩපාත පමණකුත් ඒ සඳහා දුන්නේ නම් නිසඟිපචිති වේ.

Non-commercial distribution

8. වස් පවාරණයට දසදිනක් තබා භික්ෂුවට ඉක්මන් කටයුත්තක් සඳහා පුදන ලද සිවුරක් ලැබෙයි. ඒ බව දත් භික්ෂුව විසින් පිළිගත යුත්තේය. එසේ පිළිගෙන (නො ඉටා) සිවුරු කරන කාලය පැමිණෙන තෙක් තැන්පත් කර ගත හැකිය. ඉන් මත්තෙහිත් තබාගන්නා භික්ෂුවට නිසඟිපචිති වේ.

9. සැක කටයුතු වූ ද භය සහිත වූ ද අරණ්‍ය සේනාසනවල වාසය කරන භික්ෂුව සොරු ආදීන්ගෙන් භය සහිත නම් පෙරවස් වැස ඉල්මස මැදිපෝය දක්වා කාලය තුළ තුන් සිවුරෙන් එකක් ඇතුළුගමෙහි තැබිය හැකිය. මෙබඳු අවස්ථාවක තුන් සිවුරෙන් වෙන්ව සිටිනු කැමති භික්ෂුව විසින් එසේ විසිය යුත්තේ රෑ සයක් පමණි. සංඝයාගේ නියමයක් නැතිව ඉන් මත්තෙහිත් තුන් සිවුරෙන් වෙන්ව වසන භික්ෂුවට නිසඟිපචිති වේ.

10. යම් භික්ෂුවක් සංඝයාට අයත් ලාභය දැන දැන තමාට පිරිනමා ගනීනම් නිසඟිපචිති වේ.

**තුන්වැනි පාත්‍ර වගයි.**

ඇවැත්නි, තිස් නිසඟි පචිති ඇවැත් උදෙසන ලදී. එහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? **මේ තිස්නිසඟි පචිතියෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම් ද එහෙයිනි.**

**නිසඟි පචිති නිමියේය.**

ඇවැත්නි, අනතුරුව මේ දෙයානූවක් පචිති[21] ඇවැත් උදෙසනු ලැබේ.

1. දැන දැන බොරුකීමෙහි පචිති වේ.
2. ජාතිය, කුලය, ආදිය ගටා බිණීමෙහි පචිති වේ.
3. භික්ෂූන් අතර සමගිය බිඳෙන අයුරු කේලාම් කීමෙහි පචිති වේ.

Non-commercial distribution

4. යම් භික්ෂුවක් අනුපසම්පන්නයකු හා පාලිධර්මය පදයෙන් පදය උසුරුවා ද පචිති වේ.

5. යම් භික්ෂුවක් අනුපසම්පන්නයකු හා දෙතුන් රැයකට වඩා එක සෙනසුනක වෙසේ ද පචිති වේ.

6. යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග එක සෙනස්නක වෙසේ නම් පචිති වේ.

7. යම් භික්ෂුවක් නුවණැති මිනිසකු නැතිව හුදකලාව සිටි ස්ත්‍රියකට වචන හතර පහකට වඩා බණ කියා නම් පචිති වේ.

8. යම් භික්ෂුවක් අනුපසම්පන්නයකුට තමා කෙරෙහි වූ උතුරුමිනිස් දම් කියා ද පචිති වේ.

9. යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවක් පිළිබඳ වූ සඟවෙසෙස් ඇවතක් සංඝයාගේ නියමයක් නැතිව අනුපසම්පන්නයකුට කියා නම් පචිති වේ.

10. යම් භික්ෂුවක් නො කැප පොළොව සාරා ද අනිකකු ලවා හෝ සාරවා ද පචිති වේ.

**පළමුවැනි මුසාවාද වගයි.**

1. වැඩෙන ගහ කොල සිඳීමෙන් විනාශ කිරීමෙන් පචිති වේ.

2. සංඝයා අතර විචාළ දෙය හැර අනිකක් කීමෙහි ද, නිශ්ශබ්දව හිඳීමෙන් සංඝයා වෙහෙස කරවීමෙහි ද පචිති වේ.

3. ගැරහීමෙහි, අගුණ කීමෙහි පචිති වේ.

4. යම් භික්ෂුවක් එලිමහන් තැනක තැබූ ඇඳ, පුටු, බිසි, ආදි සඟසතු බඩු නිසිපරිදි තැන්පත් නොකර අනිකකු ලවා හෝ තැන්පත් නො කරවා ආරාමිකයකුට ද නො දන්වා බැහැර ගියේ ද පචිති වේ.

5. යම් භික්ෂුවක් සඟසතු අරමක සයනයක් අතුරා හෝ අතුරවා සිට (නැවත යනු කැමැතිව) එය නො හකුලා නම් අනිකකු ලවා හෝ නොහකුළුවා නම් පචිති වේ.

Non-commercial distribution

6. යම් භික්ෂුවක් සඟසතු අරමකට ගියේ එහි තමාට පළමුව පැමිණි භික්ෂුවකගේ මහළු බව ගිලන් බව ආදි දුර්වල බව දැන දැනත්, මෙයින් මොහුට කරදර වෙයි, ඉවත්ව යන්නේ යයි සලකමින් ඔහු හා ගැටේ ද තල්ලුකර දමා ද එබඳු ගිලන් බවකින් තොරව සයනය පැහැර ගත් ඕහට පචිති වේ.

7. යම් භික්ෂුවක් කිපියේ නො සතුටු සිත් ඇත්තේ වෙනත් භික්ෂුවක සඟසතු අරමකින් බැහැර කරා ද කරවා ද පචිති වේ.

8. යම් භික්ෂුවක් සඟසතු අරමක මතුමහල්තලයෙහි (යන්තමට) විට්ටමකට සවිකළ පා ඇති ඇඳක හෝ පුටුවක පරීක්ෂාවක් නැතිව නිදාගනී නම් හෝ හිඳගනී නම් ඕහට පචිති වේ.

9. ලොකු අරමක් කරවන භික්ෂුව විසින් උළුවස්ස ශක්තිමත්වීම සඳහාත්, ආලෝක සිදුරු වැසීයාම සඳහාත් (නැවත නැවත මැටි) ආලේප කළ යුතු වේ. වහළ ද තණකැරලි එක පිට එක සිටින පරිදි දෙතුන්වරක් සෙවිලිකළ යුතුය. තණ ගැට නැති බිමක පිහිටා එය විධාන කළයුතු වේ. දෙතුන් වරකට වඩා මැටි ගැසීම, වහළ සෙවිලි කිරීම හෝ තණ ගැට නැති බිමක සිට විධානය කළ ද එම භික්ෂුවට පචිති වේ.

10. යම් භික්ෂුවක් දැන දැන ප්‍රාණීන් සහිත ජලය තණ හා මැටි මතුයෙහි ඉසී ද අනුන් ලවා හෝ ඉස්වා ද පචිති වේ.

**දෙවැනි භූතගාම වගයි.**

1. යම් භික්ෂුවක් (භික්ෂූන් විසින්) සම්මත නො කරන ලදුව භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ.

2. යම් භික්ෂුවක් (භික්ෂූන් විසින්) සම්මත කරන ලදුවත් හිරුබට කල්හි භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ.

3. යම් භික්ෂුවක් මෙහෙණවරකට අවුත් නො කල්හි භික්ෂුණීන්ට අවවාද කෙරේ නම් පචිති වේ. භික්ෂුණියක් ගිලන් වූවා නම් එය කාලයයි.

*Non-commercial distribution*

4. යම් භික්ෂුවක් "මේ භික්ෂූහු චීවරාදි ආමිෂ ලාභය කැමැත්තෙන් භික්ෂුණීන්ට අවවාද කරන්නාහු යයි" කියා නම් ඕහට පචිති වේ.

5. යම් භික්ෂුවක් නො නෑ වූ භික්ෂුණියකට සුළුදෙයකින් හෝ මාරුකර ගැනීමක් නැතිව සිවුරක් දෙයි නම් පචිති වේ.

6. යම් භික්ෂුවක් නො නෑ වූ භික්ෂුණියකගේ සිවුරක් ගෙත්තම් කෙරේ නම් හෝ කරවා නම් පචිති වේ.

7. යම් භික්ෂුවක් වාහනයකින් යායුතු තරම් සැක සහිත වූද භය සහිත වූද කාලයක මිස නො කාලයෙක්හි භික්ෂුණියක සමග දීර්ඝ මාර්ගයකට පැමිණියේ යටත්පිරිසෙයින් තමාහුන් ගමින් අනිත් ගමකට හෝ යේ ද පචිති වේ.

8. යම් භික්ෂුවක් ගඟකින් එතරවීම පිණිස ගඟ හරහා යාමකදී හැර උඩුගං බලා හෝ යටිගං බලා යන නැවකට භික්ෂුණියක හා එක්ව නැගේ නම් පචිති වේ.

9. යම් භික්ෂුවක් මුලදී හෝ ගිහියන් විසින් පිළියෙළ කිරීමක් නැතිව හුදෙක් භික්ෂුණියක විසින් පිසන ලද පිණ්ඩපාතය දැන දැන අනුභව කෙරේ නම් පචිති වේ.

10. යම් භික්ෂුවක් භික්ෂුණියක සමග හුදකලාව රහසිගතව හිඳී නම් පචිති වේ.

**තෙවැනි භික්ඛුනෝවාද වගයි.**

1. නොගිලන් භික්ෂුව විසින් ආගන්තුකාදීන් සඳහා ශාලාවක එළවූ දානය[22] එක් දිනක් ම අනුභව කළ යුතුය. ඉන් මත්තෙහි අනුභව කරන්නා හට පචිති වේ.

2. නුසුදුසු කාලයෙහි ගණභෝජනය[23] පිළිගන්නා වූ භික්ෂුවට පචිති වේ. ගිලන් කාලය, සිවුරු දෙන කාලය, සිවුරු කරවන කාලය, දීර්ඝ ගමනකට පිළිපන් කාලය, නැව් නඟින කාලය, බොහෝ භික්ෂූන් රැස්වන කාලය හා භික්ෂූන්ට දන්දෙන කාලය ද ගණ භෝජනයෙහි ලා සුදුසුය.

Non-commercial distribution

3. ගිලන් කාලය, සිවුරු දෙන කාලය, හා සිවුරු කරවන කාලය හැර පරම්පර භෝජනය[24] පිළිගත් භික්ෂුවට පචිති වේ.

4. ගෙදරකට පැමිණි භික්ෂුවකට (ගෙහිමියන් විසින්) කැවුම් හෝ අග්ගලා වලින් හෝ පවරණ ලද නම් එය කැමතිවන ඔහු විසින් දෙතුන් පාත්‍රයක් පුරා පිළිගත හැකිය. ඉන් මත්තෙහි පිළිගන්නාහට පචිති වේ. දෙතුන් පාත්‍රයක් පුරාගත් භික්ෂුව එය ගෙනගොස් භික්ෂූන් සමග බෙදා වැළඳිය යුතුය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.

5. යම් භික්ෂුවක් වැළඳුයේ, භෝජනය ද පවාරණය කරන ලද්දේ[25] විනයානුකූලව ඉතිරි කර නොගත් කෑයුතු හෝ බුදියයුතු දැයක් අනුභව කෙරේ නම් පචිති වේ.

6. යම් භික්ෂුවක් චෝදනා කරන අදහස ඇතිව වැළඳූ භෝජනය ද පවාරණය කළ භික්ෂුවකට ඒ බව දැන දැනත් විනයානුකූලව ඉතිරිකර නොගත් කෑයුතු බුදියයුතු දෙයින් පවරා ද, මෙය අනුභව කරවයි කියාද (ඒ ඇදහූ) භික්ෂුව වැළඳූ කෙණෙහි පචිති වේ.

7. යම් භික්ෂුවක් කෑයුතු බුදියයුතු දැයක් විකාලයෙහි අනුභව කරන්නේ ද පචිති වේ.

8. යම් භික්ෂුවක් සන්නිධි කොට[26] තැබූ කෑයුතු බුදියයුතු දැයක් අනුභව කෙරේ නම් පචිති වේ.

9. නොගිලන් භික්ෂුවක් ගිතෙල්, මී, වෙඬරු, උක්සකුරු, තලතෙල් යන පස් බෙහෙත් ද දියගොඩ මස්, කිරි හා දී ආදි ප්‍රණීත ආහාර ද තමන් සඳහා ඉල්ලාගෙන වළඳා නම් පචිති වේ.

10. යම් භික්ෂුවක් දැහැටි පැන් හැර (කිසිවකු විසින්) නො පිළිගැන් වූ අහරක් වළඳා නම් පචිති වේ.

**සිව්වැනි බොජුන් වගයි.**

*Non-commercial distribution*

1. යම් භික්ෂුවක් නග්නයකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට සිය අතින් කෑයුතු බුදියයුතු දැයක් දේ නම් පචිති වේ.

2. යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකට 'එව ඇවැත්නි, ගමෙහි පිඬු පිණිස හැසිරෙමු'යි කියයි. පිඬු හැසිරීමෙන් පසුව යම් පිණ්ඩාහාරයක් දෙවා හෝ නොදෙවා හෝ (තමන් අනාචාරයක හැසිරෙනු පිණිස) ඇවැත්නි, ඔබ සමග විසීම, කථා කිරීම හෝ කරදරය. හුදකලා වූ මට සැපයයි කියා ඒ භික්ෂුව පලවන්නේ ද ඔහට පචිති වේ.

3. යම් භික්ෂුවක් අඹුසැමියන් දෙදෙනකු ඇති ගෙයක ඇතුලට වැදී හිඳියි ද පචිති වේ.

4. යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග පිළිසන් අසුනෙක්හි රහසිගතව හිඳී නම් පචිති වේ.

5. යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග හුදකලාව රහසිගතව හිඳියි නම් පචිති වේ.

6. යම් භික්ෂුවක් (දායකාදීන් විසින්) නිමන්ත්‍රණය කරන ලදුව හෝ පැවරූ භෝජන ඇතිව ද ආරාමස්ථ භික්ෂුවකට නො දන්වා සිවුරු දෙන කාලයෙහි හා සිවුරු කරන කාලයෙහි හැර අනිත් කාලයෙහි උදේ හෝ සවස හෝ ගමට වැද ගෙවල ඇවිදී ද ඔහට පචිති වේ.

7. නො ගිලන් භික්ෂුව විසින් හාරමාසයක් බෙහෙතින් කරන පැවරීම ඉවසිය හැකිය. හාරමාසයකින් පසුව නැවත කරන පැවරීම හෝ නිත්‍ය පැවරීම හෝ ඉවසිය නො හැකිය. මේ නියමය ඉක්මවා බෙහෙත් ඉවසන නො ගිලන් භික්ෂුවට පචිති වේ.

8. යම් භික්ෂුවක් සුදුසු කරුණකදී හැර යුද පිණිස නික්මුණු සිව්රඟ සෙනඟ බැලීමට යේ ද ඔහට පචිති වේ.

9. යම් භික්ෂුවකට සිව්රඟ සෙනඟ තුළ කිසියම් කටයුත්තක් ඇත්නම් දෙතුන් රැයක් කඳවුර සමග විසිය හැකිය. ඉන් මත්තෙහිත් වසන භික්ෂුවට පචිති වේ.

Non-commercial distribution

10. යුද කඳවුරෙහි දෙතුන් දිනක් වසන භික්ෂුව යුද්ධ කරන තැන, භටයන්ගේ පෙරෙට්ටුව, බළසෙන් නවත්වන තැන් හා බළ ඇණි ද බැලීම සඳහා නො යා යුතුය. යන්නාහට පචිති වේ.

**පස්වැනි අචේලක වගයි.**

1. රහමෙර පීමෙහි පචිති වේ.
2. ඇඟිලිවලින් කිති කැවීමෙහි පචිති වේ.
3. දිය කෙළියෙහි පචිති වේ.
4. ශික්ෂාවන්ට හෝ අවවාද කළවුන්ට ගැරහීමෙහි පචිති වේ.
5. යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවක බියගන්වා නම් පචිති වේ.
6. නො ගිලන් භික්ෂුවක් ගිනිතපිනු කැමතිව පහන් දැල්වීමාදී හේතුවක් නැතිව ගිනි දල්වාද, අනිකකු ලවා දල්වාද පචිති වේ.
7. යම් භික්ෂුවක් ස්නාන කාලය හැර අඩමසක් ඇතුළත නහා නම් පචිති වේ. ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාස එකහමාර හා වස්සාන ඍතුවේ පළමුවැනි මාසය වශයෙන් පැවති දෙමස් පසළොස් දවස ද, දාහගතිය ඇති කාලය, ගිලන් කාලය, දිග් මගකට යායුතු කාලය හා දූවිලි සහිත වාතය ඇති කාලය ද ස්නානය කළයුතු කාලයෝයි.
8. අළුත් සිවුරක් ලැබූ භික්ෂුව විසින් එය දුර්වර්ණ කිරීම පිණිස නිල්පාට හෝ මඩපාට හෝ කළුපාට හෝ ගත යුතුය. මේ වර්ණ ත්‍රයෙන් එක ද වර්ණයක් නොගන්වා අළුත් සිවුරක් පරිභෝග කරන භික්ෂුවට පචිති වේ.
9. යම් භික්ෂුවක් භික්ෂු, භික්ෂුණී, සික්ඛමානා, සාමණේර, සාමණේරීන්ට තමා ම සිවුරක් පවරා පසුව ඒ පැවරීම අවලංගු නො කොට පරිභෝග කෙරේ නම් පචිති වේ.
10. යම් භික්ෂුවක් වෙනත් භික්ෂුවකගේ පාත්‍රයක්, සිවුරක්, නිසීදනයක්, ඉඳිකටු ගුලාවක් හෝ පටියක් යටත් පිරිසෙයින් සිනා පිණිස වුවද සඟවා නම් අනිකකු ලවා හෝ සඟවා නම් පචිති වේ.

**සවැනි සුරාපාන වගයි.**

*Non-commercial distribution*

1. යම් භික්ෂුවක් දැන දැන සතකු දිවි තොර කෙරේ නම් පචිති වේ.

2. යම් භික්ෂුවක් දැන දැන ප්‍රාණීන් සහිත වතුර පරිභෝග කෙරේ නම් පචිති වේ.

3. යම් භික්ෂුවක් විනයානුකූලව සමථය වූ අධිකරණයක් ඒ බව දැන දැන නැවත විනිශ්චය පිණිස අධිකරණයට ගනී ද පචිති වේ.

4. යම් භික්ෂුවක් දැන දැන භික්ෂුවකගේ සඟවෙසෙස් ඇවතක් සඟවාද ඕහට පචිති වේ.

5. යම් භික්ෂුවක් විසිවයසින් අඩු පැවිද්දකු උපසපන් කෙළේ නම් ඔහු ද උපසපන් බවට නො පැමිණේ. සීමාවෙහි භික්ෂූහු ද නින්දා කටයුත්තාහු වෙති. උපාධ්‍යාය භික්ෂුවට පචිති වේ.

6. යම් භික්ෂුවක් දැන දැන හොර වෙළඳකු සමග සාකච්ඡා කොට දීර්සමගකට පිවිසියේ යටත්පිරිසෙයින් ගමකින් අනික් ගමකට හෝ යේ ද ඕහට පචිති වේ.

7. යම් භික්ෂුවක් ස්ත්‍රියක සමග සාකච්ඡා කොට අදන්මගකට පිළිපන්නේ යටත්පිරිසෙයින් ගමකින් අනිත් ගමකට හෝ යේ ද පචිති වේ.

8. යම් භික්ෂුවක් "යම් මේ ධර්ම රැසක් භාග්‍යවතුන් වහන්සේ විසින් අන්තරාය කරයයි වදාරණ ලද නමුත් ඒ ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස නො පවතී, ධර්මය අනුව එය මම දනිමි'යි ද කියා නම්, සෙසු භික්ෂූන් ඔහුට මෙසේ කියයුතු වන්නේය. "ඇවැත්නි, එසේ නොකියව. භාග්‍යවතුන් වහන්සේට අභිභවනය නොකරව. භාග්‍යවතුන් වහන්සේට ගැරහීම සුදුසු නොවෙයි. මක්නිසාද, උන්වහන්සේ එසේ නොවදාරණ ලද්දේ ය. එහෙයිනි. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ යම් මේ ධර්ම කෙනෙක් අන්තරායකරය'යි වදාරණ ලද නම් ඒ ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස පවත්නේ මය." මෙසේ පියවි භික්ෂූන් විසින් කියනු ලබද්දීත්

Non-commercial distribution

යථෝක්ත භික්ෂුව ඒ මතයම ගෙන සිටී නම් තුන්වරක් ම කිය යුතුය. තෙවැනි වර ඒ දෘෂ්ටිය හළේ නම් මැනවි. නො හළේ නම් පචිති වේ.

9. යම් භික්ෂුවක් බුදුරජාණන් වහන්සේට නුගුණ කියන්නා වූ පැමිණි ඇවතට පිළියම් නො කළා වූ ලාමක දෘෂ්ටීන් අත් නොහළා වූ භික්ෂුවක සමග ධර්මාමිෂ සම්භෝගය පවත්වා ද, උපෝෂථාදි සංඝකර්ම කෙරේ ද, එක ගෙහි හෝ ශයනය කෙරේ ද ඕහට පචිති වේ.

10. යම් සාමණේරයෙක් "භාග්‍යවතුන් වහන්සේ යම් මේ ධර්ම රැසක් අන්තරායකරය" යි වදාරණ ලද නමුත් ඒ ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස නො පවතී, ධර්මය අනුව එය මම දනිමි'යි කියා නම් භික්ෂූන් විසින් ඔහුට මෙසේ කියයුතු වන්නේය. "සාමණේරය, එසේ නො කියව. උන්වහන්සේට අභිභවනය නො කරව. භාග්‍යවතුන් වහන්සේට ගැරහීම සුදුසු නොවෙයි. මක්නිසාද, උන් වහන්සේ එසේ නොවදාරණ ලද හෙයිනි. එම්බා සාමණේරය, භාග්‍යවතුන් වහන්සේ යම් මේ ධර්ම කෙනෙක් අන්තරායකරයයි වදාරණ ලද නම් ඒ ධර්මයන් සේවනය කරන්නාහට අන්තරාය පිණිස පවත්නේ මය. මෙසේ භික්ෂූන් විසින් ඔහුට කියනු ලබද්දීත් යථෝක්ත සාමණේර නම ඒ මතයම ගෙන සිටීනම්, නැවත ඒ භික්ෂූන් විසින් අද පටන් තොප ශාස්තෘන් වහන්සේ නොඇදහිය යුත්තේය. දෙතුන් රැයක් වුවද භික්ෂූන් සමග නොවිසිය යුත්තේ ය. එහෙයින් කැමති තැනක යව'යි කියයුතු වන්නේය. යම් භික්ෂුවක් ඒ බව දැන දැනත් නෙරපන ලද එබඳු සාමණේරයකු නළවා ද, උවටැන් කරවා ගනී ද , සම්භෝගය පවත්වා ද, එක ගෙයි ශයනය හෝ කෙරේ ද ඕහට පචිති වේ.

**සත්වැනි සප්පාණක වගයි.**

*Non-commercial distribution*

1. යම් භික්ෂුවක් පියවි භික්ෂුවක විසින් විනයානුකූලව අවවාද කරනු ලබන කල්හි ඇවැත්නි, මම අනිත් ව්‍යක්ත විනයධරයකු අතින් නො විචාරා මේ ශික්ෂාපදයෙහි ලා නොහික්මෙන්නෙමි'යි කියා නම් පචිති වේ. හික්මීම කැමති භික්ෂුව විසින් වස්තු නිදානාදිය දතයුතුය. පිළිවිසිය යුතුය. ප්‍රශ්න කටයුත්තේය. මේ එහි ලා පිළිපැදිය යුතු වතයි.

2. යම් භික්ෂුවක් පාමොක් උදෙසන විට "(ඇවැත්නි,) මේ කුඩා වූද ඉතා කුඩා වූද සිකපද උදෙසීමෙන් කවර වැඩක්ද? හුදෙක් ඒවා කුකුස පිණිසත්, වෙහෙසීම හෝ මනෝවිලේඛය හෙවත් සිත කීරි ගැසීම පිණිසත් පවත්නේ ය, එහෙයිනි"යි කියා නම් සිකපදයන්ට නින්දා කිරීමෙහි පචිති වේ.

3. යම් භික්ෂුවක් අඩමසක් පාසා පාමොක් උසුරුවනු ලබන කල්හිත්, "ඇවැත්නි, මේ විනය කොටස් පෙළෙහි ආයේලු, පෙළට ඇතුළත්ලු, සෑම අඩමසකට වරක් උදෙසාලු, එහෙත් මා දැන ගත්තේ දැන්මය'යි කියා නම්, සීමස්ථ භික්ෂූන් විසින් එබඳු භික්ෂුවක් දෙතුන් වරෙක දක්නා ලද්දේ නම් ඔහට ඒ නොදැනීම පමණකින් නිදහස් වීමක් නොවේ. ඒ භික්ෂුව එම වරදෙහි ලා යම් ඇවතකට පැමිණියේ නම් ඊට සුදුසු දඬුවම් කරවිය යුතුය. එසේම ඇවැත්නි, පාමොක් උදෙසන විට ඔබ අර්ථ වශයෙන් මෙනෙහි නො කරන්නෙහිය. එය ඔබට අලාභයකි. මිනිසත් බව දුලබ යයි ඔහට මෝහාරෝපන කර්මය කරවිය යුත්තේය. නැවතත් මුළාවෙන් දොඩන භික්ෂුවට පචිති වේ.

4. යම් භික්ෂුවක් කුපිතව නො සතුටු සිත් ඇතිව වෙනත් භික්ෂුවකට පහර දේ නම් පචිති වේ.

5. යම් භික්ෂුවක් කුපිතව නො සතුටු සිත් ඇතිව වෙනත් භික්ෂුවකට පහර දීමේ අදහසින් අත් පා ඔසවා ද පචිති වේ.

6. යම් භික්ෂුවක් හේතු රහිත වූ සඟවෙසෙස් ඇවතකින් භික්ෂුවකට චෝදනා කෙරේ නම් පචිති වේ.

Non-commercial distribution

7. යම් භික්ෂුවක් "මොහොතකට හෝ මොහුට කරදරයක් ඇති කරන්නෙමි'යි" සිතා අනිත් කාරණයක් නැතිව ම කුකුස් උපදවා නම් පචිති වේ.

8. යම් භික්ෂුවක් දබර කරන, කෝළාහල කරන, විවාදයට බැසගත් භික්ෂූන්ගේ කථාබස් අසමි'යි සිතා ඔවුන්ගේ කථා ඇසෙන දුර ප්‍රමාණයේ අනිත් කාරණයක් නැතිව ම සිටී නම් පචිති වේ.

9. යම් භික්ෂුවක් අපලෝකනාදි විනය කර්මයන්ට ඡන්දය දී පසුව දොස් කියා ද පචිති වේ.

10. යම් භික්ෂුවක් සංඝයා පිළිබඳ වූ විනිශ්චයක් පැවැත්වෙද්දී ඡන්දය නො දී හුනස්නෙන් නැගී යේ ද ඕහට පචිති ඇවැත් වේ.

11. යම් භික්ෂුවක් සමගි සංඝයා සමග භික්ෂුවකට සිවුරක් දී පසුව සංඝික ලාභය විශ්වාසයන්ට (හිතවතුන්ට) පිරිනමන්නේය'යි දොස් කියා ද පචිති වේ.

12. යම් භික්ෂුවක් දැන දැන සඟසතු දැය පුද්ගලයකුට පවරා ද පචිති වේ.

**අටවැනි සහධම්මික වගයි.**

1. යම් භික්ෂුවක් අභිෂික්ත ක්ෂත්‍රිය රජ කෙනකුගේ යහන්ගබඩාවට වදිනු කැමතිව රජු හා දේවිය පිටතට නොනික්මි කල්හි කලින් කරන ලද දැන්වීමක් ද නැතිව එළිපත ඉක්මවා ද පචිති වේ.

2. යම් භික්ෂුවක් රුවන් හෝ රුවන් යයි සම්මත වූ දැයක් ආරාමය හෝ ආවාසය තුළදී හැර ඔසවා ගනී ද, අනිකකු ලවා හෝ ගන්වා ද පචිති වේ. මෙය අයිතිකරු ගෙනයේවා'යි සිතා එවැනි දෙයක් ආරාමය හෝ ආවාසය තුළදී ඔසවා හෝ අනුන් ලවා ඔසවවා හෝ තැබිය හැකිය. මේ ඒ පිළිබඳ පිළිවෙතයි.

3. යම් භික්ෂුවක් අවශ්‍ය ඉක්මන් කටයුත්තකදී හැර (ආරාමස්ථ) භික්ෂුවකට නොදන්වා නොකල්හි ගම් වදී නම් පචිති වේ.

4. යම් භික්ෂුවක් මාළු ආදී ඇටයකින් හෝ ඇත් දළයකින් හෝ මුව ආදී අඟකින් හෝ ඉදිකටු ගුලාවක් කරවා නම් භේදනක පචිති වේ. හෙවත් එය බිඳ දමා දෙසිය යුතු පචිතිය වේ.

5. අළුත් ඇඳක් හෝ පුටුවක් කරවන භික්ෂුව විසින් යට විට්ටම හැර සුගත් අඟලෙන්[27] අඟල් අටක් පා ඇතිව කරවිය යුතුය. එය ඉක්මවන්නාහට ඡේදනක පචිති වේ. (සිඳ දමා දෙසියයුතු පචිතිය වේ.)

6. යම් භික්ෂුවක් ඇඳක හෝ පුටුවක පුළුන් ගවසා නම් (කුෂන් කරයි නම්) උද්දාලනක පචිති වේ. (පුළුන් උදුරා දැමීමෙන් පසුව දෙසිය යුතු පචිති වේ.)

7. නිසීදනයක් කරවන භික්ෂුව විසින් ප්‍රමාණලෙස කරවිය යුතුය. මේ එහි ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් දෙවියතකි. පළලින් වියත් එකහමාරකි. දහවලුව වියතකි. එය ඉක්මවන්නා හට ඡේදනක පචිති වේ. (සිඳ දැමීමෙන් පසුව දෙසිය යුතු වූ පචිතිය වේ.)

8. කුෂ්ට රෝගාදියක් වසා අඳින රෙද්දක් කරවන භික්ෂුව විසින් එය ප්‍රමාණ ලෙස කරවිය යුතුය. දිගින් සුගත් වියකින් වියත් සතරක් හා පළලින් වියත් දෙකක් විය යුතුය. මේ එහි ප්‍රමාණයයි. මෙය ඉක්මවන්නා හට ඡේදනක පචිති වේ. (ඉරා දැමීමෙන් පසුව දෙසිය යුතුවූ පචිතිය වේ.)

9. වැසි සළුවක් කරවන භික්ෂුව විසින් එය ප්‍රමාණ ලෙස කරවිය යුතුය. මේ එහි ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් සයකි. පළලින් දෙවියත් හමාරකි. මේ නියමය ඉක්මවන්නා හට ඡේදනක පචිති වේ. (ඉරා දැමීමෙන් පසුව දෙසිය යුතු පචිතිය වේ.)

10. යම් භික්ෂුවක් සුගත් සිවුර තරම් සිවුරක් හෝ ඊට වඩා ලොකු සිවුරක් හෝ කරවා නම් ඡේදනක පචිති වේ. (ඉරා දැමීමෙන් පසුව දෙසිය යුතු පචිතිය වේ.) මේ සුගතයන් වහන්සේගේ සිවුරේ ප්‍රමාණයයි. දිගින් සුගත් වියතින් වියත් නවයකි. පළලින් වියත් හයකි.

**නවවැනි රත්න වගයි.**

Non-commercial distribution

ඇවැත්නි. මේ දෙයානුවක් පචිති ඇවැත් උදෙසන ලදී, එහිලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? මේ දෙයානුවක් පචිති ඇවැත්හි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දතාව පිරිසුදු බව කොට සළකමි ද, එහෙයිනි.

**පචිති ඇවැත් නිමියේය.**

ඇවැත්නි, අනතුරුව මේ චතුර්විධ පාටිදේසනීය ආපත්ති[28] උදෙසනු ලැබේ.

1. යම් භික්ෂුවක් ඇතුළු ගමට පිවිස නො නෑ වූ භික්ෂුණියකගේ අතින් කෑ යුතු බුදිය යුතු දැයක් සියතින් පිළිගෙන වළඳා නම් එබඳු භික්ෂුව විසින් “ඇවැත්නි, ගැරහිය යුතු වූ යෝග්‍ය නොවූ, නැවත අනුන්ට දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි”යි (භික්ෂූන් හමුවෙහි) ඇවැත් දෙසිය යුතුය.

2. භික්ෂූහු දායක කුලයෙක්හි ආරාධනා ලැබ ගොස් වළඳමින් සිටිති. එහිදී භික්ෂුණියක් මෙහි බත් බෙදව, මෙහි හොදි බෙදව, මෙහි ව්‍යඤ්ජන බෙදව’යි විධාන කරමින් සිටී නම් එහි සිටි භික්ෂූන් විසින් “නැගණිය, භික්ෂූන් වළඳා අවසන් වනතුරු තොප මෙයින් ඉවත්ව යව’යි ඉවත්කළ යුතුය. වළඳමින් සිටි එක ද භික්ෂුවකටවත් ඇය ඉවත් කිරීමට නොවැටහුනි නම් ඒ භික්ෂූන් විසින් “ඇවැත්නි, ගැරහිය යුතු වූ අයෝග්‍ය වූ නැවත අනුන්ට දෙසියයුතු වූ ඇවතකට පැමිණියෙමි’යි (භික්ෂූන් හමුවෙහි) ඇවැත් දෙසිය යුතුය.

3. යම් නො ගිලන් භික්ෂුවක් සේඛ සම්මුතිය[29] ලැබූ ගෙවලට කලින් නො පවරණ ලද්දේ ම එළඹ කෑ යුතු බුදිය යුතු දැයක් සියතින් පිළිගෙන වළඳා නම් ඒ භික්ෂුව විසින් “ඇවැත්නි, ගැරහිය යුතු වූ යෝග්‍ය නොවූ නැවත අනුන්ට දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි’යි භික්ෂූන් හමුවෙහි ඇවැත් දෙසිය යුතුයි.

Non-commercial distribution

4. යම් නො ගිලන් භික්ෂුවක් සැක සහිත වූද භය සහිත වූද අරණ්‍ය සෙනසුන්හි වසමින් කලින් නො හඳුනන කෙනකුගෙන් කෑයුතු බුදිය යුතු දැයක් සියතින් පිළිගෙන වළඳා නම් ඒ භික්ෂුව විසින් "ඇවැත්නි, ගැරහිය යුතු වූ යෝග්‍ය නොවූ නැවත දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි'යි භික්ෂූන් හමුවෙහි ඇවැත් දෙසිය යුතුය.

ඇවැත්නි, මේ පාටිදේසනීය ධර්මයෝ සිව්දෙන උදෙසන ලදහ. එහිලා ඔබ අතින් විචාරමි. කෙසේද? පිරිසිදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද? පිරිසුදු ද? මේ පාටිදේසනීය ආපත්තීන්හි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම්ද, එහෙයිනි.

**පාටිදේසනීය ඇවැත් නිමියේය.**

ඇවැත්නි, අනතුරුව මේ (හික්මියයුතු) සේඛියා සිකපද[30] උදෙසනු ලැබේ.

1. හාත්පසින් වටකොට අඳනය අඳිමි'යි හික්මිය යුතුය.
2. හාත්පසින් වටකොට සිවුර පොරවමි'යි හික්මිය යුතුය.
3. සුපිළිසන්ව ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.
4. සුපිළිසන්ව ඇතුල් ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.
5. සංවර ඇතිව ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.
6. සංවර ඇතිව ඇතුල් ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.
7. පහත හෙළූ ඇස් ඇතිව ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.
8. පහත හෙළූ ඇස් ඇතිව ඇතුල් ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.
9. කැසපට ගන්වා ඇතුල් ගමෙහි නොයමි'යි හික්මිය යුතුය.
10. කැසපට ගන්වා ඇතුල් ගමෙහි නොහිඳිමි'යි හික්මිය යුතුය.

**පළමුවැනි පරිමණ්ඩල වගයි.**

Non-commercial distribution

1. මහ හඬින් සිනාසෙමින් ඇතුල්ගමෙහි නො යෙමි'යි හික්මිය යුතුය.
2. මහ හඬින් සිනාසෙමින් ඇතුල්ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.
3. ශබ්ද නො කොට ඇතුල් ගමෙහි යමි'යි හික්මිය යුතුය.
4. ශබ්ද නො කොට ඇතුල් ගමෙහි හිඳිමි'යි හික්මිය යුතුය.
5. කය සොලවමින් ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
6. කය සොලවමින් ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.
7. අත් සොලවමින් ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
8. අත් සොලවමින් ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.
9. හිස සොලවමින් ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
10. හිස සොලවමින් ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.

**දෙවැනි උජ්ජග්ඝික වගයි.**

1. උකුලෙහි අත තබා ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
2. උකුලෙහි අත තබා ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.
3. හිස වැසුම් ඇතිව ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
4. හිස වැසුම් ඇතිව ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුය.
5. විළුඹ හෝ ඇඟිලි බිම අනිමින් ඇතුල් ගමෙහි නො යමි'යි හික්මිය යුතුය.
6. අතින් හෝ වස්ත්‍රයකින් දනහිස් බැඳගෙන ඇතුල් ගමෙහි නො හිඳිමි'යි හික්මිය යුතුයි.
7. සිහි ඇතිව පිඬු පිළිගනිමි'යි හික්මිය යුතුයි.
8. පාත්‍රය යන හැඟීම ඇතිව පිඬු පිළිගනිමි'යි හික්මිය යුතුයි.

Non-commercial distribution

9. බතින් සතරෙන් කොටසක් ව්‍යඤ්ජන ඇතිව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුයි.

10. පාත්‍රයේ ඇතුල් මුවවිට හා සමව පිඬු පිළිගනිම්'යි හික්මිය යුතුයි.

**තෙවැනි ඛම්භකත වගයි.**

1. සිහි ඇතිව පිඬු වළඳම්'යි හික්මිය යුතුයි.
2. පාත්‍රය යන හැඟීම ඇතිව පිඬු වළඳම්'යි හික්මිය යුතුයි.
3. පාත්‍රයෙහි තම පැත්තෙන් පටන් ගෙන පිඬු වළඳම්'යි හික්මිය යුතුයි.
4. බතට සුදුසු ව්‍යඤ්ජන සහිතව පිඬු වළඳම්'යි හික්මිය යුතුයි.
5. බතේ මුදුනෙන් අනා පිඬු නො වළඳම්'යි හික්මිය යුතුයි.
6. බොහෝ ලබාගනු කැමතිව සූපයක් හෝ ව්‍යඤ්ජනයක් බතින් නො වසම්'යි හික්මිය යුතුයි.
7. නො ගිලන්ව සූපයක් හෝ බතක් හෝ තමන් සඳහා ඉල්ලාගෙන නො වළඳම්'යි හික්මිය යුතුයි.
8. ගරහනු කැමතිව අනුන්ගේ පාත්‍රය දෙස නො බලම්'යි හික්මිය යුතුයි.
9. ඉතා මහත් බත් පිඬු නො කරම්'යි හික්මිය යුතුයි.
10. හාත්පසින් ගුලිකොට බත් පිඬුකරම්'යි හික්මිය යුතුයි.

**සිව්වැනි සක්කච්ච වගයි.**

1. බත් පිඩ මුවට නො ළං වනතුරු මුව නාරිම්'යි හික්මිය යුතුයි.
2. වළඳන අතර සියලු අත මුඛයෙහි නො හෙළම්'යි හික්මිය යුතුයි.
3. මුවතුළ ආහාර ඇතිව කථා නො කරම්'යි හික්මිය යුතුයි.
4. බත්පිඬු මුවතුළට විසිකරමින් නො වළඳම්'යි හික්මිය යුතුයි.

Non-commercial distribution

5. බත්පිඬු කඩ කඩා අනුභව නො කරමි'යි හික්මිය යුතුයි.

6. (වඳුරන් මෙන්) හක්කෙහි බත්පුරවා නො වළඳමි'යි හික්මිය යුතුයි.

7. අත ගසා දමමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

8. බත්හුළු විසුරුවමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

9. (තොලෙන් පිටතට) දිව නෙරවමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

10. චපු, චපු යන ශබ්ද ඇති වන සේ නො වළඳමි'යි හික්මිය යුතුයි.

**පස්වැනි කබල වගයි.**

1. සුරු, සුරු යන ශබ්ද ඇති වනසේ නො වළඳමි'යි හික්මිය යුතුයි.

2. අත ලෙවකමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

3. පාත්‍රය ලෙවකමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

4. දිවෙන් තොල් ලෙවකමින් නො වළඳමි'යි හික්මිය යුතුයි.

5. ඉඳුල් සහිත අතින් පැන් භාජනය නො පිළිගනිමි'යි හික්මිය යුතුයි.

6. බත්හුළු සහිත පාත්‍රය සේදූ ජලය ඇතුල් ගමෙහි හෝ ඇතුල් ගෙයි නො දමමි'යි හික්මිය යුතුයි.

7. කුඩයක් දරා සිටි නො ගිලන් කෙනකුට දහම් නො දෙසමි'යි හික්මිය යුතුයි.

8. සැරයටියක් ගත් නො ගිලන් කෙනකුට දහම් නො දෙසමි'යි හික්මිය යුතුයි.

9. ශස්ත්‍රයක් ගත් නො ගිලන් කෙනකුට දහම් නො දෙසමි'යි හික්මිය යුතුයි.

10. ආයුධයක් ගත් නො ගිලන් කෙනකුට දහම් නො දෙසමි'යි හික්මිය යුතුයි.

**සවැනි සුරු සුරු වගයි.**

*Non-commercial distribution*

1. ලී සෙරෙප්පු පයලූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

2. වහන් පයලූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

3. රථයකට නැගුනා වූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

4. ඇඳක නිදන නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

5. අතින් හෝ වස්ත්‍රයකින් දෙදන බැඳ සිටින නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

6. හිස් වෙළුම් සහිත නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

7. හිසවසා පෙරවි නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

8. තමා බිම හිඳ අසුනක සිටි නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

9. තමා පහත් අසුනක හිඳ උස් අසුනක හුන්නාවූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

10. තමා සිටියේ හුන්නාවූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

11. තමා පසුපස යමින් ඉදිරියෙහි යන්නාවූ නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

12. තමා නො මගින් යමින් නියම මගින් යන නො ගිලන් කෙනකුට දහම් නො දෙසම්'යි හික්මිය යුතුයි.

13. තමා නො ගිලන්ව, සිටගෙන මලමුත්‍ර නො කරම්'යි හික්මිය යුතුයි.

Non-commercial distribution

14. නො ගිලන්ව නිල්තණ බිමක මලමුත්‍ර නො කරම්'යි කෙළ නො ගසම්'යි හික්මිය යුතුයි.

15. නො ගිලන්ව ජලයේ මලමුත්‍ර නො කරම්'යි කෙළ නො ගසම්'යි හික්මිය යුතුයි.

**සත්වැනි පාදුකා වගයි.**

ඇවැත්නි, මේ සේඛියා ඇවැත් උදෙසන ලදී. මෙහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ පන්සැත්තෑ සේඛියා ඇවැත්හි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදුබව කොට සලකම් ද, එහෙයිනි.

**සේඛියා සිකපද නිමියේය.**

ඇවැත්නි, අනතුරුව මේ සප්ත අධිකරණ සමථ ධර්ම උදෙසනු ලැබේ.

උපන් උපන් අධිකරණයන්ගේ සංසිඳීම පිණිස ව්‍යපසමනය කරනු පිණිස i සම්මුඛ විනය,[31] ii සතිවිනය[32] හා iii අමූළ්හ විනය,[33] දිය යුතුය. iv ප්‍රතිඥා[34], v යෙභුය්‍යසිකා[35] vi තස්ස පාපිය්‍යසිකා[36] හා vii තිණවත්ථාරක[37] යන විනය දඬුවම් වලින් සමථය කටයුත්තේය.

ඇවැත්නි, මේ සප්තවිධ අධිකරණ සමථ ධර්මයෝ උදෙසන ලදහ. එහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ සත් අධිකරණ සමථ ධර්මයන්හි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම්ද, එහෙයිනි.

**අධිකරණ සමථ නිමියේය.**

ඇවැත්නි, නිදානය උදෙසන ලදී. එසේ ම සිව්පරිජි ඇවැත්, තෙළෙස් සඟවෙසෙස් ඇවැත්, දෙවැදෑරුම් අනියත ඇවැත්, තිස් නිසඟිපචිති ඇවැත්, දෙයානූවක් පචිති ඇවැත්, සතර පාටිදේසනීය

Non-commercial distribution

ඇවැත්, පන්සැත්තෑවක් හික්මිය යුතු වත්, හා ශප්තවිධ අධිකරණ සමථ ධර්‍ම ද උදෙසන ලදී. මෙතෙක් භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි ආවාවූ එහි ඇතුළත් වූ භාග්‍යවතුන් වහන්සේගේ සිකපද අඩමසක් පාසා උදෙසිය යුතු බවට පැමිණේ. සමගි වූද සතුටු වූද විවාද නො කරන්නා වූද, සියල්ලන් විසින් ඒ ඒ සිකපදයෙහි ලා හික්මිය යුතුයි.

**පස්වැනි විස්තාර උද්දේසයයි.**

**භික්ෂු ප්‍රාතිමෝක්ෂය නිමියේය.**

*Non-commercial distribution*

### සිංහල

# භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය

## නමෝ තස්ස භගවතො අරහතෝ සම්මා සම්බුද්ධස්ස

හැමදීම, පහන් දැල්වීම, පැන් එළවීම හා අසුන් පැනවීම යන මේ කටයුතු පොහොය කිරීම පිළිබඳ "පූර්වකරණ" යයි කියනු ලැබේ.

ඡන්දය හා පිරිසුදු බව ගෙන ඒම, සෘතුකීම, භික්ෂුණීන්ගේ සංඛ්‍යාව හා ඔවුන්ට අවවාද දීම යන මේ කටයුතු පොහොය කිරීම පිළිබඳ "පූර්වකෘත්‍ය" යයි කියනු ලැබේ.

චාතුද්දසී ආදි උපෝසථය, සුත්තුද්දේස උපෝසථයට ප්‍රමාණවත් භික්ෂුණීන් ඇතිබව ඔවුන් සමාන ආපත්තිවලට නොපැමිණි බව හා සීමාවෙන් ඉවත්කළ යුතු කෙනකුන් නැති බව යන සිව්අඟින් යුක්ත නම් එය පොහොය කිරීමට "සුදුසු කාලයයි" කියනු ලැබේ.

පූර්වකරණ, පූර්වකෘත්‍ය නිමවා දෙසන ලද ඇවැත් ඇති සමගි වූ භික්ෂුණී සංඝයාගේ අවසරයෙන් පාමොක් උදෙසීමට ආරාධනය කරමු.

**ආයුෂ්මාවරුනි, භික්ෂුණී සංඝතෙමේ මා කියන්නක් අසාවා. අද පුණුරුසි පොහෝ දවසයි. ඉදින් සංඝයාගේ පොහොය කිරීමට පැමිණි කල් ඇත්තේ වී නම් සංඝ තෙමේ පොහොය කරන්නේය. පාමොක් උදෙසන්නේ ය.**

සංඝයා විසින් කළයුතු වූ පූර්වකෘත්‍ය කොට නිමවන ලදද? (එසේ නම්) ආයුෂ්මාවරුනි, පිරිසුදු බව පළකරවු. පාමොක් උදෙසන්නෙමි. අප සියල්ලෝ ම එක්වන්ව සාවධානව එය අසමු. මෙනෙහි කරමු. යමකුට පැමිණි ආපත්තියක් ඇත්නම් එය ප්‍රකාශ

Non-commercial distribution

කළ යුත්තේය. පැමිණි ආපත්තියක් නැතිකල්හි නිශ්ශබ්ද විය යුතුයි. නිශ්ශබ්ද වීමෙන් ආයුෂ්මත්හු පිරිසුදු වූහ'යි දැනගනිමි. යම් සේ ඔබ වෙන් වෙන්ව විචාළා වූ (මට) එය විසඳීමක් වන්නේ ද, එහෙයිනි.

එසේ ම මෙබඳු පිරිසක තුන්යලක් නැවත නැවත ඇසීමක් වේ. යම් භික්ෂුවක් තුන්වරක් නැවත නැවත අසනු ලබද්දීත් (තමා කෙරෙහි) ඇති ආපත්තිය සිහිකරමින් එය ප්‍රකාශ නො කරයිද, ඕහට සම්පජාන මුසාවාදය වේ. ආයුෂ්මවරුනි, දැන දැන බොරුකීම වූ කලී අන්තරායකර දෙයකැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේය. එහෙයින් පිරිසුදු බව බලාපොරොත්තු වන්නා වූද ආපත්ති සිහිකරන්නා වූද භික්ෂුණිය විසින් පැමිණි ආපත්ති ප්‍රකාශ කළ යුතු වෙයි. එසේ ප්‍රකාශ කිරීම භික්ෂුණියගේ (ධ්‍යානාධිගමය සඳහා) පහසුවන්නේ ද, එහෙයිනි.

ආයුෂ්මවරුනි. නිදානය දක්වන ලදී. එහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ නිදානයෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම්ද, එහෙයිනි.

**පළමුවැනි නිදානෝද්දේසය යි.**

**මේ භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි අට පරිජි ඇවැත් උදෙසනු ලැබේ.**

(1, 2. 3, හා 4 වැනි පරිජි ඇවැත් භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ අයුරුයි.)

5. යම් භික්ෂුණියක් රාගී අදහස් ඇත්තී එබඳු වූ පුරුෂයකු විසින් කරන ගෙලෙන් යට දණින් උඩ සිරුර ඇල්ලීම, පිරිමැදීම, අතින් ගැනීම, ස්පර්ශ කිරීම හා පෙළීම හෝ ඉවසා ද ඇය පරිජි වූවා වෙයි. (පියවි මෙහෙණන් සමග) සහවාසයට නුසුදුසු තැනැත්තියක් ද වේ. මේ උබ්භජාණු මණ්ඩලික නම් පරිජි ඇවතයි.

6. යම් භික්ෂුණියක් වෙනත් භික්ෂුණියක පරිජි ඇවතකට පැමිණි බව දැන දැනත් ඇයට චෝදනා නො කෙරේ, අනිකකුට ද

Non-commercial distribution

නොදන්වයි. ඒ පරිජි අවන් මෙහෙණ ද සිවුරු හරී, නැතහොත් සිවුරෙහි හෝ සිටී. කළුරිය හෝ කෙරේ. එසේත් නැතහොත් තීර්ථකාරාමයකට හෝ යේ ද ඒ බව ද දත්තා වූ යට කී මෙහෙණ "ආයයාවනි, මේ මෙහෙණ මෙබඳු තැනැත්තියක බව මම මුළදීම දනිමි. එහෙත් චෝදනා නො කෙළෙමි, කිසිවකුට ද නො දැන්වීමි'යි කියා නම් පරිජි වූවා වෙයි. (පියවි මෙහෙණන් සමග) සහවාසයට නුසුදුසු තැනැත්තියක් ද වේ. මේ **වජ්ජපටිච්ඡාදික** නම් පරිජි ඇවතයි.

7. යම් භික්ෂුණියක්, සමගි සංඝයා විසින් දැහැමිව, විනයානුකූලව, ශාස්තෘ අනුශාසනය අනුව, උක්ෂේපනීය කර්මයෙන් බැහැර කරන ලද්දා වූ එහෙයින් අනාදර වූ, පිළියම් රහිත වූ, යහළුවන් නැත්තා වූ ද කිසියම් භික්ෂුවක් අනුව පවතීද, අවවාද හෝ පිළිගනීද, පියවි භික්ෂුණීන් විසින් ඒ මෙහෙණට මෙසේ කියයුත්තේය. නැගණියනි, මේ භික්ෂුව සමගි සංඝයා විසින් දැහැමිව, විනයානුකූලව, ශාස්තෘ අනුශාසනය නො ඉක්මවා, නෙරපන ලද්දෙකි. එහෙයින් සංඝකර්මයෙහි අනාදරය, පිළියම් රහිතය, සමාන සංවාසයක් ද නැත්තේය. නැගණියනි, ඔහු අනුව නො යව, අවවාද හෝ නො පිළිගනුව'යි කියායි. මෙසේ කියනු ලබද්දීත් ඒ මෙහෙණ පෙර සේ ම දැඩිව සිටී නම් එය දුරු කිරීම පිණිස තෙවරක් ම කිය යුතුය. තෙවැනි වර දැඩි බව හළේ නම් මැනවි. නො හළේ නම් ඇය පරිජිවූවා වෙයි. (පියවි මෙහෙණන් සමග) සහවාසයට නුසුදුසු තැනැත්තියක් ද වේ. මේ **උක්ඛිත්තානුවත්තක** නම් පරිජි ඇවතයි.

8. යම් භික්ෂුණියක් රාගී අදහස් ඇතිව එබඳු වූ ම පුරුෂයකුගේ i. අත හෝ ii. සිවුරු කෙළවර අල්වාගැනීම ඉවසා ද iii සමීපයෙහි සිටී ද, iv කථා කරයි ද v කලින් සලකුණු කළ තැනකට හෝ යේ ද vi පුරුෂයකුගේ ඊම හෝ බලාපොරොත්තු වේද vii මුවහ වූ තැනකට හෝ වදී ද viii අනාචාරය සේවනය පිණිස කය හෝ පුරුෂයාට එළවා ද ඇය පරිජිවූවා වෙයි. (පියවි මෙහෙණන් සමග) සහවාසයට නුසුදුසු තැනැත්තියක් ද වේ. (වෙන වෙන කරුණු අටකින් පරිජියට පැමිණිය හැකි හෙයින්) මේ **අට්ඨවත්ථුක** නම් පරිජි ඇවතයි.

Non-commercial distribution

ආයයීාවරුනි, අට පරිජි ඇවැත් උදෙසන ලදී. යම් භික්ෂුණියක් මේ පරිජි ඇවැත් අතර යම් යම් පරිජි ඇවතකට පැමිණියේ ද ගිහි කල්හි මෙන් පරිජියට පැමිණීමෙන් පසුවත් පියවි භික්ෂුණීන් සමග සහවාසයක් නො ලබයි. පරිජි වූවා වෙයි. පැවිද්දට නුසුදුසු තැනැත්තියක් ද වේ. මේ පාරාජිකා'පත්තීන්හි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසුදුද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ අටපරිජි ඇවැත්හි ලා ආයයීාවරු පිරිසුදු වූවාහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම් ද එහෙයිනි.

**දෙවැනි පාරාජික උද්දේසයයි.**

**ආයයීාවරුනි, අනතුරුව සතළොස් සඟවෙසෙස් ඇවැත් උදෙසනු ලැබේ.**

1. යම් භික්ෂුණියක් ගැහැවියකු හෝ ඔහු පුතකු සමග දාසයකු කම්කරුවකු යටත් පිරිසෙයින් ශ්‍රමණ පිරිවැජියකු සමග මානී වූවා විවාදයට බැස ගත්තී වේ ද ඇයට පඨමාපත්තික වූද (ඉක්මවූ කෙණෙහි ම ඇවතට පැමිණෙන සුළු) නිස්සාරණීය වූද (භික්ෂුණී සංඝයා කෙරෙන් නෙරපා දැමිය යුතු) සඟවෙසෙස් වේ.

2. යම් භික්ෂුණියක් රජුට හෝ භික්ෂුණී සංඝයාට හෝ නො දන්වා ලෝක සාසනික කටයුතු කරන සේවා සංගමයකට, රාජකීය සේනාවකට හෝ නො දන්වා පෙර පැවිදි වූවක හැර වධයට සුදුසු වූ, එයින් ප්‍රසිද්ධ වූ සොර ස්ත්‍රියක් උපසම්පන්න කෙරේද ඇය පඨමාපත්තික වූද නිස්සාරණීය වූද සඟවෙසෙස් ඇවතට පැමිණියා වේ.

3. යම් භික්ෂුණියක් හුදකලාව අනිත් ගමකට යේ ද, ගඟක් හෝ තරණය කෙරේ ද, රාත්‍රියක් ගත කෙරේ ද, භික්ෂුණීන්ගෙන් තනිව හෝ වෙසේ ද, ඇය පඨමාපත්තික වූද නිස්සාරණීය වූද සඟවෙසෙස් ඇවතට පැමිණියා වේ.

4. යම් භික්ෂුණියක්, සමගි සංඝයා විසින් දැහැමිව, විනයානුකූලව, ශාස්තෲ අනුශාසනය නො ඉක්මවා නෙරපන ලද භික්ෂුණියක ඒ විනය කර්ම කළවුන්ට නො දන්වා ඔවුන්ගේ අදහස් ද නො දැන භික්ෂූණී සංඝයා කෙරෙහි ලා ඇතුළත් කරගනී ද ඇය

Non-commercial distribution

පඨමාපත්තික වූද නිස්සාරණීය වූද සඞ්ඝවෙසෙස් ඇවතට පැමිණියා වේ.

5. යම් භික්ෂුණියක් රාගී අදහස් ඇතිව එබඳු වූ ම පුරුෂයකු අතින් කෑ යුතු බුදිය යුතු දැයක් සියතින් පිළිගෙන වළඳා නම් ඇය පඨමාපත්තික වූද නිස්සාරණීය වූද සඞ්ඝවෙසෙස් ඇවතට පැමිණියා වේ.

6. යම් භික්ෂුණියක් මෙසේ කියයි. "ආයයාවරුනි, මේ පුරුෂයාගේ රාගී අදහස් ඇති බැවින් හෝ නැති බැවින් තොපට වැඩක් නැත. මක්නිසාද? තොප හැම රාගී අදහස් නැත්තවුන් හෙයිනි. එහෙයින් ආයයාවරුනි, කෑයුතු බුදියයුතු දැයක් මොහු තොපට දෙන්නේ නම් සියතින් පිළිගෙන අනුභව කරවු"යි කියායි. ඇය ද පඨමාපත්තික වූද නිස්සාරණීය වූද සඞ්ඝවෙසෙස් ඇවතට පැමිණියා වේ.

(7, 8, 9. වැනි සඞ්ඝවෙසෙස් භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ 5, 8, 9, වැනි සඞ්ඝවෙසෙස් අයුරුයි.)

10. යම් භික්ෂුණියක් කුපිතව නො සතුටු සිත් ඇතිව "මම බුදුන් අත් හරිමි. දහම් හා සඟුන් අත් හරිමි. ශික්‍ෂා අත්හරිමි. කිම ශාක්‍ය දුහිතෘ වූ භික්‍ෂුණීහු පමණක් ම භික්‍ෂුණීහු වෙත් ද? ලජ්ජිනී වූ කුකුස් ඇත්තා වූ ශික්ෂාකාමිනී වූ අන්‍ය භික්‍ෂුණීහුද වෙති. මම ඔවුන් කෙරෙහි පැවිදිව බඹසර හැසිරෙමි'යි කියා ද, ඇයට සෙසු භික්ෂුණීන් විසින් මෙසේ කියයුතු වෙයි. "ආයයාවෙනි, කෝපයෙන් හා නො සතුටින් මෙසේ කථා නො කරව. ශාසනික ප්‍රතිපදාවෙහි සිත් අලවව. නව ලොව්තුරු දහම් සසර දුක් කෙළවර කිරීමට සුදුසු පරිදි වදාරණ ලද්දේ ද එහෙයිනි. බඹසර හැසිරෙව'යි කියායි. මෙසේ කියනු ලබද්දීත් ඒ භික්ෂුණිය තම දෘෂ්ටිය දැඩිව ම ගෙන සිටී නම් එය දුරු කරනු පිණිස තුන්යලක් ම කියයුතු වෙයි. තෙවැනි වර දැඩි බව දුරුකළා නම් මැනවි. නොකළා නම් තෙවැනි වර ඇවතට පැමිණිය හැකි වූ ද, නිස්සාරණීය වූද සඞ්ඝවෙසෙස් ඇවතට පැමිණේ.

11. යම් භික්ෂුණියක් අධිකරණයකින් පරාජිත වූවා නොසතුටු සිත් ඇතිව මෙසේ කියයි. "මේ භික්ෂුණීහු ඡන්දයෙන් අගතියට ගියාහ. ද්වේෂයෙන් මෝහයෙන් හා බියෙන් අගතියට ගියාහ"යි

Non-commercial distribution

කියායි. ඇයට සෙසු භික්ෂුණීන් විසින් "ආයර්‍ය්‍යාවෙනි, එසේ නොකියව"යි දැන්විය යුතුයි. එසේ දන්වනු ලබද්දීත් පෙර සේ ම දැඩිව සිටීනම් එය දුරු කිරීම පිණිස තෙ වරක් ම කියයුතුය. තෙවැනි වර දැඩිබව දුරුකළා නම් මැනවි. නො කළා නම් තෙවැනි වර ඇවතට පැමිණිය හැකි වූද නිස්සාරණීය වූද සඟවෙසෙස් ඇවතට පැමිණේ.

12. යම් භික්ෂුණී පිරිසක් ගිහියන් හා මුසුව, ලාමක හැසිරීම් ඇතිව එයින් ම ප්‍රසිද්ධ වූවාහු භික්ෂුණී සංඝයාට අපහාස ගෙන දේද, ඔවුනොවුන් කුදු මහත් වරද වසා ගනිත් ද සෙසු භික්ෂුණීන් විසින් ඔවුන්ට මෙසේ කියයුතු වෙයි. 'ආයර්‍ය්‍යාවෙනි, තොප ගිහියන් හා මිශ්‍රය. ලාමක හැසිරීම් ඇත්තෙහිය. එයින් ම ප්‍රසිද්ධය. එහෙයින් භික්ෂුණී සංඝයාට අපහාස ගෙන දෙති. වරද වසාගෙන සිටිති. ආයර්‍ය්‍යාවනි, ගිහියන් හා මුසුව වාසය නො කරව. යුෂ්මතුන්ගේ කායචිත්ත විවේකය ම භික්ෂුණී සංඝයා වර්ණනා කරති" කියායි. මෙසේ කියනු ලබද්දීත්, ඒ භික්ෂුණීහු පෙර සේ ම දැඩි බව ගෙන සිටිත් නම් එය දුරු කරනු පිණිස තුන්යලක් ම කියයුතුය. තෙවැනි වර දැඩිබව දුරුකළා නම් මැනවි. නො කළා නම් යාවතතියක වූද නිස්සාරණීය වූද සඟවෙසෙස් ඇවැත් වේ.

13. යම් භික්ෂුණියක් මෙසේ කියයි. "ආයර්‍ය්‍යාවෙනි, තොප මුසුව වාසය කරවු. වෙන්ව නො වසවු. භික්ෂුණී සංඝයා අතර පවිටු හැසිරීම් ඇති, එයින් ප්‍රසිද්ධවූ භික්ෂුණී සංඝයාට අපහාස ගෙන දෙන, එසේ ම ඔවුනොවුන්ගේ වරද සඟවා ගෙන සිටින්නාවූ, අන්‍ය භික්ෂූණීහුද සිටිති. එහෙත් සංඝයා ඔවුන්ට කිසිවක් නො කියති. අවඥා මුඛයෙන් පරිභව මුඛයෙන්, ක්‍රෝධයෙන්, හෝ තොප දුර්වල බැවින් නැතහොත් බියගැන්වීමෙ කැමැත්තෙන් තොපට ම මුසුව වාසය නො කරවු. වෙන්ව වසවු"යයි කියති. පවිටු හැසිරීම් ඇතැ"යිද එයින් ප්‍රසිද්ධයයි ද කියති. භික්ෂුණී සංඝයාට අපහාස ගෙනදෙන බවත්, ඔවුනොවුන් වරද වසා සිටින බව ද කියත්" යනුයි. සෙසු භික්ෂුණීන් විසින් ඇයට එසේ නො කිය යුතු බව දැන්විය යුත්තේය. එසේ කියනු ලබද්දීත් ඒ භික්ෂුණිය පෙර සේ ම දැඩිව සිටී නම් එය දුරුකරනු පිණිස

Non-commercial distribution

තෙවරක් ම දැන්විය යුතුය. තෙවැනි වර ඒ දෘෂ්ටිය දුරුකළා නම් මැනවි. නො කළා නම් තෙවැනි වර ආපත්තියට පැමිණිය හැකිවූ ද නිස්සාරණීය වූ සඟවෙසෙස් ඇවැත් වේ.

**(14, 15, 16, 17 වැනි සඟවෙසෙස් භික්ෂුප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ 10, 11, 12, 13 වැනි සඟවෙසෙස් අයුරුයි.)**

ආයඝාවරුනි, සතළොස් සඟවෙසෙස් ඇවැත් උදෙසන ලදී. එයින් පඨමාපත්තික සඟවෙසෙස් නවයකි. යාවතතියක සඟ-වෙසෙස් අටකි. මේ ආපත්තීන්ගෙන් යම් යම් ඇවතකට පැමිණි භික්ෂුණිය විසින් භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා වෙත පසළොස් දිනක් පක්ෂමානත පිරිය යුතුය. මානත් පිරීමෙන් අනතුරුව විසිනමකින් සම්පූර්ණ වූ භික්ෂුණී සංඝයා ඇති සීමාවෙක්හි (පියවි භික්ෂුණියක වශයෙන්) සංඝයාට ඇතුළත් විය යුතුයි. එක නමකින් හෝ අඩුව මහා සංඝ තෙමේ එවැනි භික්ෂුණියක සංඝයාට ඇතුළත් කර ගනී නම් ඇය ඇතුළත් නො වූවා වෙයි. සීමාවෙහි වූ භික්ෂුණීහු ද නින්දා ලැබිය යුත්තාහු වෙති. මේ සඟවෙසෙස් ඇවතින් නැගී සිටීමේ පිළිවෙතයි.

ආයඝාවරුනි, මේ සඟවෙසෙස් ඇවැත්හි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසුදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? ආයඝාවරු මේ තෙළෙස් සංඝාදිසේසාපත්තීන්හි ලා පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකමි ද, එහෙයිනි.

**තෙවැනි සංඝාදිසේස උද්දේසයයි.**

**ආයඝාවරුනි, අනතුරුව තිස් නිසඟි පචිති ඇවැත් උදෙසනු ලැබේ.**

1. යම් භික්ෂුණියක් අධිෂ්ඨානයට ප්‍රමාණවත් අතිරේක පාත්‍රයක් තබා ගනී නම් නිසඟි පචිති ඇවැත් වේ.

2. යම් භික්ෂුණියක් නො කල්හි ලැබුණු සිවුරක් කාලචීවරයකැ'යි සිතා බෙදවා නම් නිසඟි පචිති වේ.

3. යම් භික්ෂුණියක් වෙනත් භික්ෂුණියක සමග සිවුරකින් සිවුරක් මාරුකරගෙන පසුව ඔබේ සිවුර ඔබ ම ගනුව. මගේ සිවුර මට

Non-commercial distribution

දෙවයි තමා සතු සිවුර ආපසු ගනී නම් අනිකකු ලවා හෝ ගන්වා නම් ඇයට නිසගි පචිති වේ.

4. යම් භික්ෂුණියක් යම්කිසි දෙයක් ඉල්වා (එය නො පොහොනා බැවින්) නැවතත් අනිකකුගෙන් ඉල්ලා නම් නිසගි පචිති වේ.

5. යම් භික්ෂුණියක් අනිකක් හඟවා අනිකක් ගන්නී නම් නිසගි පචිති වේ

6. යම් භික්ෂුණියක් අනිකක් සඳහා පුදන ලද සඟසතු පිරිකරකින් අනිකක් ගනී ද නිසගි පචිති වේ.

7. යම් භික්ෂුණියක් අනිකක් සඳහා පුදන ලද තමා ඉල්වාගත් සඟසතු පිරිකරකින් අනිකක් ඉල්ලා ගනී ද නිසගි පචිති වේ.

8. යම් භික්ෂුණියක් අනිකක් සඳහා පුදන ලද තමා ඉල්ලා ගත් ගණයාට අයිති වූ පිරිකරකින් අනිකක් ඉල්ලා ගනී ද නිසගි පචිති වේ.

9. යම් භික්ෂුණියක් අනිකක් සඳහා පුදන ලද ගණයාට අයත් වූ තමා ඉල්ලා ගත් පිරිකරකින් අනිකක් ගනීද නිසගි පචිති වේ.

10. යම් භික්ෂුණියක් අනිකක් සඳහා පුදන ලද පුද්ගලයකුට අයත්වූ තමා ඉල්ලාගත් පිරිකරකින් අනිකක් ගනීද නිසගි පචිති වේ.

**පළමුවැනි පත්ත වගයි.**

1. ශීත කාලයෙහි පෙරවියයුතු බර පොරෝණයක් ඉල්ලන භික්ෂුණිය විසින් උපරිමය සොළොස් කහවණුවක් වටිනා පොරෝණයක් ඉල්ලිය යුතුය. ඊට වඩා වටිනාකම් ඇති පොරෝණයක් ඉල්ලන භික්ෂුණියට නිසගි පචිති වේ.

2. උෂ්ණ කාලයෙහි පෙරවියයුතු සැහැල්ලු පොරෝණයක් ඉල්ලන භික්ෂුණිය විසින් උපරිමය කහවණු දහයක් වටිනා පොරෝණයක් ඉල්ලිය යුතුය. ඊට වඩා වටිනාකම් ඇති පොරෝණයක් ඉල්ලන භික්ෂුණියට නිසගි පචිති වේ.

(3,4,5,6,7,8,9,10 වැනි නිසගි පචිති භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ අයුරුයි.)

**දෙවැනි චීවර වගයි.**

Non-commercial distribution

(තෙවැනි ජාතරූප වග ද භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ අයුරුයි.)

ආයුෂ්මාවරුනි, තිස් නිසග්ගි පචිති ඇවැත් උදෙසන ලදී. එහි ලා ඔබ අතින් විචාරමි. කෙසේද පිරිසිදු ද? දෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? තෙවැනි වර ද විචාරමි. කෙසේද පිරිසුදු ද? මේ තිස් නිසග්ගි පචිති ඇවැත්හි ලා ආයුෂ්මාවරු පිරිසුදු වූවහුය. නිශ්ශබ්දවීම පිරිසුදු බව කොට සලකම් ද, එහෙයිනි.

**නිසග්ගි පචිති යි.**

ආයුෂ්මාවරුනි, අනතුරුව එක්සිය හැටහයක් (166)ක් පචිති ඇවැත් උදෙසනු ලැබේ.

1. යම් භික්ෂුණියක් ලූනු කා නම් පචිති වේ.
2. යම් භික්ෂුණියක් දෙකිසිලි, යෝනි පෙදෙස වැනි සම්බාධ ස්ථානයන්හි ලෝම උගුළුවා නම් පචිති වේ.
3. යෝනි ප්‍රදේශය (මහනෙල් පෙත්තකින් වුවද) තැලීමෙහි පචිති වේ.
4. මටසිලිටි ලාකඩමය දෙයක් හෝ අන්දෙයක් යෝනි මාර්ගයෙහි යවා නම් පචිති වේ.
5. පස්සාව මාර්ගය ජලයෙන් පිරිසුදු කරනු කැමති භික්ෂුණිය විසින් දෑඟුලක් පමණ ගැඹුරට පිරිසුදු කටයුතුයි. ඒ සීමාව ඉක්මවන භික්ෂුණියට පචිති ඇවැත් වේ.
6. යම් භික්ෂුණියක් දන් වළඳනා භික්ෂුවකට පැන් එලවීමෙන් හෝ පවන් සැලීමෙන් උවටැන් කරන්නී ද පචිති වේ.
7. යම් භික්ෂුණියක් තමා ඉල්ලා හෝ අනුන් ලවා ඉල්ලවා තමා බැඳ හෝ අනිකකු ලවා බැඳවා, කොටා හෝ කොටවා, පිස හෝ පිසවා අමු ධාන්‍යයක් වළඳා නම් පචිති වේ.
8. යම් භික්ෂුණියක් මලමූත්‍ර, කැළිකසල හෝ ඉඳුල් ආදිය භිත්ති ප්‍රාකාරාදියෙන් පිටතට දමා නම් හෝ දමවා නම් පචිති වේ.
9. යම් භික්ෂුණියක් මලමූත්‍ර කැළිකසල හෝ ඉඳුල් ආදිය නිල්වන් තණබිමක දමා නම් හෝ දමවා නම් පචිති වේ.

Non-commercial distribution

10. යම් භික්ෂුණියක් නැටුම්, ගැයුම් හෝ බෙර වැයුම් දැකීම පිණිස යා නම් පචිති වේ

**පළමුවැනි ලසුන වගයි.**

1. යම් භික්ෂුණියක් පහනක් නැති අඳුරු රාත්‍රියක පුරුෂයකු සමග හුදකලාව සිටී ද කථාබස් හෝ කෙරේ ද පචිති වේ.

2. යම් භික්ෂුණියක් භිත්ති ආදියෙන් වැසුණු ආවරණ ස්ථානයෙක්හි පුරුෂයකු සමග හුදකලාව සිටී ද කථාබස් හෝ කෙරේ ද පචිති වේ.

3. යම් භික්ෂුණියක් අභ්‍යාවකාශයෙහි පුරුෂයකු සමග හුදකලාව සිටී ද කථාබස් හෝ කෙරේ ද පචිති වේ.

4. යම් භික්ෂුණියක් මහා වීථියක කුඩා වීථියක හෝ වීථි සන්ධියක පුරුෂයකු සමග හුදකලාව සිටී ද කථාබස් හෝ කෙරේ ද දෙවැනි මෙහෙණක ඉවතට හෝ යවා ද පචිති වේ.

5. යම් භික්ෂුණියක් උදය කාලයේ ගෙවලට ගොස් ගෙහිමියන්ට නො දන්වා නැගී යේ ද පචිති වේ.

6. යම් භික්ෂුණියක් සවස් කාලයේ ගෙවලට ගොස් ගෙහිමියන් නො විචාරා අසුන්හි හිඳගනී ද, සැතපේ ද පචිති වේ.

7. යම් භික්ෂුණියක් සවස් කාලයේ ගෙවලට ගොස් ගෙහිමියන් නො විචාරා යහනක් අතුරා හෝ අතුරුවා හෝ හිඳගනී ද සැතපේ ද පචිති වේ.

8. යම් භික්ෂුණියක් වරදවා ගැනීමෙන් හෝ වරදවා කල්පනා කිරීමෙන් අනිකකු හට ගරහා නම් පචිති වේ.

9. යම් භික්ෂුණියක් තමා හෝ අනිකකු පිළිබඳ ව නිරයෙන් හෝ බඹසරින් (පරදු තබා) දිවුරා නම් පචිති වේ.

10. යම් භික්ෂුණියක් තමාට ම වධ කර ගනිමින් අඬා නම් පචිති වේ.

**දෙවැනි අන්ධකාර වගයි.**

Non-commercial distribution

1. යම් භික්ෂුණියක් නිර්වස්ත්‍රව ස්නානය කෙරේ ද පචිති වේ.
2. නාන කඩයක් කරවන භික්ෂුණිය විසින් එය ප්‍රමාණවත් ලෙස කරවිය යුතුය. මේ එහි ප්‍රමාණයයි. දිගින් සුගත වියතින් වියත් සතරකි. පළලින් වියත් දෙකකි. එය ඉක්මවන්නී ඡේදනක පචිති ඇවැත් වේ.
3. යම් භික්ෂුණියක් වෙනත් භික්ෂුණියක ගේ සිවුරක් ලිහා හෝ ලිහවා පසුව එය හතර පස්දිනක් හැර කරදර ආදියක් නැතිව ම ගෙත්තම් නො කෙරේද? අනුන් ලවා හෝ ගෙත්තම් කිරීමට උත්සාහ නො කෙරේ ද පචිති වේ.
4. යම් භික්ෂුණියක් භික්ෂුණීන්ට අයත් පස් සිවුරු මාරුකර හඳිමින් දින පහක් ඉක්මවා ද පචිති වේ.
5. යම් භික්ෂුණියක් උපසපන් භික්ෂුණියකගේ පස් සිවුරු අතරින් යම් සිවුරක් හිමියන් නො පිළිවිස ගෙන දරා නම් පචිති වේ.
6. යම් භික්ෂුණියක් භික්ෂුණී සංඝයාගේ චීවරලාභයට අන්තරාය කෙරේ නම් පචිති වේ.
7. යම් භික්ෂුණියක් විනයානුකූලව කරන සිවුරු බෙදීම වළක්වා ද පචිති වේ.
8. යම් භික්ෂුණියක් ගිහියකුට පිරිවැජියකුට හෝ පිරිවැජියකට භික්ෂුණීන්ට අයත් සිවුරක් දේ ද පචිති වේ.
9. යම් භික්ෂුණියක් දුර්වල සිවුරක් ලැබීමේ බලාපොරොත්තුවෙන් චීවර කාලය ඉක්මවා ද පචිති වේ.
10. යම් භික්ෂුණියක් විනයානුකූල වූ කඨිනෝද්ධාරය වළකා ද පචිති වේ.

**තෙවැනි නග්න වගයි.**

1. යම් භික්ෂුණීන් දෙදෙනෙක් එක ඇඳක එකට සැතපේ නම් පචිති වේ.
2. යම් භික්ෂුණීන් දෙදෙනෙක් එක ඇතිරියෙහි එක පොරෝණයක් පෙරවගෙන සැතපේ ද පචිති වේ.

Non-commercial distribution

3. යම් භික්ෂුණියක් දැන දැන වෙනත් භික්ෂුණියකට කරදර අපහසු ගෙන දේද පචිති වේ.

4. යම් භික්ෂුණියක් තමන් සමග ජීවත්වන රෝගයකින් දුකට පත් වූ ශිෂ්‍ය භික්ෂුණියකට උවටැන් නො කෙරේ ද, උවටැන් කරවීම පිණිස හෝ උත්සාහවත් නො වේ ද පචිති වේ.

5. යම් භික්ෂුණියක් වෙනත් භික්ෂුණියකට තම ආවාසය දී, පසුව කුපිතව නො සතුටු සිත් ඇතිව එයින් බැහැර කෙරේ ද අනුන් ලවා හෝ බැහැර කරවා ද පචිති වේ.

6. යම් භික්ෂුණියක් කුදුමහත් කටයුතු වලින් ගිහියන් සමග මිශ්‍රව වසන්නී නම් සෙසු භික්ෂුණීන් විසින් ඇයට මෙසේ කියයුතු වෙයි. "ආයෳාවනි, ගිහීන් හා මිශ්‍රව වාසය නො කරව. ගිහි සංසර්ගයෙන් වෙන්ව විවේකීව සිටීම භික්ෂුණී සංඝතෙමේ පසසයි" කියායි. මෙසේ කියනු ලබද්දීත් එකී භික්ෂුණිය සිය ලාමක හැසිරීම් නොහළා නම් එය දුරු කරනු පිණිස තෙවරක් ම කියයුතුය. තෙවැනි වර ලාමක හැසිරීම් දුරුකළා නම් මැනවි. නොකළා නම් පචිති වේ.

7. යම් භික්ෂුණියක් සැකසහිත යයි ප්‍රසිද්ධ වූ බිය සහිත වූ තම රටෙහි යෙහෙළි භික්ෂුණියකගෙන් තොරව හැසිරේ නම් පචිති වේ.

8. යම් භික්ෂුණියක් සැක සහිත යයි ප්‍රසිද්ධ වූ බිය සුළු වූ තම රටින් පිටත යෙහෙළි භික්ෂුණියකගෙන් තොරව හැසිරේ නම් පචිති වේ.

9. යම් භික්ෂුණියක් වස් සමාදන් වූ කාලය තුළ දේශචාරිකාවෙහි යෙදේ ද පචිති වේ.

10. යම් භික්ෂුණියක් වස් පවාරණයෙන් පසුව යටත් පිරිසෙයින් පස් හය යොදුනක් වත් දේශ චාරිකාවෙහි නො යෙදුනී නම් පචිති වේ.

**සිව්වැනි තුවට්ට වගයි.**

*Non-commercial distribution*

1. යම් භික්ෂුණියක් රජුන්ගේ ක්‍රීඩා ශාලාවකට, චිත්‍රාගාරයකට, ආරාමයකට, උයනකට හෝ පොකුණකට බැලීම සඳහා යේ ද පචිති වේ.

2. යම් භික්ෂුණියක් ප්‍රමාණය ඉක්මවා කරන ලද ඇඳක් පුටුවක් හෝ ඇත් අස් රූ සටහන් යොදා කළ පළඟක් හෝ පරිභෝග කෙරේ ද පචිති වේ.

3. යම් භික්ෂුණියක් නූල් කටී නම් පචිති වේ.

4. යම් භික්ෂුණියක් ගිහියන්ට වතාවත් කෙරේ නම් පචිති වේ.

5. යම් භික්ෂුණියක් "ආයෳීාවරුනි, මෙහි එව. මේ අධිකරණය විසඳව"යි කියනු ලබද්දීත් මැනවැ'යි පිළිගෙන පසුව කිසියම් කරදර ආදියක් නැත්තේ ම එය නොවිසඳයි ද අනුන් ලවා හෝ විසඳීමට උත්සාහ නො කෙරේ ද පචිති වේ.

6. යම් භික්ෂුණියක් ගිහියකුට පිරිවැජියකුට හෝ පිරිවැජියකට කෑ යුතු බුදිය යුතු දැයක් සියතින් දේ ද පචිති වේ.

7. යම් භික්ෂුණියක් ඔසප් කාලයෙහි පරිභෝග කටයුතු වූ සිවුර අත් නො හැර (සතරවැනි දින ද) පරිභෝග කෙරේ නම් පචිති වේ.

8. යම් භික්ෂුණියක් දොරකවුළු ඇති ආවාසය, ආරක්ෂා පිණිස අනිකකුට පාවා නො දී දේශ චාරිකාවෙහි යෙදුනි නම් පචිති වේ.

9. යම් භික්ෂුණියක් හස්ත ශිල්පාදී ලෞකික වූ තිරශ්චීන විද්‍යාවක් තමා ප්‍රගුණ කෙරේ නම් පචිති වේ.

10. යම් භික්ෂුණියක් හස්ත ශිල්පාදී ලෞකික වූ තිරශ්චීන විද්‍යාවක් අනුන්ට ප්‍රගුණ කෙරේ නම් පචිති වේ.

**පස්වැනි චිත්තාගාර වගයි.**

1. යම් භික්ෂුණියක් දැන දැන භික්ෂූන් ඇති අරමකට නො පිළිවිස පිවිසියේ ද පචිති වේ.

2. යම් භික්ෂුණියක් භික්ෂුවකට ආක්‍රෝශ පරිභව කෙරේ ද පචිති වේ.

Non-commercial distribution

3. යම් භික්ෂුණියක් කුපිතව භික්ෂුණී සංඝයාට පරිභව කෙරේ ද පචිති වේ.

4. යම් භික්ෂුණියක් ආරාධනා ලැබ හෝ පවාරණය කරන ලදුව වැළඳිය යුතු දැයක් වළඳා ද පචිති වේ.

5. යම් භික්ෂුණියක් කුලයන් (දායකයන්) පිළිබඳ මසුරු බව ඇත්තී ද පචිති වේ.

6. යම් භික්ෂුණියක් භික්ෂූන් වසන අරමකට ළං නො වූ ආවාසයක වස් එළඹියා නම් පචිති වේ.

7. යම් භික්ෂුණියක් වස් වැස උභතෝ සංඝයා කෙරෙහි දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැකයෙන් යන තුන් කරුණෙන් පවාරණය නො කෙරේ ද පචිති වේ.

8. යම් භික්ෂුණියක් ගරුධර්ම[38] ඇසීම පිණිස හෝ පොහොය කිරීමාදී විනයකර්ම කිරීම පිණිස නො යේ ද පචිති වේ.

9. අඩමසක් පාසා භික්ෂුණිය විසින් ගරුධර්ම ඇසීම හා පොහොය විචාරීම භික්ෂු සංඝයාගෙන් බලාපොරොත්තු විය යුතුයි. එය ඉක්මවන භික්ෂුණියට පචිති වේ.

10. යම් භික්ෂුණියක් ප්‍රසඛ (නාභියෙන් යට දණ මඩලෙන් උඩ) පෙදෙසෙහි හටගත් ගඩුවක් හෝ වණයක්, සංඝයාට හෝ ගණයාට හෝ නො දන්වා පුරුෂයකු සමග ඔවුනොවුන් බිඳවා ද, සෝදා ද, බෙහෙත් ගල්වා ද, බඳී ද ලිහා හෝ හරීද පචිති වේ.

**සවැනි ආරාම වගයි.**

1. යම් භික්ෂුණියක් ගැබිණියක උපසම්පන්න කරවා නම් පචිති වේ.

2. යම් භික්ෂුණියක් කිරිපොවන්නියක උපසම්පන්න කරවා නම් පචිති වේ.

3. යම් භික්ෂුණියක් දෑවුරුද්දක් තුළ සයාකාර ශික්ෂාවන්හි[39] නො හික්මුණු සික්ඛමානාව උපසම්පන්න කරවා නම් පචිති වේ.

4. යම් භික්ෂුණියක් දෑවුරුද්දක් තුළ සයාකාර ශික්ෂාවන්හි හික්මුණු එහෙත් සංඝයා විසින් සම්මත නො කළ සික්ඛමානාව උපසම්පන්න කරවා නම් පචිති වේ.

Non-commercial distribution

5. යම් භික්ෂුණියක් ගිහි බවට ගියා වූ ද දොළොස් වසක් සම්පූර්ණ නො වූ ද සික්ඛමානාවක් උපසම්පදා කරවා නම් පචිති වේ.

6. යම් භික්ෂුණියක් දොළොස් වසක් පිරුණු, ගිහි බවට ගිය, දැවුරුද්දක් සයාකාර ශික්ෂාවන්හි ද නොහික්මුණු සික්ඛමානාව උපසම්පන්න කරවා නම් පචිති වේ.

7. යම් භික්ෂුණියක් දොළොස් වසක් පිරුණු, ගිහි බවට ගිය, දැවුරුද්දක් සයාකාර ශික්ෂාවන් හි ලා හික්මුණු (එහෙත්) සංඝයා විසින් සම්මත නො කළ සික්ඛමානාව උපසම්පදා කරවා නම් පචිති වේ.

8. යම් භික්ෂුණියක් තමා සමග වසන සික්ඛමානාව උපසම්පදා කරවා දැවුරුද්දක් තුළ උද්දේසනාදිය නො උගන්වා ද අනුන් ලවා හෝ නො කරවා ද පචිති වේ.

9. යම් භික්ෂුණියක් තමා උපසම්පදා කරනු ලැබූ උපාධ්‍යාය භික්ෂුණිය දැවුරුද්දක් ඇසුරු නො කරන්නී ද පචිති වේ.

10. තමා සමග වසන සික්ඛමානාව උපසපන් කරවා යටත් පිරිසෙයින් පස් හය යොදුනක් වත් ගෙන නො යේ ද අනුන් ලවා හෝ ගෙන්වා නො යවන්නී ද පචිති වේ.

**සත්වැනි ගර්භිණී වගයි.**

1. යම් භික්ෂුණියක් විසිවයස් නො පිරුණු කන්‍යාභාවයෙහි සිටි සික්ඛමානාවක උපසම්පන්න කරවා නම් පචිති වේ.

2. යම් භික්ෂුණියක් සපිරුණු විසිවයස් ඇති කන්‍යාභාවයෙහි සිටි සික්ඛමානාව දැවුරුද්දක් සයාකාර ශික්ෂාවන්හි නො හික්මවන ලද්දේ උපසම්පදා කරවා නම් පචිති වේ.

3. යම් භික්ෂුණියක් සපිරුණු විසිවයස් ඇති කන්‍යාභාවයෙහි සිටි සික්ඛමානාව දැවුරුද්දක් සයාකාර ශික්ෂාවන්හි හික්මවන ලදුව ද සංඝයා විසින් සම්මත නො කරන ලද්දේ උපසම්පදා කරවා නම් පචිති වේ.

4. යම් භික්ෂුණියක් (තමා උපසපන් බවෙන්) දොළොස් වසක් නො පිරුණී, සික්ඛමානාවක උපසම්පදා කරවා නම් පචිති වේ.

*Non-commercial distribution*

5. යම් භික්ෂුණියක් (තමා උපසපන් බවෙන්) දොළොස් වස් පිරුණු, සංඝයා විසින් සම්මත නො වූවා සික්ඛමානාවක උපසම්පදා කරවා නම් පචිති වේ.

6. යම් භික්ෂුණියක් "ආයඝාවනි, ඔබට සික්ඛමානාව උපසම්පදා කිරීමෙන් ප්‍රයෝජන නැතැ"යි කියද්දී යහපතැ'යි පිළිගෙන පසුව දොස් කියන්නී නම් පචිති වේ.

7. යම් භික්ෂුණියක්, ආයඝාවනි, ඔබ මට සිවුරක් දෙන්නී නම් උපසම්පදා කෙරෙමි'යි කියා පසුව කරදරාදියක් නැතිව ම ඇය උපසම්පදා නො කෙරේ ද අනුන් ලවා හෝ නො කරවා ද පචිති වේ.

8. යම් භික්ෂුණියක් "ආයඝාවනි; ඔබ මට දෙවර්ෂයක් උපස්ථාන කරන්නී නම් උපසම්පදා කෙරෙමි"යි කියා පසුව කරදරාදියක් නැතිව ම උපසම්පදා නො කෙරේ ද අනුන් ලවා හෝ නො කරවා ද පචිති වේ.

9. යම් භික්ෂුණියක් පුරුෂයකු හෝ තරුණයකු හා එකතු වූ සැඩපරුෂ වූ ඔවුන්ට ශෝකය ගෙනදෙන සුළු සික්ඛමානාවක් උපසම්පදා කරවා නම් පචිති වේ.

10. යම් භික්ෂුණියක් මව්පියන් හෝ සැමියන් විසින් නො අනුදන්නා ලද සික්ඛමානාවක උපසම්පදා කරවා නම් පචිති වේ.

11. යම් භික්ෂුණියක් පරිවාසික ඡන්දය දීමෙන් සික්ඛමානාවක උපසම්පන්න කරවා නම් පචිති වේ.

12. යම් භික්ෂුණියක් අවුරුද්දක් පාසා උපාධ්‍යාව උපසම්පදා කරවා නම් පචිති වේ.

13. යම් භික්ෂුණියක් එක අවුරුද්දක සික්ඛමානාවන් දෙදෙනකු උපසම්පන්න කරවා නම් පචිති වේ.

**අටවැනි කුමරිභූත වගයි.**

1. යම් භික්ෂුණියක් නො ගිලන්ව කුඩයක් හෝ වහන් සඟලක් දරානම් පචිති වේ.

2. යම් භික්ෂුණියක් නො ගිලන්ව රථයකින් යේ නම් පචිති වේ.

Non-commercial distribution

3. යම් භික්ෂුණියක් ඉඟටිය වෙළන හවඩියක් පාවිච්චි කෙරේ නම් පචිති වේ.

4. යම් භික්ෂුණියක් ස්ත්‍රී අභරණ පාවිච්චි කෙරේ නම් පචිති වේ.

5. යම් භික්ෂුණියක් සුවඳ සුණු ගා ස්නානය කෙරේ ද පචිති වේ.

6. යම් භික්ෂුණියක් සුවඳ කැවූ තලමුරුවට ඇඟ ගා ස්නානය කෙරේ ද පචිති වේ.

7. යම් භික්ෂුණියක් භික්ෂුණියක ලවා ඇඟ අතුල්ලා ගනී ද පචිති වේ.

8. යම් භික්ෂුණියක් සික්ඛමානාවක ලවා ඇඟ මැඬවීම කරවා ද පචිති වේ.

9. යම් භික්ෂුණියක් සාමණේරියක ලවා ඇඟ මැඬවීම කරවා ද පචිති වේ.

10. යම් භික්ෂුණියක් ගෘහණියක ලවා ඇඟ මැඬවීම කරවා ද පචිති වේ.

11. යම් භික්ෂුණියක් භික්ෂුවකගේ ඉදිරිපිට නො විචාරා අසුනක වාඩිවේ ද පචිති වේ.

12. යම් භික්ෂුණියක් අවසර නො දුන් භික්ෂුවකගෙන් ප්‍රශ්න විචාරා ද පචිති වේ.

13. යම් භික්ෂුණියක් තනවසා බඳින සිවුර (හැට්ටය) නැතිව ගමට වදී ද පචිති වේ.

**නවවැනි ඡත්තුපාහණ වගයි**

(මෙයින් ඉතුරු වූ දසවැනි මුසාවාද වග, එකොළොස් වැනි භූතගාම වග, දොළොස් වැනි භෝජන වග, තෙළෙස්වැනි චාරිත්‍ර වග, තුදුස්වැනි ජෝති වග, පසළොස්වැනි දිට්ඨිවග හා සොළොස්වැනි ධම්මික වග ද තතියානුසාවණය ද භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ අයුරුයි.)

**පචිති ඇවැත් එකසිය හැටහය මෙතෙකින් නිමියේය.**

Non-commercial distribution

**ආයුෂ්මතුනි, අනතුරුව පාටිදේසනීය ඇවැත් අට උදෙසනු ලැබේ.**

1. යම් භික්ෂුණියක් නොගිලන්ව ගිතෙල් ඉල්ලාගෙන වළඳා නම් ඇය විසින් "ආයුෂ්මවනි, ගැරහිය යුතු වූ අයෝග්‍ය වූ නැවත දෙසිය යුතු වූ ඇවතකට පැමිණියෙමි"යි භික්ෂුණීන් හමුවෙහි ඇවැත් දෙසිය යුත්තේය.

2 - 8, යම් භික්ෂුණියක් නොගිලන්ව i. ගිතෙල් ii. තලතෙල් iii. මීපැණි iv. උක්සකුරු v. ගොඩ මස් vi. දියමස් vii. කිරි හා viii. දී ඉල්ලාගෙන වළඳා නම් ඇය විසින් "ආයුෂ්මවනි, ගැරහිය යුතු වූ අයෝග්‍ය වූ නැවත දෙසියයුතු වූ ඇවතකට පැමිණියෙමි"යි භික්ෂුණීන් හමුවෙහි ඇවැත් දෙසිය යුතුයි.

(තතියානු සාවණය යට දැක්වූ අයුරුයි.)

**පාටිදේසනීය ඇවැත් අට මෙතෙකින් නිමියේය.**

(පන්සැත්තෑවක් සේඛියා සිකපද හා ශප්ත අධිකරණ සමථ ධර්ම ද භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි දැක්වූ අයුරුයි.)

ආයුෂ්මවරුනි, නිදානය උදෙසන ලදී. එසේම අට පරිජි ඇවැත්, සතළොස් සඞ්ඝවෙසෙස් ඇවැත්, තිස් නිසඟි පචිති ඇවැත්, එකසිය හැටහයක් පචිති ඇවැත්, අටක් පාටිදේසනීය ඇවැත්, පන් සැත්තෑවක් සේඛියා සිකපද හා ශප්තවිධ අධිකරණ සමථ ධර්ම ද උදෙසන ලදී. මෙතෙක් භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයෙහි ආවා වූ එහි ඇතුළත් වූ භාග්‍යවතුන් වහන්සේගේ සිකපද අඩමසක් පාසා උදෙසිය යුතු බවට පැමිණේ. සමගි වූද සතුටු වූ ද, විවාද නොකරන්නා වූද සියල්ලන් විසින් ඒ ඒ සිකපදයෙහි ලා හික්මිය යුතුයි.

**විස්තාර උද්දේසයයි.**

**භික්ෂුණී ප්‍රාතිමෝක්ෂය නිමියේ ය.**

Non-commercial distribution

# උපග්‍රන්ථය

1. දින වශයෙන් පොහොය තුනකි. චාතුද්දසී, පණ්ණරසී, හා සාමග්ගී වශයෙනි, ඍතුවකට පෝය අටක් වේ. එයින් තුන්වැනි, සත්වැනි පොහෝ දින චාතුද්දසී නමිනුත් ඉතිරි සය පණ්ණරසී නමිනුත් හැඳින් වේ. මෙසේ අවුරුද්දකට චාතුද්දසී පොහෝදින සයක් ලැබෙන අතර පණ්ණරසී පොහෝ දින අටළොසක් ලැබේ. සියලුම පොහෝ දින සූවිස්සකි. පැලවිය, දියවක, තියවක, ජලවකාදී විසින් තිථි තුදුසක් පිරීමෙන් චාතුද්දසියත්, පසළොසක් පිරීමෙන් පණ්ණරසියත් ලැබේ. පොහොය කිරීමේදී චාතුද්දසී දිනයක් නම් **"අජ්ජ'පොසථො චාතුද්දසො"** කියාද, පණ්ණරසී දිනයක් නම් **"අජ්ජ 'පොසථො පණ්ණරසො"** කියාද යොදාගත යුතුය.

සාමග්ගී උපෝසථයට දින නියමයක් නැත. යම් දිනක භේදවී ගිය භික්ෂු සංඝයා ස්වකීය සාමග්‍රිය පතා එක්වී පොහොය කෙරෙත් නම් ඒ සාමග්ගී පොහොයයි. එයට චාතුද්දසී හෝ පණ්ණරසී බවක් අවශ්‍ය නොවේ. **"අජ්ජ 'පොසථො සාමග්ගී"** යි යොදා ගත යුතුය.

2. i. උපෝෂථ දිනය, ii. පොහොය කිරීමට ප්‍රමාණවත් භික්ෂූන් ඇතිබව iii. ඔවුන් සභාගාපත්ති වලට නොපැමිණිබව හා iv. සීමාවෙහි බැහැරකළ යුතු කිසිවකු නැතිබව, යන සිව් කරුණු සම්පූර්ණ වීමෙන් පොහොය කිරීමට කාලය එළඹේ.

3. පොහොය කිරීම දින වශයෙන් තුනක් බව මුලදී (අංක1) දැක්වීමු. **කරන්නන්ගේ වශයෙන් ද සංඝ, ගණ හා පුද්ගල යි උපෝෂථ තුනකි.** සංඝ උපෝෂථයට යටත් පිරිසෙයින් භික්ෂූන් සිව්නමක් සීමාව තුළ සිටිය යුතුය. ගණ උපෝසථයට ද භික්ෂූන් තුන් නමක් හෝ දෙනමක් සිටිය යුතුය. පුද්ගල උපෝෂථය වනාහි එක ම භික්ෂුවක් ඉටා ගැනීමෙන් කරගන්නා උපෝෂථයකි.

**කළයුතු අකාරය වශයෙන් ද උපෝෂථ තුනකි.** සුත්තුද්දේස පාරිසුද්ධි හා අධිට්ඨාන නමිනි. සුත්තුද්දේස යනු ප්‍රාතිමෝක්ෂය දෙසීම ය.

*Non-commercial distribution*

එයද -

i. නිදානය දෙසා ඉතිරි කොටස අසා ඇති පරිදි සිහිකර ගැනීම,

ii. නිදානය හා සිව්පරිජි දෙසා ඉතිරි කෙටස අසා ඇති පරිදි සිහිකර ගැනීම,

iii. නිදානය, පරිජි, හා සඟවෙසෙස් දෙසා ඉතිරි කොටස අසා ඇති පරිදි සිහිකර ගැනීම.

iv. නිදානය, පරිජි, සඟවෙසෙස් හා අනියතාපත්ති දෙසා ඉතිරිය අසා ඇති පරිදි සිහි කර ගැනීම.

v. නිදානය පටන් මුළුල්ලේම දෙසීම යයි ආකාර පහකි.

පාරිශුද්ධිය යනු පිරිසිදු බව කීමයි. උපෝෂථාගාරයට භික්ෂූන් තෙනමක් රැස්වූ කල ඒ තිදෙනා වහන්සේ අතරින් ස්ථවිර භික්ෂුව ඥත්තියද පිහිටුවා පසුව "පාරිසුද්ධො අහං අවුසො (භන්තෙ) පරිසුද්ධො' ති මං ධාරථෙ" ආදි නයින් ඔවුනොවුන් තම තමන්ගේ පිරිසිදු බව ප්‍රකාශ කටයුත්තේ ය. ප්‍රාතිමෝක්ෂය දෙසීමක් නැත. සීමාවට දෙනමක් රැස් වූ කල "ඥත්තිය" නොතබා කියන ලද පරිදි පාරිශුද්ධිය පමණක් ඔවුනොවුනට ආරෝචනය කළ යුත්තේ ය. අධිෂ්ඨානය එකම භික්ෂුවකගේ උපෝෂථය වේ. "අජ්ජ මෙ උපොසථො පණ්ණරසො" යි වශයෙන් ඉටා ගත යුතු යි.

4. පාමොක් යනු සීලයට නමකි. අපායාදි දුක්වලින් හා අත්තානුවාදාදි භයෙන්ද ආරක්ෂා කරන හෙයින් සීලයට එනම් වේ. එය දක්වන ග්‍රන්ථය ද උපචාර වශයෙන් ප්‍රාතිමොක්ෂය යි කියනු ලැබේ.

5. කරුණු නවයකින් පූර්ව කෘත්‍යය සම්පූර්ණ වේ. i. ඇමදීම, ii. පහන් දැල්වීම, iii. අසුන් පැනවීම, iv. පැන් එළවීම, v. ඡන්දය හා vi. පිරිසුදු බව ගෙන ඒම, vii. ඍතුකීම, viii. භික්ෂූන් ගණන් ගැනීම හා ix. භික්ෂුණීන්ට අවවාද දීම ද වේ.

(මෙහි v සහ vi එකක් වශයෙන් ගැනීමෙන් කරුණු අටකට ගොනු කරන අවස්ථා ද ඇත.)

6. පාමොක් දෙසීමේදී තම තමන් ඒ ඒ සත් ඇවැත් කඳුවලින් පිරිසිදු බව කීම ය. දේශක භික්ෂුව විසින් නිදානාදි පරිච්ඡේදයක්

Non-commercial distribution

පාසා එහි අවසන භික්ෂූන්ගේ පිරිසුදු බව තෙවරක් ම විචාරණු ලැබේ. එහිදී ඇවැත් නැති නම් නිශ්ශබ්ද වීමෙන් තම පිරිසිදු බව පළ වේ.

7. පරිජිවීම නම් කෙලෙසුන් විසින් පරදනු ලැබීමයි. එතැන් සිට ඔහු භික්ෂුත්වයෙන් සලකනු නො ලැබේ. ගිහියකු වැනි ය.

8. අධිශීලය නම් උපසම්පදාශීලය යි. ශීලයන් අතර ශ්‍රේෂ්ඨ ශීලය හෙයින් ඊට අධි ශීලය යි කියනු ලැබේ.

9. කරුණු සයකින් යුක්තව කරන ප්‍රතික්ෂේපයෙන් උපසම්පදාව ප්‍රතික්ෂේප වේ. i. උකටලී වූ සිත, ii. ගිහිබව පතමි" යි ඈ විසින් කිය යුතු බව, iii. එය වර්තමාන කාලයෙන් ම කිය යුතු බව iv. වචනයෙන් ම ප්‍රකාශ කළ යුතු බව, v. සිහි ඇත්තකු ඉදිරියෙහි කීම හා vi. ඒ ඇසිල්ලෙහි ම ඔහු දැන ගැනීම ද යන සය යි.

10. මිනිස් දහමට වැඩි වූ ගුණදම් උත්තරී මනුෂ්‍යධර්ම නම් වේ. දසකුසල් මිනිස් දහම් ය. ඉන් මත්තෙහි වූ ධ්‍යාන මාර්ග ඵලාදිය උතුරු මිනිස් දම් ය.

11. සාංසාරික පැවැත්ම තිලකුණට නගා බලන යෝගාවචර භික්ෂුවට තමා ධ්‍යාන මාර්ග ඵලාදියට නොපැමිණ ම පැමිණියෙමි' යි වැරදි අදහසක් උපදී. එය අධිමානයය. එබඳු හැඟීමකින් තමා කෙරෙහි මාර්ගඵලාදිය ඇතැ' යි කියන්නකුට උතුරුමිනිස් දම් පලකිරීමෙන් පරිජි නොවේ.

12. ඇවතින් පිරිසුදු බව පතන භික්ෂුවට මුල මැද අග යන තුන් තැන්හිදී ම සංඝයාට අවශ්‍ය වන හෙයින් මේ ඇවැත් තෙළෙසට සංඝාදිසේස (සඟවෙසෙස්) යයි කියනු ලැබේ. මේ ගරුකාපත්තියට පැමිණි භික්ෂුව ඉන් මිදීම සඳහා මුලදී පිරිවෙස හා මැද දී මානත ලබා ගැනීම සඳහාත් අවසන අබ්භානය සඳහාත් සංඝයාගේ පිහිට අවශ්‍ය ය.

13. සුගත් වියත මැදුම් පිරිමියකුගේ අතින් වියත් තුනකි. වඩු රියනින් රියන් එකහමාරකි.

14. සඟ වෙසෙස් ඇවතට පැමිණි භික්ෂුව එය සඟවාගෙන සිටීමේ වරදින් මිදීම සඳහා වින්ද යුතු දඬුවම "පිරිවෙස්" නම්. පැමිණි ඇවැත් ගණනට හා සඟවාගෙන සිටි දින ගණනට පිරිවෙස්

Non-commercial distribution

පිරිය යුතු ය. දින ගණන් හා ආපත්ති සංඛ්‍යා අමතක නම් උපසම්පදා වූ දිනය පටන් පිරිවෙස සමාදන් වූ දිනය දක්වා මේ දඬුවම විඳිය යුතු ය. පිරිවෙස ආකාර විසින් සතරකි. i. අපටිච්ඡන්න, ii. පටිච්ඡන්න, iii. සුද්ධන්ත හා iv. සමෝධාන නමිනි.

15. භික්ෂූන්ට ගරු කිරීම මානත්ත (මානත්) නමි. ඇවැත් සඟවා සිටි භික්ෂුව කලක් පරිවාසයෙන් දඬුවම් විඳ පසුව මානත ද පිරිය යුතු ය. මෙය රැකිය යුත්තේ සත්දිනක් තුළ පමණි. ඊට පසුව ඔහු අබ්භානයට සුදුස්සකු වෙයි. මානත ද සිව් අයුරුය. i. පටිච්ඡන්න, ii. අපටිච්ඡන්න, iii. පක්ඛ, හා iv. සමෝධාන විසිනි.

(පිරිවෙස හා මානත රකින භික්ෂුව ඒ රකින කාලය තුළ සෙසු භික්ෂූන්ගේ අභිවාදනාදිය ලැබීමට සුදුස්සෙක් නොවේ. ඔවුන් දුටුවිට අසුනෙන් නැගී ගරු කළ යුතු ය. උපසම්පදාදී විනයකර්ම වලට සහභාගි වීමට නො හැකි ය. පිණ්ඩපාතාදි වත් සමාදන් වීමක් ද නො වේ. පියවි භික්ෂූන් ඉදිරියෙන් යාම ඒම් හෝ යටත් පිරිසෙයින් හෙරණුන් අතින් වුවද උවැටන් ගැනීම තහනම් ය. අනතුරකදී හැර අරමින් බැහැර යාමට ද නො හැකි ය.)

16. අනියත යනු අවිනිශ්චිත යන තේරුම යි. භික්ෂුවකගේ පැවැත්ම පාරාජිකාවකට සංඝාදිසේසයකට හා පචිතියට ද සාධාරණ නම් කවරකින් දඬුවම් දිය යුතු දැයි නිශ්චයක් නොවන හෙයිනි. එය දුටු සොවාන් කෙනකු වැනි විශ්වාස කටයුතු කෙනකුගේ ප්‍රතිඥාව පරිදි ආපත්ති ආරෝචනය කටයුතු ය.

17. සොවාන් ඵලයට පැමිණි ආයර්‍ය ශ්‍රාවිකාව විශ්වාස කටයුතු වචන ඇත්තියකි.

18. තමන් සතු අකැප දෙයක් භික්ෂූන්ට දී ඇවැත් දෙසා ගැනීම නිසඟි පචිති වලින් දැක්වේ. එය සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට දිය හැකිය. ඔව්හු එය නිස්සජ්ජනය කළ භික්ෂුවට ආපසු පවරා දිය යුතු ය. එසේ දීම යුතුකමක් මෙන් ම නොදුන හොත් විනය වරදකට ද අසුවන බැවිනි.

19. භික්ෂූන් විසින් අතුළ කඨින සිවුර අට වැදැරුම් හේතු අතුරෙන් එකකින් හෝ අවලංගු වේ නම් ඒ කඨිනෝද්ධාරය යි. කඨිනය ඉදිරීමයි. මසා අවසන් කිරීමෙන් හෝ කඨින බව අවලංගු

Non-commercial distribution

වීමෙන් සිවුරක් ඇති කල්හි හෝ, මීයන් කෑමෙන් හෝ සොරුන් පැහැර ගැනීමාදියෙන් සිවුරක් නැති කල්හි නො ඉටා සිවුරක් දරණ භික්ෂුවට නිසඟි පචිති වේ.

20. කඨිනය ගත් භික්ෂුවට චීවර මාසයත්, අනතුරුව එළඹෙන හේමන්ත ඍතුවේ හාරමාසයත් යන පස්මාසය හැර ඉතිරි කාලය තුළ ලැබෙන සිවුරු "නොකල් සිවුරු' යි. කඨිනය නොගත් භික්ෂුවට චීවර මාසය හැර ඉතිරි එකොළොස් මාසය තුළ ලබන සිවුරු "නොකල් සිවුරු" යි.

21. "කුසල චිත්තං පාතයතී' ති පාචිත්තියං" ආයඝීමාර්ගයට බාධා කරමින් පැවති කුසල් සිත් මුවහ කරන, හෙළන බැවින් දෙයානුවක් වූ මේ ඇවැත්වලට පචිති යයි කියනු ලැබේ.

22. ආගන්තුකයන් සඳහා පිළියෙළ කළ බතට "ආවසථ පිණ්ඩ" යයි කියත්. එය භික්ෂූන් සඳහා පමණක් නොව මගියන්ට ගිලණුන්ට හා වෙනත් දිළිඳුන් සඳහා ද සකස්කරන ලද්දකි. මෙසේ ආගන්තුකයන් හා දිළිඳුන් සඳහා පිළියෙල කළ දාන ශාලාවක උපසපන් භික්ෂුවකට වැළඳිය හැක්කේ දවසක් පමණකි. ඉන් මත්තෙහි වළඳන්නාහට පචිති වේ.

23. දායකයන් භික්ෂූන් හමුවට පැමිණ "ඔබ වහන්සේලාට බතින් පවරමි" යි කරන අකැප නිමන්ත්‍රණයකින් හෝ භික්ෂූන් දායකයන් වෙත ගොස්, "අපට බත් දෙව" යි ඉල්ලන අකැප විඤ්ඤත්තියකින් ලැබූ භෝජනයක් සිව් නමක්ව හෝ වෙන වෙන ම හෝ ගොස් වළඳා ද එයට ගණභෝජනය යයි කියනු ලැබේ.

24. ආරාධිත ක්‍රමය ඉක්මවා වැළඳීම පරම්පර භෝජනය යි. ඇරයුම් එකක් දෙකක් හෝ කීපයක් ලැබූ භික්ෂුව මුලින් පිළිගත් ඇරයුම් වලට පස් දැහැමියන් හෝ නො යවා පසුව පිළිගත් ආරාධනය ඉවසා ගොස් වළඳා නම් ආරාධිත ක්‍රමය වෙනස් වූවා වේ. ඊට පරම්පර භෝජනය යි කියති.

25. මෙහි පවාරණය නම් ප්‍රතික්ෂේපය යි. වළඳමින් සිටි භික්ෂුවක් වෙත එළ වූ භෝජනය පිළිගන්වන්නහු අත්පස සිටියදී හිස සැලීමාදියෙන් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂේප කරයි නම්

Non-commercial distribution

භෝජනය පවාරණය කෙළේ වේ. විනයානුකූලව ඉතිරි කර නො ගත් භෝජනයක් හැර වෙන කිසි ම දැයක් ඒ දවස තුළ අනුභව කරනු නො වටී.

26. සන්නිධිය යනු තැන්පත් කොට තැබීම යි. භික්ෂුව පිළිගත් යාවකාලික හෝ යාමකාලික වූ කෑයුතු පියයුතු දැයක් තැන්පත් කොට තබා එක රැයක් ගතවීමෙන් සන්නිධි වේ. එය වළඳන්නාහට පචිති වේ.

27. සුගත් අඟල මැදුම් පිරිමියකුගේ අතින් අඟල් තුනකට සමාන ය. එබඳු සුගත් අඟලෙන් අඟල් අටක් වඩුරියනින් එකකි. තවත් තැනක මැදුම් පිරිමියකුගේ රියන සුගත් අඟලට සමාන යයිද සඳහන් වේ. විමසිය යුතු තැනකි.

28. පාටිදේසනීයා' පත්ති ද දෙසා ගැනීමෙන් පිරිසුදු බවට පැමිණෙන ඇවැත් කොටසකි. ගැරහිය යුතු බැවිනුත් අසප්‍රාය බැවිනුත් වරදට හේතු වූ මේ ඇවැත් කොටස් "සො' හං භන්තෙ පාටිදෙසනීයාපත්තිං ආපජ්ජිං තා තුම්හ මූලෙ පටිදෙසෙමි" විසින් දෙසනු ලැබේ.

29. සේඛ නම් මාර්ග ඵලයන්ට පැමිණි ආර්‍යයෝ ය. ඔව්හු ඒ සඳහා හික්මෙන බැවිනි. යම් කිසි කුලයක් ශ්‍රද්ධාවෙන් දියුණු වූවත් ධනයෙන් දුප්පත් නම් එබඳු කුලවලට භික්ෂු සංඝයා 'සෙඛ' සම්මුතිය ප්‍රදානය කෙරෙති. සෙඛ සම්මුතිය ලත් කුලයකින් ආරාධනයක් නො ලැබ ආමිසයක් පිළිගැනීම නොවටී.

30. සෙඛියා යනු හික්මිය යුතු යන තේරුම යි. භික්ෂුවක් විසින් හික්මිය යුතු චාරිත්‍ර ක්‍රම දැක්වීම් වශයෙන් වදාළ සිකපද කොටසකි. ඒ ඒ සිකපද උල්ලංඝනය කිරීමෙන් දුකුළා ඇවැත් වේ.

31. සංඝයා, ධර්ම, විනය හා ආපත්තියට පැමිණි භික්ෂුව ද යන සිව්කරුණු හමුවෙහි විසඳිය යුතු අධිකරණය "සම්මුඛ විනය" යි.

32. හේතුරහිත ශීල විපත්ති ආදියෙන් චෝදනා කරනු ලැබූ "දබ්බමල්ල පුත්ත" වැනි රහතුන්ට දිය යුතු අධිකරණ වෙසෙසකි,"සති විනය."

Non-commercial distribution

33. ගර්ග භික්ෂුව වැනි උමතු වූ භික්ෂූන්ට දිය යුතු විනය ක්‍රමය "අමූළ්හ විනය" නමින් දැක් වේ.

34. අනියතාපත්තීන්හි කී පරිදි උවාල භික්ෂුව වැනි භික්ෂූන්ට ඔවුන්ගේ ප්‍රතිඥාව අනුව දිය යුතු විනය කර්මය "ප්‍රතිඥා" නම්.

35. යම් විනය කර්මයකදී ධර්මවාදී භික්ෂූන් වැඩිපුර සිටිත් නම් එබඳු අධිකරණ සමථයට "යෙභුය්‍යසික" යයි කියනු ලැබේ.

36. ලාමක ඇවැත් වලින් වැඩිහිටි භික්ෂුව පාපී සංඛ්‍යාවට ගැනේ. එබඳු පාපී භික්ෂූන් උදෙසා නියමිත විනය ක්‍රමය "තස්ස පාපිය්‍යසිකා" නම් වේ.

37. යම් අධිකරණයක් පිළිබඳව කරුණු සෙවීමේදී එය සංඝයාගේ භේදය පිණිස පවතී නම් එබඳු අධිකරණය ගූථයක් තණවලින් වසා දමා යටපත් කිරීමක් මෙන් නවතා දමා ද විනිශ්චය නොකෙරේ ද ඊට තිණවත්ථාරකයයි කියනු ලැබේ.

(මේ සත්විධ සමථ ධර්ම මගින් ඒ ඒ අධිකරණ විසඳිය යුතු ක්‍රමය මෙසේ ය.)

විවාදා'ධිකරණය = සම්මුඛ විනයෙන් හා යෙභුය්‍යසිකා-වෙන් ද,

අනුවා'ධිකරණය = සම්මුඛ විනයෙන් සති විනයෙන් අමූළ්හ විනයෙන් හා තිණවත්ථාරකයෙන් ද,

ආපත්තා'ධිකරණය = සම්මුඛ විනයෙන් ප්‍රතිඥාවෙන් හා තිණවත්ථාරකයෙන් ද,

කිච්චා'ධිකරණය = සම්මුඛ විනයෙන්ද විසඳිය යුතු ය.)

38. ගරුධර්ම අටකි. ඒවා භික්ෂුණීන් විසින් පළිපැදිය යුත්තේ ය.

Non-commercial distribution

i. භික්ෂුණිය තම උපසම්පදාවෙන් සියයක් වස් ඉක්මවා සිටිය ද එදවස් උපසපන් වූ භික්ෂුවට වැන්ද යුතු ය. ගරුබුහුමන් දැක්විය යුතු ය.

ii. භික්ෂූන්ගේ ආරාමයකට ආසන්න වූ මෙහෙණවරක විසිය යුතු ය.

iii. අඩමසක් පාසා භික්ෂූන් කරා එළඹ පොහෝ විචාළ යුතු ය. අවවාද ලබා ගත යුතු ය.

iv. වස් විසූ භික්ෂුණිය උභතෝ සංඝයා කෙරෙහි පාවාරණය කළ යුතු ය.

v. ගරු ධර්මයන්ගෙන් පිරිසුදු බව කැමති භික්ෂුණිය අඩමසක් මානත පිරිය යුතු ය.

vi. ඇවුරුද්දක් සයාකාර ශික්ෂාවන්හි හික්මිය යුතු ය. අනතුරුව උභතෝ සංඝයා කෙරෙහි උපසම්පදා බව ලැබිය යුතු ය.

vii. මොනම කරුණකදී වත් භික්ෂූන්ට නින්දා පරිභව නො කළ යුතු ය.

viii. භික්ෂූණීන් භික්ෂූන්ට අවවාද නො කළ යුතු ය. භික්ෂූණීහු භික්ෂූන්ගෙන් අවවාද ලබා ගත යුතු ය.

39. සයාකාර ශික්ෂාව නම් i. සතුන් මැරීම හෝ හිංසා නො කිරීම, ii. සොරකම් නො කිරීම, iii. බඹසර හැසිරීම, iv. බොරු නො කීම, v. රහමෙර නො බීම, vi. විකාලයෙහි නො වැළඳීම.

**උපග්‍රන්ථය නිමියේ ය.**

Non-commercial distribution